

# විමුක්ති සංග්‍රහය.

# විමුක්ති සඞ්ග්‍රහය

ලඞ්කාරාමයනෙවිරත් පිරිවෙණ්හිමි

මහාස්ථවිරපාදයන් වහන්සේ

විසින් විරචිතයි.

අමාසරී හෙයියන්තුඩුවේ දේවමිත්ත

ස්ථවිරයන්වහන්සේ විසින් ශුද්ධ කොට ලියනලද

භාවද්‍යෝතක (සන්න) සහිතයි.

බුලත්සිංහලගේ ජුවේනාන් කුරේ

අප්පුහාමි විසින් මුද්‍රණය කරවා

ප්‍රසිද්ධකරණලදී.

කොළඹ ලඞ්කාභිනවවිශ්‍රුත යන්ත්‍රාලයෙහි

මුද්‍රිතයි.

ශ්‍රී බු. ව. 2434.

# WIMUKTISANGRAHA.

BY

A LEARNED THERA.

PRINCIPAL OF

LANKASENEVIRAT PIRIVANA.

---

WITH EXPLANATORY NOTES.

EDITED BY

H. DEVAMITTA THERA.

VICE-PRINCIPAL OF VIDYODAYA PIRIVENA.

---

PUBLISHED

BY

B. S. COORAY.

---

THE LANKABHINAVA VISRUTA PRESS.

COLOMBO.

---

A. B. 2434.

# වි ඥා ප න ය.

## විමුක්තිසඞ්ග්‍රහය.

මීට අවුරුදු හාරසිය තිස්හතරකට පමණ පූර්වයෙහි ලඞ්කාතිලකවිහාරවාසී මහාස්ථවිරකෙනෙකුන් විසින් මේ ප්‍රකරණය කළ බවත් මේ ග්‍රන්ථකර්තෘ ලඞ්කාසෙනෙවිරත් පිරිවෙන්හිමියන් බවත් මේ ග්‍රන්ථාවසානයෙහි යොදනලද ගාථාදියෙන් පෙණේ-එයින් ලඞ්කාසෙනෙවිරත් පිරිවෙණත් ලඞ්කාතිලක විහාරය හෝ ඒ සම්බන්ධ කොට පිහිටුවනලද්දක් හෝ වියයුතු බැව් පෙණේ-මේ ප්‍රකරණය බෞද්ධයන්ට ප්‍රයොජනවත් මහත් ධර්මරාශියක් අන්තර්ගත කොට කරණලද්දකි.

මේ ප්‍රකරණය ශුද්ධ කොට මෙහි දුරවබොධ ගාථාපාඨයන්ගේ සුඛාවබොධය සඳහා අපවිසින් ලියනලද භාවදෙනාතක සන්නයකුත් යොදා බුලත්සිංහලයේ කොර්ණේලිස් කුරේ අප්පුහාමි විසින් මුද්‍රණයකරවන්ට ආරම්භකරණලදින් මුද්‍රණය කරගෙණ යන අතර ඒ කර්මසමාප්තිය වන්නට ප්‍රථමයෙන් ඒ මහතාට ලෙඩක් වැළඳී සුව නොලදින් පරලොකප්‍රාප්තවිය-එබැවින් මේ පොත ඒවෙනුවෙන් ඒ මහතාගේ සහොදර වූ සුවේතන් කුරේ අප්පුහාමි විසින් මුද්‍රණයකරවා ප්‍රසිද්ධකරණලදී.

මීට අපගේ ආචාර්යවූ කොළඹ විද්‍යොදය පරිවෙණාධිපති ශ්‍රී සුමඞ්ගලාභිධාන ප්‍රධානනායක ස්ථවිරපාදයන්වහන්සේ නෙනුත් අපගේ ශ්‍රී දෙවරක්ෂිතාචාර්ය බටුවන්තුඩාවේ පණ්ඩිතුමන්නෙනුත් උපකාරලැබුනු බව ගෞරවයෙන් දන්වමු.

මේබව දන්වන්නේ

H. DEVAMITTA.

# විමුක්ති සඞ්ග්‍රහය.

## ප්‍රථම පරිච්ඡෙදය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

නමාමි (ක) බුද්ධං ධම්මඤ්ච සඞ්ඝඤ්චාපි අනුත්තරං.
විමුත්තිසඞ්ගහං සෙට්ඨං වක්ඛාමි මුත්තිකාමිනං.

නිවන් සඳහා සසුන්වන් පිරිසුදු සිල්පිහිටි කුලපුත්‍රයන් විසින් කෙසාදි කුදුමහත් සියලු පළිබොධයන් දුරු කොට අරණ්‍යවෘක්ෂමූලාදි විජනස්ථානයෙක්හි පලක් බැඳ සුවෙන් හිඳ "එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා" යි (1) යනාදීන් අනෙකප්‍රකාර

---

ක. නමෙ.

1. මහණෙනි රාගද්වෙෂාදික්ලෙශමලයෙන් හා අභිධ්‍යා විෂමලොභාදි උපක්ලෙශයන්ගෙන් කිළුටුසිත් ඇති සත්ත්වයන්ගේ සියලුම චිත්තමලශොධනය කොට පරමවිශුද්ධියෙන් පිරිසිදුවීම පිණිස ද ශොකපරිදෙවදුඃඛයන්ගේ ප්‍රහාණය පිණිස ද කායිකදුක්ඛය චෛතසිකදෞර්මනස්‍යය යන මොවුන් දෙදෙනාගේ නිරුද්ධ කිරීම පිණිස ද ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගයාගේ අධිගමය පිණිස ද තෘෂ්ණාරහිතහෙයින් නිර්වාණයයි ලද නම් ඇති අමෘතවූ අසංස්කෘතධර්මයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ද එකම නිවණට යන මේ පූර්වභාගමාර්ගය වන්නේය, ඒ කවරේද ? සතර සතිපට්ඨානයෝයි.

සතර සතිපට්ඨානයෝ නම්, කායානුපස්සනාසතිපට්ඨානය, වෙදනානුපස්සනාසතිපට්ඨානය, චිත්තානුපස්සනාසතිපට්ඨාන

යෙන් වර්ණනා කොට වදාරණලද දෙශනාක්‍රමය හා සමග “ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො” යනාදීන් බුද්ධගුණරත්නාලඞ්කාරය ද “ස්වාක්ඛාතො භගවතා ධ

---

ය, ධම්මානුපස්සනාසතිපට්ඨානය, යන මේ සතරයි; ලොකනාථවූ සර්වඥයන් වහන්සේ විසින් විනෙයජනයන්ට හිතවශයෙන් හා ශුභ සුඛ නිත්‍ය ආත්මයයි කියනලද චතුර්විධ විපර්‍යාසාදීන්ගේ ප්‍රහාණය පිණිස නිවන් නැමැති අභයපුරයට වදනා දොරටු සතරක් බඳුවූ සතර සතිපට්ඨානයෝ වදාරණලදහ, ඒ කෙසේදයත්? තෘෂ්ණාචරිතය දිට්ඨිචරිතය සමථයානිකය විපස්සනායානිකය යන මේ සතරදෙන තික්ඛමන්දවශයෙන් ද්විවිධද්විවිධ වෙත්, ඔවුන් අතුරෙන් මන්දබුද්ධික තෘෂ්ණා චරිතයාට තදඅරමුණු ඇති කායානුපස්සනාසතිපට්ඨානය නිර්වාණමාර්ග වේ; තියුණුනුවන ඇති තෘෂ්ණාචරිතයාට සියුම්වූ වෙදනානුපස්සනා සතිපට්ඨානය නිර්වාණමාර්ගය වේ; මන්දවූ දෘෂ්ටිචරිතයාහට අති ප්‍රභෙදගත නොවූ චිත්තානුපස්සනාව ද එම තීක්ෂ්ණයාහට අති ප්‍රභෙදගත ධම්මානුපස්සනාව ද මන්දවූ සමථයානිකයාහට සුවසේ දත හැකි අරමුණු ඇති කායානුපස්සනාව ද තදවූ අරමුණෙහි නොපිහිටන එම තීක්ෂ්ණයාහට වෙදනානුපස්සනාව ද මන්දවූ විපස්සනායානිකයාහට අධික ප්‍රභෙදයට නොගියාවූ අරමුණු ඇති චිත්තානුපස්සනාව ද එම තීක්ෂ්ණයාහට අධික ප්‍රභෙදයට ගියාවූ අරමුණු ඇති ධම්මානුපස්සනාව ද නිර්වාණමාර්ග වේ — කායානුපස්සනාසතිපට්ඨානය ද්වත්‍රිංශාකාරාදිවශයෙන් කයෙහි අශුභබව දැක්වීමෙන් කය ශුභයයි විපර්‍යාස සිත් ඇත්තවුන්ගේ ශුභග්‍රහණය පහ කෙරෙයි, වෙදනානුපස්සනාසතිපට්ඨානය වෙදනාවන්ගේ ස්වභාව දැක්වීමෙන් වෙදනාවන් කෙරෙහි සුඛසංඥව පහ කෙරෙයි; චිත්තානුපස්සනාසතිපට්ඨානය චිත්තයාගේ ස්වභාව දැක්වීමෙන් නිත්‍යසංඥව පහ කෙරෙයි; ධම්මානුපස්සනාසතිපට්ඨානය ස්කන්ධාදිධර්මපුඤ්ජය ස්වවශව නොපවත්නා හෙයින් සියලු ධර්මයන් අනාත්මවශයෙන් දැක්වීමෙන් ආත්මග්‍රහණය පහ කෙරෙයි මේ ආදිවශයෙනි.

ම්මො" යනාදීන් ධර්මගුණවර්ණනාලඞ්කාරය ද "සුපටිප න්නො භගවතො සාවකසඞ්ඝො" යනාදීන් සඞ්ඝගුණවර් ණනාලඞ්කාරය ද වර්ණනය කොට ඉර්යව් සමන්වා පෙරවූ කල සියී ඇති ව බුදු පසේබුදු මහරහතන් විසින් පසස්කළ නිවන් මම ද පසස් කෙරෙමි ඒ බුදු පසේබුදු මහරහතන් විසින් පිළිපන් මාර්ගය මම ද පිළිපදිමි ඒ බුදු පසේබුදු මහ රහතන් විසින් සිත්හි ලා වඩනලද—

"එකධම්මො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලී ක තො මහතො සංවෙගාය සංවත්තති මහතො අත්ථාය සංව ත්තති මහතො යොගක්ඛෙමාය සංවත්තති මහතො සතිස ම්පජඤ්ඤාය සංවත්තති ඤාණදස්සනපටිලාභාය සංවත්තති දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරි යාය සංවත්තති කතමො එකධම්මො? කායගතාසති"යි (1) වදාළහෙයින් ද "අමතං තෙ භික්ඛවෙ පරිභුඤ්ජන්ති යෙ කා යගතාසතිං පරිභුඤ්ජන්ති" යි (2) යනාදීන් එකත්තනයනාන ත්තනයාදිවසයෙන් අටළොස් පරිච්ඡෙදකින් විභාග කොට දෙශනා කළාවූ මහාරසායනයක් බඳු කායගතාසතිකමටහන් මම

---

1. මහණෙනි ආසෙවනය කරණලද භාවනාවශයෙන් පවත්වනලද භාවනාව නොපියා නැවත නැවත කරණලද එකධර්මයක් තෙමේ ස්කන්ධාදීන්ගේ අනිත්‍යදර්ශනාදිවශයෙ න් උපදනා මහත් සංවෙගය පිණිස ද මහත් අර්ථවූ සෝ වාන්ආදි සතරමාර්ගයන් පිණිස ද මහත් යොගක්ෂෙමවූ සත රශ්‍රාමණ්‍යඵලයන් පිණිස ද මහත් ස්මෘතිප්‍රඥාදෙක පිණිස ද දිව්‍යචක්ෂුර්ඥානයාගේ ප්‍රතිලාභය පිණිස ද මෙම අත්බැ විහි සුවසේ විහරණය පිණිස ද විද්‍යාවිමුක්තිඵලයන්ගේ ප්‍ර ත්‍යක්ෂ කිර්ම පිණිස ද පවතී. කවර එකධර්මයක් ද? කා යගතාස්මෘතිය යි; මේ කායගතාස්මෘතිය ආසෙවනාදියෙන් විදර්ශ නාසහිතමාර්ගඵලප්‍රතිලාභාදිය වන්නේ යයි වදාළසේක.

2. මේ කායගතාසතිය වඩන්නාහු අමෘතමහානිර්වාණයට පැමිණෙත්, එබැවින් යම්කෙනෙක් කායගතාසතිය පරි භොග කෙරෙත් නම් ඔව්හු මරණරහිතවූ අමෘතය පරිභො ග කෙරෙත්,

ද යින්හි ලා චතුර්විධ ධ්‍යාන අදහස් ඇතිව කායිකාදී ආදි විදර්ශනානාවනාභූමියට යොගිව (b) පළමු කොට හෙතුප්‍රත්‍යයාදින්ගේ වශයෙන් පෙදෙන පෙදෙන පරිද්දෙන් බලා භාවනා කටයුතු.

ඒ කෙසේදයත්? අවිජ්ජා, සඞ්ඛාර විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වෙදනා තණ්හා උපාදාන භව ජාති ජරා යන හෙතුධර්මයෝ දොළොසය.

මේ අවිජ්ජාදිවූ හෙතුධර්මයන් හෙතුවශයෙන් බලනපරිදි කිසේයයත්? අවිජ්ජාහෙතුවෙන් සඞ්ඛාර වෙත් සඞ්ඛාරහෙතුවෙන් විඤ්ඤාණ වෙයි විඤ්ඤාණහෙතුවෙන් නාමරූප වෙයි නාමරූපහෙතුවෙන් සළායතන වෙයි සළායතනහෙතුවෙන් ඵස්ස වෙයි ඵස්සහෙතුවෙන් වෙදනා වෙයි වෙදනාහෙතුවෙන් තණ්හා වෙයි තණ්හාහෙතුවෙන් උපාදාන වෙයි උපාදානහෙතුවෙන් භව වෙයි භවහෙතුවෙන් ජාති වෙයි ජාතිහෙතුවෙන් ජරාමරණ වෙයි ජරාමරණපරියන්තව සිටි මේ දොළොස් ධර්මයෝ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාදිවූ අහෙතුකධර්මයන්ට හෙතුවෙත්නුයි හෙතුනම් වෙත්.

අතීතෙ හෙතුයො පඤ්ච ඉදානි ඵලපඤ්චකං,
ඉදානි හෙතුයො පඤ්ච ආයතිං ඵලපඤ්චකං.(1)
ඵලෙන සුඤ්ඤකං කම්මං ඵලං කම්මෙ න විජ්ජති,
කම්මඤ්ච ඛො උපාදාය තතො නිබ්බත්තතී ඵලං, (2)
කම්මං නත්ථි විපාකම්හි පාකො කම්මෙ න විජ්ජති,
අඤ්ඤමඤ්ඤං උභො සුඤ්ඤා, න ච කම්මං විනා ඵලං ති (3)

මොවුන් හෙතුවසයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

---

b. යොගීහු විසින්.

1. අතීතයෙහි හෙතුපසය වර්තමානයෙහි ඵලපසය වර්තමානයෙහි හෙතුපසය මත්තෙහි ඵලපසයි.

2. කර්මය ඵලයෙන් ශූන්‍යය කර්මයෙහි ඵලය නොලැබෙයි කර්මය නිසා ඒ කර්මයෙන් ඵලය නිපදනේයි.

3. විපාකය කෙරෙහි කර්මය නැත්තේය විපාකය කර්මයෙහි නැත්තේයි කර්මවිපාකදෙදෙන ඔවුනොවුන්ගෙන් ශූන්‍යයහ, කර්මය හැර ඵලය ද නො ලැබේ.

තවද මෙම අවිද්‍යාදිධර්මයන් ප්‍රත්‍යයන්ගේ වශයෙන් බලනපරිදි කියේයත් ? අවිජ්ජාපසයෙයින් සඞ්ඛාර වෙත් සඞ්ඛාරපසයෙයින් විඤ්ඤාණ වෙයි විඤ්ඤාණපසයෙයින් නාමරූප වෙයි නාමරූප පසයෙයින් සළායතන වෙයි සළායතන පසයෙයින් ඵස්ස වෙයි ඵස්ස පසයෙයින් වෙදනා වෙයි වෙදනාපසයෙයින් තණ්හා වෙයි තණ්හාපසයෙයින් උපාදාන වෙයි උපාදානපසයෙයින් භව වෙයි භවපසයෙයින් ජාති වෙයි ජාතිපසයෙයින් ජරාමරණ වෙයි ජරාමරණපරියන්ත ව සිටි මේ දෙලොස් ධර්මයෝ සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාදි වූ අප්‍රත්‍යයධර්මයන්ට ප්‍රත්‍යය වෙත්නුයි ප්‍රත්‍යයෝ නම් වෙත්.

න හෙත්ථ දෙවො න බ්‍රහ්මා සංසාරස්සත්ථි කාරකො,
සුද්ධධම්මා පවත්තන්ති හෙතුසම්භාරපච්චයා. (1)

යථා න සුරියෙ අග්ගි න මණිම්හි න ගොමයෙ,
න තෙසං බහිසො අත්ථි සම්භාරෙහි ච ජායති. (2)

එවමෙතා අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
ගම්භීරං නිපුණං සුඤ්ඤං පච්චයං පටිවිජ්ඣතීති. (3)

අවිද්‍යාදිප්‍රත්‍යයන්ගේ වශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

---

1. මෙහි සංසාරය කරන්නාවූ දෙවියෙක් නොමැත්තේය බ්‍රහ්මයෙක් ද නැත්තේය හෙතුප්‍රත්‍යයනිමිත්තෙන් හුදු ධර්මයෝ පවතිත්.

2. යම්සේ හිරුරැසෙහිත් සූර්‍ය්‍යකාන්ත පාෂාණයෙහිත් ගොමසුන්නෙහිත් නැති හිරුරැසය සූර්‍ය්‍යකාන්තපාෂාණය ගොමසුණුය යන මෙයින් පිටතත් නැති ගිනි ආතපාදි කාරණයෙන් උපදනේද; එසේම කර්මයතුළත් විපාකය නොලැබෙයි කර්මයෙහි පිටතත් නො ලැබෙයි හෙතුප්‍රත්‍යය නිමිත්තෙන් කෙවලධර්මයෝ පවතිත්.

3. බුද්ධශ්‍රාවක මහණ තෙමේ කර්මයෙහි කාරකයෙක් නැතැයි යනාදීන් කී මේ අර්ථය දැනගෙණ ගැඹුරු සියුම්වූ ආත්මාදීයෙන් ශූන්‍යවූ නාමරූපප්‍රත්‍යය ප්‍රතිවෙධ කෙරේ.

තවද මෙම අවිද්‍යාදී ධර්මයන් අභිධර්මවශයෙන් බලනපරිදි කිසේයයත්? දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං යන මොහු අවිජ්ජා නම් වෙත්.

සඞ්ඛාරය කිසේයයත්? පුඤ්ඤාභිසඞ්ඛාරය අපුඤ්ඤාභිසඞ්ඛාරය ආනෙඤ්ජාභිසඞ්ඛාරය කායසඞ්ඛාරය වචීසඞ්ඛාරය චිත්තසඞ්ඛාරය යන මොහු සඞ්ඛාර නම් වෙත්.

විඤ්ඤාණය කිසේයයත්? චක්ඛුවිඤ්ඤාණය සොතවිඤ්ඤාණය ඝාණවිඤ්ඤාණය ජිව්හාවිඤ්ඤාණය කායවිඤ්ඤාණය මනොවිඤ්ඤාණය යන මොහු විඤ්ඤාණ නම් වෙත්.

නාමරූප කිසේයයත්? වෙදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන සතරකඳ නාම නම් වෙත්.

පඨවීධාතු ආදී සතරමහාභූතයන් හා චක්ඛාදී සූවිසි උපාදායරූපයන්හා මෙසේ අටවිසි විධවූ රූපයෝ රූප නම් වෙත්.

සළායතන කිසේයයත්? චක්ඛායතනය සොතායතනය ඝාණායතනය ජිව්හායතනය කායායතනය මනායතනය යනමොහු සළායතන නම් වෙත්.

ඵස්ස කිසේයයත්? චක්ඛුසම්ඵස්සය සොතසම්ඵස්සය ඝාණසම්ඵස්සය ජිව්හාසම්ඵස්සය කායසම්ඵස්සය මනොසම්ඵස්සය යන මොහු ඵස්ස නම් වෙත්.

වෙදනා කිසේයයත්? සුඛවෙදනා දුක්ඛවෙදනා උපෙක්ඛාවෙදනා සොමනස්සවෙදනා දෞමනස්සවෙදනා යන මොහු වෙදනා නම් වෙත්.

තණ්හා කිසේයයත්? රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා යනමොහු තණ්හා නම් වෙත්.

උපාදානය කිසේයයත්? කාමූපාදානය දිට්ඨුපාදානය සීලබ්බතුපාදානය අත්තවාදූපාදානය යනමොහු උපාදාන නම් වෙත්.

භව කිසේයයත්? කාමභවය රූපභවය අරූපභවය සඤ්ඤීභවය අසඤ්ඤීභවය නෙවසඤ්ඤීනාසඤ්ඤීභවය එකවොකාරභවය චතුවොකාරභවය පඤ්චවොකාරභවය යනමොහු භව නම් වෙත්.

ජාති කිසේයයත්? කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තනති; * මේ රූපස්කන්ධසඞ්ඛ්‍යාත කෙශාදි ද්වාත්‍රිංශද්ධර්මයන් ආදිකොට ඇති නාමරූපධර්මයන්ගේ එක්කඳහෙයින් ද සතරකඳහෙයින් ද පස්කඳහෙයින් ද පහලවීම ජාති නම් වේ.

වත්තුකාමො අහං අජ්ජ පච්චයාකාරවණ්ණනං,
පතිට්ඨං නාධිගච්ඡාමි අජ්ඣොගාළ්හොව සාගරං. (1)
යො කොචිමං අට්ඨිකත්වා සුණෙය්‍ය ලභෙථ පුබ්බාපරියං විසෙසං,
ලද්ධාන පුබ්බාපරියං විසෙසං අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ. (2)

---

1. මම දැන් ප්‍රත්‍යයාකාරවර්ණනාව කියනු කැමැත්තෙම් මහාසාගරයට වන්නෙකු මෙන් ඊට පිහිටක් නො ලබමි, යමෙකු කෙරෙහි ප්‍රතිෂ්ඨාවක් ඇතිවිට වර්ණනාව පහසු වේ ද එසේවූ වර්ණනාවට පිහිටක් මාගේ ම නුවන බලයෙන් නො ලබමි යන අර්ථයි, මෙයින් ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ගම්භීරත්වය ප්‍රකාශිතයි.

2. යම් කිසිවෙක් මේ ප්‍රතීත්‍යසමුත්පාදය නොනස්නා පරිද්දෙන් සිහිනුවණින් අර්ථ කොට ගෙණ අසන්නේ වී නම් හෙතෙම පූර්වාපර්‍යවිශෙෂයයි කියනලද ප්‍රථමාරම්භයෙහි පටන් ක්ෂණක්ෂණයෙහි ඥානවිශෙෂය හා කෙලශක්ෂය විශෙෂය ද ලබන්නේය පූර්වාපර්‍යවිශෙෂය ලබා මෘත්‍යුරාජයාගේ අදර්ශනය වූ නිර්වාණයට යන්නේයි.

තස්මාවිජ්ජාදිධම්මානං සුඤ්ඤරත්ථං සුභාසිතං,
සම්මසිත්වාන භාවෙය්‍ය සදෙවෝ අත්‍ථදස්සිනාති (1)

මේ අවිද්‍යාදීන් අර්‍ථවශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

තවද මෙම අවිජ්ජාදිවූ ධර්‍මයන් උපමාවශයෙන් බලනපරිදි කෙසේයත්? අවිජ්ජා තොමෝ කණෙකුවැනි සඞ්ඛාරය තෙමේ කණුගත්සැරයටිය වැනි විඥානය තෙමේ කණු සෙමින් පැකිල හුනුහැන්වැනි නාමරූපය තෙමේ හුනුවනු පිට නැගී දෙගඩක් වැනි සළායතනය තෙමේ දෙගඩපිට නැගී සගඩක් වැනි ඵස්ස තෙමේ ගඩමුහුන ගැසෙනදඬු වැනි වෙදනා තොමෝ ඉන්නැගෙන දුක් වැනි තණ්හා තොමෝ දුකට පිළියම් කළමැනවැයි යන සිත්වැනි උපාදන තෙමේ බෙහෙත් සොයා වණමුහුන බහාලන්නා වැනි භව තෙමේ ආලෙප වැනි ජාති තොමෝ නැවත නැවත ගඩදහස් සුවහස් පැණුනාක් වැනි ජරාමරණ තෙමේ ගඩදහස් සුවහස් බිඳගෙණ කළ බෙහෙදින් නොයපී අසාධ්‍යයට ගියාක් වැනි.

ගම්භීරං නිපුනං කත්වා අවිජ්ජාදිං පුරෙතරං,
උපමාතො විභාගෙන විභාවෙය්‍ය විචක්ඛණොති. (2)

මොවුන් උපමාවශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

තවද මෙම අවිජ්ජාදි වූ ධර්‍මයන්ගේ අධිකතරප්‍රයොජන වශයෙන් හෙතුප්‍රත්‍යයාදීන් බලත්නාහට අනිකුත් හෙතුප්‍රත්‍යයාදීහු පහලවන්නාහුයයි සේයි; තවද මෙම අවිජ්ජාදි වූ ධර්‍මයන් ධර්‍මාලම්බනප්‍රතිවශයෙන් බලන යොගීහු විසින්

---

1. එහෙයින් සියලු අර්‍ථයන් දක්නා බුදුන් විසින් අවිද්‍යාදි ධර්‍මයන්ගේ මනා කොට වදාරණලද මනොහාරී සම්මර්‍ශනය කොට සර්‍වාර්‍ථයන් වඩන්නේය.

2. ප්‍රාඥතෙම ගැඹුරුවූ නිපුනවූ අවිද්‍යාදිප්‍රත්‍යයධර්‍මයන් දොළොස පෙරටු කොට උපමාවශයෙන් බෙදීමෙන් වෙසෙසින් භාවනා කරන්නේය.

චුතූපපාතෙ සංසාරෙ සඞ්ඛාරානඤ්ච ලක්ඛණෙ,
යො පටිච්චසමුප්පන්නධම්මෙසු ච විමුය්හති. (1)

අභිසඞ්ඛරොති සො එතෙ සඞ්ඛාරෙ තිවිධෙ යතො,
අවිජ්ජා පච්චයො තෙසං තිවිධානම්පයන්තතො. (2)

යථාපි නාම ජච්චන්ධො නරො අපරිනායකො,
එකදා යාති මග්ගෙන උම්මග්ගෙනාපි එකදා. (3)

සංසාරෙ සංසරං බාලො තථා අපරිනායකො,
කරොති එකදා පුඤ්ඤං අපුඤ්ඤම්පි ච එකදා (4)

භුත්වාතිඝොරම්පි සුදීඝරත්තං අනන්තදුක්ඛං භවචාරකෙසු,
න තත්ථ උක්කණ්ඨති බාලසත්තො ලද්ධා සතිනෙත හි ත
ණ්හාවිජ්ජා. (5)

---

1. යමෙක් චුති උත්පත්ති දෙක්හි සංසාරය සංස්කාරයන්ගේ ස්වභාවය ප්‍රතීත්‍යසමුත්පන්නධර්මය යනමේ සිව්තන්හි මුළා වේ නම්, 2. හේ තම මේ ත්‍රිවිධසංස්කාරයන් යම්හෙයකින් රැස් කෙරේ ද එහෙයින් ත්‍රිවිධසංස්කාරයන්ට ම මේ අවිද්‍යාව ප්‍රත්‍යය වේ.

3. යම්සේ ජාත්‍යන්ධසත්ව තෙම අත ගෙණයන්නෙකු නැත්තේ කිසිකලෙක මඟිනුත් කිසිකලෙක නොමඟිනුත් යේ ද, 4. එසේ ම සසර ඇවිදින අඥානසත්ව තෙම අගීද්‍රා ගීයට පමුණුවන කල්‍යාණමිත්‍රයෙකු නැත්තේ කිසිකලෙක පින් කෙරෙයි කිසිකලෙක පව් කෙරෙයි.

5. අඥාන සත්වයා සසරනැමැති දඬුගෙයි ඉතා දීර්ඝකාලයක් අති කර්කශ වූ අනන්ත දුක් අනුභව කොට ද ඒ දඬුගෙයි නොකලකිරෙන්නේය ඒ එසේ මයි මොහු විසින් තෘෂ්ණාය අවිද්‍යාය යන යෙහෙලින් දෙදෙන ලබනලදහ; අවිද්‍යාතෘෂ්ණානැමැති යෙහෙලින් දෙන්න විසින් නලවනලද බාල සත්ව තෙම සසර නැමැති දඬුගෙයි උකටලී නොවෙයි යන් අභිප්‍රායයි.

යෙනානුභූතං අමිතඤ්ච යස්සප්පතිට්ඨිතං දුක්ඛමනාදිකාලෙ,
තමෙව පපොති පුනප්පුනම්පි අඤ්ඤානජාලස්සයමානුභාවො. (1)

යදා ච ඤත්වා සො ධම්මං සච්චානි අභිසමෙස්සති,
තදා අවිජ්ජූපසමා උපසන්තො චරිස්සති. (2)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රූහයෙ. (3)

උපසන්තො උපරතො මන්තභාණී අනුද්ධතො,
ධුණාති පාපකෙ ධම්මෙ දුමපත්තංව මාලුතො. (4)

පචඞ්ගිකස්ස තුරියස්ස න රතී හොති තාදිසී,
යථා එකග්ගචිත්තස්ස සම්මා ධම්මං විපස්සතො. (5)

---

1. යම් ශරීරයක් කරණකොටගෙණ අනවරාග්‍රකාලයෙහි පමණ නොකටහැකි දුක් අනුභව කරණලද ද අපමණ දුක් යම් ශරීරයෙක්හි පිහිටියේ ද අඥානසඞ්ඛ්‍යා නැවතනැවතත් ඒ ශරීරයම පතන්නේය මේ මොහ නැමැති දැලෙහි ආනුභාවයෙකි.

2. යම් කලෙක්හි හෙතෙම සත්පුරුෂොපාශ්‍රයවශයෙන් චතුස්සත්‍යප්‍රකාශකධර්මය දැන සත්‍යයන් අවබොධ කෙරේ ද එකල්හි අග්‍රමාර්ගාධිගමයෙන් සර්වාකාරයෙන් අවිද්‍යාව ව්‍යුපශමකිරීමෙන් සොපාදිශෙෂනිර්වාණධාතුවෙහි සිටියේ අනුපාදිශෙෂනිර්වාණධාතුප්‍රාප්තිය දක්වා සත්වයන් වැඩ ගැසිරීමෙහි ආත්මභාවය පවත්වමින් දෘෂ්ටධර්මසුඛවිහරණයෙන් වසන්නේයි.

3. සම්‍යක්සම්බුද්ධයන්ගේ ශ්‍රාවකභික්ෂු තෙම ලාභොත්පාදක වූ ද නිර්වාණප්‍රාපක වූ ද මේ කාරණය මෙසේ විශෙෂයෙන් දැන අවබොධයෙන් උපදවනලද සිව්පසය වූ සත්කාරය නො ඉවසන්නේය ත්‍රිවිධවිවෙකය වඩන්නේයි.

4. උපශාන්ත වූ උපරත වූ පරිමිතවචන ඇත්තා වූ උද්ධත නොවූ මහණ තෙම මාරුතයෙන් වෘක්ෂපර්ණසෙයින් පාපධර්මයන් ප්‍රලය කෙරේ.

5. පසඟතුරුරැවින් උපදනා සොම්නස් සමාහිතචෙතසින් ධර්මචින්තා කරණුවහට උපදනා සොම්නස් හා සම නොවේ. (ප්‍රදීපිකා)

පවිවෙකරසං පිත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං. (1)
සච්චං සත්තතා පටිසන්ධි පච්චයාකාරමෙව ච,
දුද්දසා චතුරො ධම්මා දෙසෙතුං ච සුදුක්කරා. (2)
ගම්භීරෙ පච්චයාකාරප්පභෙදෙ ඉධ පණ්ඩිතා,
යථාගාධං ලභෙථෙවමනුයුඤ්ජෙ සදා සතොති. (3)

මොවුන් හෙතු ප්‍රත්‍යයාදීන්ගේ වශයෙන් යොදනයෙ දෙන පරිද්දෙන් බලා භාවනා කරණපරිදි මෙසේ දතයුතු.

හෙත්වාදි විදර්ශනායි.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනාභාවනා සඞ්ග්‍රහයෙහි පළමුවන හෙත්වාදිසඞ්ග්‍රහය නිමි.

---

තවද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් අතුරෙන් රූපස්කන්ධසඞ්ඛ්‍යාත කෙශාදිද්වාත්‍රිංශද්ධර්මයන් භූතොපාදායාදිභෙදවසයෙන් කලාපානන කොට බලන පරිදි කිසේද යත්? පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථාඨිතං යථාපණිහිතං ධාතුසො පච්චවෙක්ඛති, අත්ථි ඉමස්මිං කා;

---

1. කායවිවෙකයෙන් හා චිත්තවිවෙකයෙන් උපන් රසය හා නිවන්රසය පානය කොට නවලොකොත්තරධර්මයෙන් උපන් ප්‍රීතිරසය බොන්නාවූ ක්ෂීණාශ්‍රව මහණ තෙම වේ උපශමරස පානයෙන් විඩා රහිත වූයේ ද නිෂ්පාප ද වන්නේය.

2. චතුස්සත්‍යය ද සත්ත්වශූන්‍යසංස්කාරයන් කෙරෙහි සත්ත්වව්‍යවහාරය හා සත්ත්වාපිය හා සත්ත්වාත්මප්‍රසිද්ධිය ද (සත්ත්වශූන්‍ය බවයි) ප්‍රතිසන්ධිය ද ප්‍රත්‍යයධර්මයන්ගේ සමතමන්ගේ ඵලයට ප්‍රත්‍යයභාවය ද (ප්‍රතීත්‍යසමුත්පාදය යන අර්ථයි) යන මේ සතර ධර්මයෝ යථාස්වභාව වශයෙන් දුෂ්ප්‍රතිවෙදයහ දෙශනා කරන්ට ද දුෂ්කරයහ.

3. එබැවින් ආගමාධිපරිසාධනයෙහි නියලි ප්‍රාඥ තෙම ගැඹුරුවූ මේ ප්‍රත්‍යයාකාරප්‍රභෙදයෙහි යම්සේ පිහිට ලැබේද එපරිද්දෙන් හැමවේලෙහි ම සිහි ඇතුව යෙදෙන්නේයි.

යෙ පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති, සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො විභජිත්වා නිසින්නො අස්ස, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං-පෙ-ධාතුසො පච්චවෙක්ඛති. (1)

---

1. මේ ශරීරය භාවනාවෙහි නියුක්ත භික්ෂු තෙම ඒ ඒ ඉරියව් පැවැත්වීම් වශයෙන් යම්කිසි ආකාරයකින් සිටියේ නම් ඒ සිටි පරිදි නොසික්මවා පිහිටි පරිදි නොසික්මවා මේ ශරීරයෙහි තදගතියෙන් යුත් පෘථිවිධාතුව ද තෙත්ගතියෙන් යුත් ආපොධාතුව ද උෂ්ණගතියෙන් යුත් තෙජොධාතුව ද පිරුමෙන් යුත් වායොධාතුව ද ඇත්තේයයි ධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි; යම්සේ කිසියම් දක්ෂ ගොඝාතකයෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ දෙනක් මරා සතරට පලා කොටස්වසයෙන් වෙන් වෙන් කොට සතරමංසන්ධියෙක තබාගෙණ උන්නේ වේ ද එපරිද්දෙන් භාවනාවෙහි නියුක්ත භික්ෂු තෙම මෙම ශරීරය සිටි පරිදි නොසික්මවා පිහිටි පරිදි නොසික්මවා මේ ශරීරයෙහි පෘථිවිධාතුව ද-පෙ-වායොධාතුව ද ඇත්තේයයි ධාතුවශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ස්මෘත්‍යුපස්ථානය වේ.

ඒ කෙසේද යත්? දෙන පොෂණය කරන්නාවූ ද වධස්ථානයට ගෙණයන්නාවූ ද ගෙණගොස් බැඳලා තබන්නාවූ ද මරන්නාවූ ද මැරුණාදදෙන දක්නාවූ ද ගොඝාතකයාහට දෙන මරාපලා කොටස් කොටබෙදනතෙක් දෙනය යන සංඥාව අතුරුදහන් නොවේ; බෙදා කොටස් කොට තබාගෙණ උන්නාහට දෙනය යන සංඥාව අතුරුදහන්ව මාංස සංඥාව පවතී, ඒ අවස්ථාවෙහි ඔහුට මම දෙන විකුණම් මේ ජනයෝ දෙන හැරගණිති යන සංඥාව නූපදී මම මස් විකුණම් මේ ජනයෝ මස් හැර ගණිති යන් සංඥාවම වේ, එසේම මෙසේ ප්‍රත්‍යවෙක්ෂාවට පූර්වයෙහි ගිහිවූ හෝ පැවිදිවූ හෝ මේ භික්ෂුහුගේ බාලපෘථග්ජන කාලයෙහි මෙම ශරීරය සිටි පරිදි නොසික්ම පිහිටි පරිදි

කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං යනමේ විසි කොටස; යං අජ්ඣත්තං පච්චත්තං කක්ඛළං ඛරිගතං උපාදින්නං යනු ගුණහෙයින් පඨවිධාතුය.

පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝානිකා ලසිකා මුත්තං යනමේ දොළොස් කොටස; යං අජ්ඣත්තං පච්චත්තං ආපො ආපොගතං උපාදින්නං යනු ගුණහෙයින් ආපොධාතුය.

යෙන ච සන්තප්පති යෙන ච පරිඩය්හති යෙන ච ජීරියති යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මාපරිණාමං ගච්ඡති; යනමේ සතරකොටස; යං අජ්ඣත්තං පච්චත්තං තෙජො තෙජොගතං උපාදින්නං යනු ගුණහෙයින් තෙජොධාතුය.

උද්ධඞ්ගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොට්ඨාසයා වාතා අඞ්ගමඞ්ගානුසාරිනො වාතා අස්සාසො පස්සාසො යනමේ සකොටස, යං අජ්ඣත්තං පච්චත්තං වායො වායොගතං උපාදින්නං යනු ගුණහෙයින් වායොධාතුය.

කෙසාදිමත්ථලුඞ්ගන්තා පඨවංසා හි වීසති,
පිත්තාදිමුත්තදන්තා තෙ ජලංසා මාදසීරිතා.

යෙන සන්තප්පනං යෙන ජීරණං දහනං තථා,
යෙනාසිතාදිපාකො ච චතුරංසානලාධිකා.

---

නොයික්ම හැසුනු ධාතු වෙන් වෙන් කොට ප්‍රත්‍යවේක්ෂා කරණයෙක් සත්ව පුද්ගලසංඥා අතුරුදහන් නොව පවතිත් ප්‍රත්‍යවේක්ෂා කරන්නාහට ම සත්වාදිසංඥාව අතුරුදහන් ව ධාතුවශයෙන් ම සිත පිහිටයි; මේ ගොඝාතකයා මෙන් භාවනාවෙහි නියුක්ත භික්ෂු තෙමේ ද ගො සංඥාව මෙන් සත්ව සංඥාව ද සතරමංසන්ධිය මෙන් සතරඉරියව්ව ද මස් කොටස් කොට බෙදා තබාගෙණ හිඳීම මෙන් ශරීරය ධාතු වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කිරීම ද සංසන්දනය කටයුතුයි.

උද්ධාධොගමකුච්ඡිසා කොට්ඨාසයඞ්ගසාරී ච,
අස්සාසපස්සාසා ච විඤ්ඤෙය්‍යා ඡළංසා වාතනිස්සිතා.(1)

---

1 අධ්‍යාත්මික වූ තද වූ රළු වූ කම්මයෙන් හටගත්තා වූ හෝ තෘෂ්ණාදිවශයෙන් ග්‍රහණය කරණලද කෙස් ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හදවත අක්මා දලබු බඩදිව පපුගඩු අතුනු අතුනුබහන් උදරපටල වළිවස් හිස්මොලය යන මේ විසිකොටස හා සෙසු ධාතුතුනෙහි ඇතුළත් වූ පඨවිධාතුවෙහි ස්වභාවයෙන් යුක්ත වූ අධ්‍යාත්මික වූ තද වූ රළු වූ කම්මයෙන් හටගත්තා වූ හෝ තෘෂ්ණාදිවශයෙන් ග්‍රහණය කරණලද දෙය ද යන මේ සියල්ල පෘථිවිධාතු නම් වෙත්.

අධ්‍යාත්මික වූ ද්‍රවලක්ෂණ වූ කම්මයෙන් හටගත්තා වූ හෝ තෘෂ්ණාදිවශයෙන් ග්‍රහණය කරණලද පිත් සෙම් සැරව ලේ සෙදදිය මෙදතෙල් කඳුළු වුරුණුතෙල් කෙල සොටු සඳමිදුලු මූත්‍ර යනමේ දොළොස්කොටස හා සෙසු ධාතුතුනෙහිදු ආපොධාතුවට අයිති අධ්‍යාත්මික වූ ද්‍රවලක්ෂණ වූ කම්මයෙන් හටගත්තා වූ හෝ තෘෂ්ණාදිවශයෙන් ග්‍රහණය කරණලද දෙය ද යනමේ සියල්ල ආපොධාතු නම් වෙත්.

අධ්‍යාත්මික වූ උෂ්ණස්වභාවයෙන් යුක්තවූ -පෙ- කිපුනා කල ජ්වරරොගාදිය වැළඳී ශරීරය තවන තෙජොනතිය ජරාවට පමුණුවන තෙජොනතිය කිපුනුකල ශරීරය දවන තෙජොනතිය බුදින බොන කන ලෙවකනලද ආහාරවර්ගය පැසවන තෙජොනතිය යන මේ සතරකොටස හා සෙසු ධාතුතුනෙහි වූ මීට ඇතුළත් දෙය ද යන මේ සියල්ල තෙජොධාතු නම් වෙත්.

අධ්‍යාත්මික වූ ද්‍රූණිත්වලක්ෂණ වූ -පෙ- වමන ඉක්කාදිය පවත්වන උඩට නගින වාතය මලමූත්‍රාදිය පිටකරණ යටට බස්නා වාතය බඩවැලෙන් පිටත පවත්නා වාතය බඩවැල ඇතුලෙහි පවත්නා වාතය නහරසිදුරු අනුසාරයෙන් මුළු ශරීරයෙහි අවයවයන් අනුව හැසිරෙන හැකිලීම් පැතිරීම් ආදිය කරණ වාතය ඇතුළට වදනා නාසිකාවාතය පිටතට නික්මෙන නාසිකාවාතය යනමේ සකොටස හා

කාලො ඝසති භූතානි සබ්බානෙව සහත්තනා,
යො ච කාලඝසො භූතො සභූතපචනිං පචි. (1)

චත්තාරොමෙ මහාභූතෙ විලොකෙන්තො විභාගතො,
භාවෙතබ්බං පකිංචෙවං මනසාපි විභාවිතාති. (2)

මොවුන් පඨවිධාත්වාදි සතර මහාභූතයන්ගේ වශයෙන් බලතපර්දි මෙසේ දතයුතු.

තවද මේ සතරමහාභූතයන් දෙසාළිස් ධර්‍මකෙනෙකුන්ගේ වශයෙන් බලතපර්දි කිසේයත්? අජ්ඣී ඉමස්මිං කා

---

අධගනමිකාදි වායුලක්‍ෂණ්‍යයන් සුන් අතිකුදු දෙස ද යන මේ සියල්ල වායොධාතු නම් වෙත්.

ඞමු ධානිසඞග්‍රහයෙයි යොදනලද පිළිවෙළ බලාගෙණ මෙකී පරිද්දෙන් භාවාවබොධය කටයුතුයි.

1 පෙරවරුපස්වරු ආදි කාලය තමා හා සමග සියලු ම සත්වයන් කන්නේය කාලය කෑවා වූ යම් යතිවෙක් ඇද්ද (නොහොත්) "කාලඝසො භූතො" යි කියනලද යම් ක්‍ෂීණාශ්‍රවයෙක් ඇද්ද ගෙතෙ ම තෘෂ්ණාව පිසීය; මෙහි කාලය සත්වයාගේ මස් ගලවාගෙණ නො කන්නේය යෞවනාදීන්ගේ විනාශය කොට යෞවනය ම නසනහෙයින් කාලය තෙම සත්වයන් භක්‍ෂණය කරන්නේ නම් වේ; පෙරවරුකාලය පෙරලී පස්වරු යයි කියා ද පස්වරුකාලය පෙරලී රාත්‍රී යයි කියා ද මෙසේ වූ ව්‍යවහාරයට යනහෙයින් තෙමේ තමා කන්නා නමුදු වේ කාමාදි චතුරාශ්‍රවයන් ක්‍ෂය කළා වූ ක්‍ෂීණාශ්‍රව තෙමේ මත්තෙහි ප්‍රතිසන්ධිය ක්‍ෂය කොට සිටිහෙයින් 'කාලඝස' නම් වෙයි, එසේ කාලඝස නම් වූ මහා ක්‍ෂීණාශ්‍රවයා සත්වයන් අපායභූමියෙහි උපදවනහෙයින් 'භූතපචනී නම් ලද තෘෂ්ණාව තමාගේ මාර්‍ගඥාන නැමැති වහ්නියෙන් දැවීය යනු අභිප්‍රායයි.

2 පැනැති යොගාවචර භික්‍ෂූහු විසින් මේ සතරමහාභූතයන් විභාගවශයෙන් බලා බැව්ය යුතුයි මෙසේ ම සිතිනුදු භාවනාව නොපියා නැවතනැවතත් මෙතෙහි කටයුතුයි.

යෙ කෙසා නාම පාටියෙක්කො කොට්ඨාසො අචෙතනො අ
බ්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො ථද්ධො පඨවිධාතු —— අත්ථි
ඉමස්මිං කායෙ ලොමා නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ
නඛා නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ දන්තා නාම—
පෙ—අත්ථි ඉමස්මිං කායෙ තචො නාම—පෙ—අත්ථි ඉමස්මිං
කායෙ මංසං නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ නහාරූ
නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ අට්ඨි නාම—පෙ—අත්ථි ඉම
ස්මිං කායෙ අට්ඨිමිඤ්ජා නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ ව
ක්කං නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ හදයං නාම—පෙ—
අත්ථි ඉමස්මිං කායෙ යකනං නාම—පෙ—අත්ථි ඉමස්මිං කා
යෙ කිලොමකං නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ පිහකං
නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ පප්ඵාසං නාම—පෙ—අ
ත්ථි ඉමස්මිං කායෙ අන්තං නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ
අන්තගුණං නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ උදරියං නාම—
පෙ—අත්ථි ඉමස්මිං කායෙ කරීසං නාම—පෙ—අත්ථි ඉම
ස්මිං කායෙ මත්ථලුඞ්ගං නාම පාටියෙක්කො කොට්ඨාසො
අචෙතනො අව්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො ථද්ධො පඨ
විධාතූති —— මේ අජ්ඣත්තිකපඨවිධාතුපච්චවෙක්ඛිතබ්බ
කය.

අත්ථි ඉමස්මිං කායෙ පිත්තංනාම පාටියෙක්කො කොට්ඨා
සො අචෙතනො අව්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො යූසභූ
තො ආබන්ධනාකාරෙ ආපොධාතු —— අත්ථි ඉමස්මිං කායෙ
සෙම්හං නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ පුබ්බො නාම—
පෙ—අත්ථි ඉමස්මිං කායෙ ලොහිතං නාම—පෙ—අත්ථි ඉම
ස්මිං කායෙ සෙදො නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ මෙ
දො නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ අස්සු නාම—පෙ—අ
ත්ථි ඉමස්මිං කායෙ වසා නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ
ඛෙළො නාම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ සිඞ්ඝාණිකා නා
ම—පෙ—අත්ථි ඉමස්මිං කායෙ ලසිකා නාම—පෙ—අත්ථි ඉ
මස්මිං කායෙ මුත්තං නාම පාටියෙක්කො කොට්ඨාසො අචෙත
නො අව්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො යූසභූතො ආබන්ධ
නාකාරෙ ආපොධාතූති —— මේ අජ්ඣත්තික ආපොධාතු
පච්චවෙක්ඛිතබ්බකය.

අත්ථි ඉමස්මිං කායෙ යෙන ච සන්තප්පති අයං පාටියෙක්කො කොට්ඨාසො අචෙතනො අබ්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො පරිපාචනාකාරො තෙජොධාතු — අත්ථි ඉමස්මිං කායෙ යෙන ච පරිඩය්හති අයං — පෙ — අත්ථි ඉමස්මිං කායෙ යෙන ච ජරියති අයං — පෙ — අත්ථි ඉමස්මිං කායෙ යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මාපරිනාමං ගච්ඡති අයං පාටියෙක්කො කොට්ඨාසො අචෙතනො අබ්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො පරිපාචනාකාරො තෙජොධාතූති — මේ අජ්ඣත්තිකතෙජොධාතුචතුෂ්කය.

අත්ථි ඉමස්මිං කායෙ උද්ධඞ්ගමා වාතා නාම පාටියෙක්කො කොට්ඨාසො අචෙතනො අබ්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො විත්ථම්භනාකාරො වායොධාතු — අත්ථි ඉමස්මිං කායෙ අධොගමා වාතා නාම — පෙ — අත්ථි ඉමස්මිං කායෙ කුච්ඡිසයා වාතා නාම — පෙ — අත්ථි ඉමස්මිං කායෙ කොට්ඨාසයා වාතා නාම — පෙ — අත්ථි ඉමස්මිං කායෙ අඞ්ගමඞ්ගානුසාරිනො වාතා නාම — පෙ — අත්ථි ඉමස්මිං කායෙ අස්සාසපස්සාසවාතා නාම පාටියෙක්කො කොට්ඨාසො අචෙතනො අබ්‍යාකතො සුඤ්ඤො නිස්සත්තො විත්ථම්භනාකාරො වායොධාතූති — මේ අජ්ඣත්තිකවායොධාතුෂට්කය.

චතුධාතුවවත්ථානං චෙවත්තාලීස භෙදතො,
භාවෙතබ්බං පතිට්ඨෙවං වායමන්තෙන සුබ්බතාති. (1)

මොවුන් දෙසාළිස් ධර්මකෙනෙකුන්ගේ වශයෙන් බලන පරිදී මෙසේ දතයුතු.

තවද සතර මහාභූතයන් එක්සියසතිසක් ධාතූන්ගේ වශයෙන් බලනපරිදි කිසේයත්? ඉමස්මිං කායෙ කෙසම්හි ථද්ධලක්ඛණං පඨවිධාතු ආබන්ධනලක්ඛණං ආපොධාතු පරිපාචනලක්ඛණං තෙජොධාතු විත්ථම්භනලක්ඛණං වායොධාතු — ඉමස්මිං කායෙ ලොමම්හි — පෙ — ඉමස්මිං කායෙ නඛ

1 පඨවි ආදි සතරධාතූන්ගේ ව්‍යවස්ථානය භෙදවශයෙන් දෙසාළිසෙකි; මෙ පරිද්දෙන් යහපත් ව්‍රතය හෙතු කොට ගෙණ වෑයම්කරණ භික්ෂූහු විසින් බැවියයුත්තේය.

ම්හි—පෙ—ඉමස්මිං කායෙ දන්තම්හි—පෙ—ඉමස්මිං කා
යෙ තචම්හි—පෙ—ඉමස්මිං කායෙ මංසම්හි—පෙ—ඉමස්මිං
කායෙ නහාරුම්හි—පෙ—ඉමස්මිං කායෙ අට්ඨිම්හි—පෙ—
ඉමස්මිං කායෙ අට්ඨිමිඤ්ජම්හි—පෙ—ඉමස්මිං කායෙ වක්ක
ම්හි—පෙ—ඉමස්මිං කායෙ හදයම්හි—පෙ—ඉමස්මිං කායෙ
යකනම්හි—පෙ—ඉමස්මිං කායෙ කිලොමකම්හි—පෙ—ඉ
මස්මිං කායෙ පිහකම්හි—පෙ—ඉමස්මිං කායෙ පප්ඵාසම්හි—
පෙ—ඉමස්මිං කායෙ අන්තම්හි—පෙ—ඉමස්මිං කායෙ අන්ත
ගුණම්හි—පෙ—ඉමස්මිං කායෙ උදරියම්හි—පෙ—ඉමස්මිං
කායෙ කරීසම්හි—පෙ—ඉමස්මිං කායෙ මත්ථලුඞ්ගම්හි ථද්ධල
ක්ඛණං පඨවිධාතු ආබන්ධනලක්ඛණං ආපොධාතු පරිපාච
නලක්ඛණං තෙජොධාතු විත්ථම්භනලක්ඛණං වායොධාතූ
ති—මේ අජ්ඣත්තික පඨවිධාතුයෙහි චතුධාතුවවත්ථා
නය.

ඉමස්මිං කායෙ පිත්තම්හි ථද්ධලක්ඛණං පඨවිධාතු ආබ
න්ධනලක්ඛණං ආපොධාතු පරිපාචනලක්ඛණං තෙජොධා
තු විත්ථම්භනලක්ඛණං වායොධාතූති—ඉමස්මිං කායෙ
සෙම්හම්හි—පෙ—ඉමස්මිං කායෙ පුබ්බම්හි—පෙ—ඉමස්මිං
කායෙ ලොහිතම්හි—පෙ—ඉමස්මිං කායෙ සෙදම්හි—පෙ—
ඉමස්මිං කායෙ මෙදම්හි—පෙ—ඉමස්මිං කායෙ අස්සුම්හි—
පෙ—ඉමස්මිං කායෙ වසාසු—පෙ—ඉමස්මිං කායෙ ඛෙ
ළම්හි—පෙ—ඉමස්මිං කායෙ සිඞ්ඝාණිකාය—පෙ—ඉමස්මිං
කායෙ ලසිකාය—පෙ—ඉමස්මිං කායෙ මුත්තම්හි ථද්ධල
ක්ඛණං පඨවිධාතු ආබන්ධනලක්ඛණං ආපොධාතු පරිපාච
නලක්ඛණං තෙජොධාතු විත්ථම්භනලක්ඛණං වායොධාතූ
ති—මේ අජ්ඣත්තික ආපොධාතුයෙහි චතුධාතුවවත්ථා
නය.

ඉමස්මිං කායෙ තෙජොධාතුම්හි ථද්ධලක්ඛණං පඨවිධාතු
ආබන්ධලක්ඛණං ආපොධාතු පරිපාචනලක්ඛණං තෙජො
ධාතු විත්ථම්භනලක්ඛණං වායොධාතූති—මේ අජ්ඣ
ත්තිකතෙජොධාතුයෙහි චතුධාතුවවත්ථානය.

ඉමස්මිං කායෙ වායොධාතුම්හි ථද්ධලක්ඛණං පඨවිධාතු
ආබන්ධනලක්ඛණං ආපොධාතු පරිපාචනලක්ඛණං තෙ

තේජොධාතු විජුම්භනලක්ඛණං වායොධාතූති ... වේ අජ්ඣ
ත්තික වායොධාතුයෙනි චතුධාතුවවත්ථානය.

චතුධාතුවවත්ථානං ඡත්තිංසසත භෙදතො,
භාවෙතබ්බං පනිච්චෙවං විඤ්ඤුනා සුසමාහිතානි. (1)

මොවුන් එක්සියසතිසක් ධාතුන්ගේ වශයෙන් බලනප
රිදි මෙසේ දතයුතු.

තවද මෙම සතරමහාභූතයන් කලාපානත කොට අභිඤත
ර ප්‍රයොජනවශයෙන් බලන්නාහට භූතොපාදයාදි භෙදවශ
යෙන් එක්දස්සාරසිය අසූසතරදෙනෙක් වෙති කම්මජස
න්‍තතිය චිත්තජසන්තතිය ඍතුජසන්තතිය ආහාරජසන්ත
තිය යන මොවුන්ගේ වශයෙන් එක්දස්සත්සියසතළිස්
දෙනෙක් වෙති; කම්මජකලාපය චිත්තජකලාපය ඍතුජ
කලාපය ආහාරජකලාපය යන මොවුන්ගේ වශයෙන් එක්
දස්සාරසිය සුවාසූදෙනෙක්ද වෙත්.

සම්මසිත්වා කලාපනත්තං භූතොපාදා යථාක්කමං,
පරිච්ඡෙදවසෙනෙව නිච්චං භාවෙය්‍ය යොගිනානි. (2)

තවද මෙම සතරමහාභූතයන් භූතොපාදයාදි භෙදවශයේ
න් කලාපානත කොට බලා සිත්හි ලා වඩන්නාහට රූපසක
න්ධසඞ්ඛ්‍යාත භූතොපාදයාදි ධම්මසමූහයෝ සොරවිෂසර්ප
යින් හොත් තුබසක් සෙයින් භයවිසින් වැටහෙන්නාහුයයි
සේයි.

තව ද මෙම සතරමහාභූතයන් භූතොපාදයාදි වශයෙන්
කලාපානත කොට ධම්මාලම්බනප්‍රතිවශයෙන් බලන යො
ගීහු විසින්

---

1 මෙපරිද්දෙන් නුවනැති යොගාවචරයා විසින් චතුධා
තු වැඩසථා ව එක්සියසතිස් භෙදභෙයින් බලා මොනවට අ
රමුණෙහි තබනලද සිතින් භාවනා කටයුතුයි.

2 භාවනාවෙහි නියුක්ත භික්ෂුහු විසින් භූතොපාදය භෙ
දයෙන් දෙවැදෑරුම් වූ රූපය යථාක්‍රමයෙන් කලාපනත ව
සම්මර්ශණය කොට පරිච්ඡෙදවශයෙන් නිතර භාවනා කටයු
තුයි.

භූතප්පසාදවිසයා භාවො හදයමිච්චපි,
ජීවිතාහාරරූපෙහි අට්ඨාරසවිධං තථා. (1)
පරිච්ඡෙදො ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණන්තිච,
අනිප්ඵන්නා දස චෙති අට්ඨවීසවිධම්භවෙ. (2)
කම්මචිත්තොතුකාහාරසමුට්ඨානා යථාක්කමං,
නවච්ඡ චතුරො චෙති කලාපා එකවීසති. (3)
තයො කලාපා සබ්බෙපා දසකා නවකට්ඨකා,
හොන්ති තෙරස විත්ථාරා යෙහි වුච්චන්ති සන්තති. (4)

---

1 සතරමහාභූතයෝය පඤ්චප්‍රසාදයෝය රූපශබ්දගන්ධරස යන චතුර්විධ ආලම්බනයෝය ස්ත්‍රීභාවය පුරුෂභාවය යන ද්විවිධ භාවය හෘදයරූපය ජීවිතරූපය ආහාරරූප යයි මෙසේ නිෂ්පන්නරූපය අටළොස් වැදෑරුම් වේ.

2. එසේ ම පරිච්ඡේදරූපය වූ ආකාශධාතුවය කායවිඥප්ති වාග්විඥප්ති දෙකය රූපයෙහි ලඝුවය මෘදුවය කර්මණ්‍යතාවය විඥප්තිද්වයය යන විකාරරූපය ද රූපයාගේ උපචය සන්තති ජරතා අනිච්චතායයි කියනලද චතුර්විධලක්ෂණරූපය ද යනමේ අනිෂ්පන්නරූපයන් දශයදැයි අටවිසිවිධ වේ.

3 කර්මජකලාපයෝ නවදෙනෙක චිත්තජකලාපයෝ සදෙනෙක් ඍතුජකලාපයෝ සතරදෙනෙක ආහාරජකලාපයෝ දෙදෙනෙකැයි කලාපයෝ එක්විසෙකි.

4 යම් කලාපකෙනෙකුන් කරණකොටගෙණ සතර සන්තතීහු කියනුලැබෙද්ද ඒ කලාපයෝ නිෂ්පන්නරූපඅනිෂ්පන්නරූපවශයෙන් සංක්ෂෙපයෙන් දශකය නවකය අෂ්ටකයයි තුන් පරිච්ඡෙදකින් වෙත්; විස්තරවශයෙන් පඤ්චප්‍රසාදය වස්තුය භාවය යන මොවුන්ගේ වශයෙන් සත් දශකයන් හා ඍතුජ චිත්තජ ආහාරජ අෂ්ටක තුණ හා චිත්තජ ඍතුජ ශබ්ද නවක දෙකක් හා ජීවිතනවකය හා තෙළෙසක් වෙති; මෙහි අෂ්ට කර්මජකලාපයන්ගේ වශයෙන් කර්මජ රූපසන්තති පවතී, ශුද්ධාෂ්ටකශබ්දනවකවශයෙන් ඍතුජ චිත්තජ සන්තති දෙක පවතී, ශුද්ධාෂ්ටකවශයෙන් ආහාරජ සන්තතිය පවතී, ඍතුජ චිත්තජ සන්තති දෙක ශබ්දුත්පත්තියට කාරණයක් නැතිකල්හි ශුද්ධාෂ්ටකවශයෙන් ම පවතී.

කලාපානං පරිච්ඡෙදලක්ඛණත්තා විචක්ඛණා,
න කලාපඞ්ගමිච්චාහු ආකාසං ලක්ඛණානි ච. (1)
භූතභෞතිකරූපානං සමූහස්ස යථාක්කමං,
අට්ඨකාදිප්පභෙදෙන කලාපා ඉති සම්මුති (2)

---

1 රූපකලාපයන් වෙන්කරණ හෙයින් පරිච්ඡෙදරූපය ද ලක්‍ෂණබැවින් ජාතාදිලක්‍ෂණරූපයන් ද ප්‍රාඥයෝ කලාපයට අඞ්ගයෙකැයි නො කියත්.

2 භූතරූපඋපාදායරූපයන්ගේ සමූහයට යෙදෙනයෙදෙන පරිද්දෙන් අෂ්ටකය නවකය යනාදි භෙදයෙන් කලාපය යන ව්‍යවහාරය වේ; එකොත්පාද එකනිරොධ එකනිශ්‍රය එකප්‍රවෘත්තිකය යන චතුර්විධාකාරයෙන් යුත් රූපකලාපයෝ එක්විසෙකි; ඒ කවරහුද? චක්‍ෂුප්‍රසාදය ඒ ආශ්‍රය කළ සතරමහාභූතයෝය, වර්ණය ගන්ධය රසය ඕජය ජීවිතෙන්ද්‍රිය යන මොහු චක්‍ෂුර්දශක නම් වෙත්; ශ්‍රොත්‍රප්‍රසාදය-පෙ-ජීවිතෙන්ද්‍රිය යන මොහු ශ්‍රොත්‍රදශක නම් වෙත්; ඝ්‍රාණප්‍රසාදය-පෙ-ජීවිතෙන්ද්‍රියය යන මොහු ඝ්‍රාණදශක නම් වෙත්; ජිහ්වාප්‍රසාදය පෙ-ජීවිතෙන්ද්‍රිය ය යන මොහු ජිහ්වාදශක නම් වෙත්; කායප්‍රසාදය ඒ ආශ්‍රය කළ සතරමහාභූතයෝය වර්ණය ගන්ධය රසය ඕජය ජීවිතෙන්ද්‍රිය ය යන මොහු කායදශක නම් වෙත්; ස්ත්‍රීභාවය ඒ ආශ්‍රය කළ සතරමහාභූතයෝය වර්ණය ගන්ධය රසය ඕජය ජීවිතෙන්ද්‍රිය ය යන මොහු ස්ත්‍රීභාවදශක නම් වෙත්; පුරුෂභාවය-පෙ-ජීවිතෙන්ද්‍රිය ය යන මොහු පුම්භාවදශක නම් වෙත්; හෘදයවස්තුව ඒ ආශ්‍රය කළ සතරමහාභූතයෝය වර්ණය ගන්ධය රසය ඕජය ජීවිතෙන්ද්‍රිය ය යන මොහු වස්තුදශක නම් වෙත්; සතරමහාභූතයෝය වර්ණය ගන්ධය රසය ඕජය ජීවිතය යන මොහු ජීවිතනවක නම් වෙත්; මේ නවකලාපයෝ කර්මසමුත්ථානකලාප නම් වෙත්.

සතරමහාභූතයෝය ඒ ඇසුරුකළ වර්ණය ගන්ධය රසය ඕජය යනමේ අට ශුද්ධාෂ්ටක නම් වෙත්; මේ ශුද්ධාෂ්ටකය ම කායවිඥප්තිය හා සමග කායවිඥප්තිනවක නම් වේ; මේ ශුද්ධාෂ්ටකය වාග්විඥප්තිය ශබ්දය යන මේ දෙක හා සමග

සලක්ඛණවිසෙසෙන හොති නාමවිසෙසතා,
සබ්බං රුප්පණභාවෙන රූපං ඉති පවුච්චති. (1)

අඞ්ගපච්චඞ්ගකොට්ඨාසකලාපාකාරතො පන,
සඞ්ගතො රූපපුඤ්ජොව වුච්චතෙ කායොති එකතො. (2)

නානාසණ්ඨිපරිච්ඡින්නඅඞ්ගපච්චඞ්ගරාසිතො,
හොති නාමං සරීරන්ති ඉත්ථී වා පුරිසොති වා. (3)

---

වාගවිඥප්තිදශක නම් වේ; එසේම මේ අෂ්ටකය ලඝුත්වය මෘදුත්වය කර්මණ්‍යත්වය යනමේ තුණ හා සමග ලඝුතාද්‍යෙකාදශකය, කායවිඥප්ති ලඝුතාදීන් හා සමග කායවිඥප්ති ලඝුතාදි ද්වාදශකය, වාගවිඥප්ති ශබ්ද ලඝුතාදීන් හා සමග වාගවිඥප්ති ශබ්ද ලඝුතාදි ත්‍රයොදශකයයි; මේ සදෙන චිත්තසමුට්ඨානකලාපයෝ නම් වෙත්.

ශුද්ධාෂ්ටකය, ශබ්දනවකය, ලඝුතාද්‍යෙකාදශකය, ශබ්ද ලඝුතාදිද්වාදශකයයි; මේ සතර දෙන ඍතුජකලාපයෝ නම් වෙත්.

ශුද්ධාෂ්ටකය, ලඝුතාද්‍යෙකාදශකයයි; මේ දෙදෙන ආහාරජකලාපයෝ නම් වෙත්; මෙසේ කර්මජ චිත්තජ ඍතුජ ආහාරජ යන මේ කලාප සතර විභාගවශයෙන් එක්විස්සෙක් වෙයි; කලාපව්‍යවහාරය මෙසේ දතයුතු.

1 කක්ඛළත්වාදි තමතමන්ගේ ලක්ෂණනානාත්වයෙන් පඨවිධාතුය අපොධාතුය යනාදීන් වෙන වෙන නම් වන්නේය. සියලු රූපම ශීතොෂ්ණාදියෙන් විකාරයට පැමිණෙන බැවින් සාමාන්‍යනාමයෙන් රූපය යි කියනු ලැබේ.

2 හස්තපාදාදිඅවයවය කෙශාදි කොට්ඨාස කලාපාකාරය යන මොවුන්ගේ වශයෙන් එකාබද්ධව හැසුනු රූපසමූහයම එක්කොට ගෙණ කායයි කියනලදී.

3 නොයෙක් සණ්ඨියෙන් පිරිසිඳුනු හස්තපාදාදිඅඞ්ගප්‍රත්‍යඞ්ගසමූහයට ශරීරයයි කියාද ස්ත්‍රීයයි කියා හෝ පුරුෂයයි කියා හෝ නාමව්‍යවහාරය වන්නේය.

ජාතො ජිණ්ණො මතො චෙති සභාවෙනායමිති සම්මුති,
ජායමානාදිභාවෙන රූපකායො පවත්තති. (1)

කායො න පස්සති සුණාති ච නෙව කිඤ්චි
ජානාති කිච්චමපි නෙව සයං කරොති,
යුත්තො පවත්තති මනෙන තථා තථායං
සුත්තෙන යන්තමිව දාරුමයං පවුත්තං. (2)

---

1 සත්වයා උපන්නේය සත්වයා ජරාවට පැමිණියේය සත්වයා මළේය සත්වවනාඩිය (හෙවත්) සත්වයා රෝගීයයි මේ පරමාර්ථයෙන් විද්‍යමානස්කන්ධයන් නිසා පැවති අවිද්‍යමාන ප්‍රඥප්තිය පරමාර්ථයෙන් උපදිනදිරණබිඳෙනපෙළෙන ස්වභාවයෙන් සජීවිතරක්ෂිත රූපසමූහය පවතී.

2 මේ රූපකය රූපදක්නා විඥානයට ප්‍රත්‍යය වන පමණක් මිස තෙමේ රූපයන් නොදකී ශබ්දශ්‍රවණය කරණ විඥානයට ප්‍රත්‍යය වන පමණක් මිස ශබ්ද නො අසයි, එසේ ම ගන්ධ රස ස්පර්ශවැටහීයන් සම්බන්ධ කිසිවකුත් නොදනී; යම්සේ දණ්ඩෙන් කළ රූපයක් තමාගේ ඇසට කණට ඝ්‍රාණයට මුඛයට එළවූ රූප ශබ්ද ගන්ධ රස අරමුණු කිසි ප්‍රකාරයෙකිනුත් නො දනීද කිණිහිරපිට තබා තලනකල නො දනීද එහෙයින් ම මේ ශරීරය තමා නිසා පවත්නා සිත් අනුගත ව පවත්නේ නමුදු අරමුණු නොදක්නා ලක්ෂණයෙන් කාෂ්ඨරූපය හා වෙනසක් නැත්තේය, කාෂ්ඨරූපය තමා කරා වන් අරමුණු නො දන්නාසේ ම මේ ශරීරය ද අරමුණු නො දනී කය පිළිබඳ සියලු කටයුතු ද මේ ශරීරය තමාගේ ශක්තියෙන් නොකෙරෙයි, ලනුකමින් යුක්තකරණලද දණ්ඩෙන් සැදූ යන්ත්‍රරූපයක් මෙන් මේ ශරීරය සාවජ්ජන ජවනචිත්තයා විසින් යුක්තවූයේ ගමණාදි ඒඒ ආකාරයෙන් පවතී; යම්සේ ලනුකමින් යොදනලද යන්ත්‍රරූපය ලනුකම් වෙගයෙන් යනබව මුත් තමා යන දිසාව ද ගමණ ද තෙමේ නොදනී ද යම්තෙනකට යේ ද එමෙන් මේ ශරීරය ද හුදෙක් චිත්තබලයෙන් යන්නේ ම තමා යනදිසාව ද ගමණ ද නොදනී යම්තැනකදී චිත්තය නිරුද්ධ වී නම් යම්සේ කාෂ්ඨක්‍රියාවිශෙෂයකි මෙසේ නොදනී ද එහෙයින් වාක්‍යාර්ථවිශ

නානත්තතො හි මනසො අනිලස්ස භෙදො
භෙදානිලස්ස ගමණාදික්‍රියාවිභාගො,
කායස්ස සිජ්ඣති ක්‍රියා ච තථාතථායං
දෙසන්තරම්හි ඉතරීතරරූපසිද්ධි. (1)
නානත්තතො මානසඝුරවානං
නානාවිධානානි භවන්ති එවං,
අජ්ඣානුරූපක්‍රියසද්දහෙතු
තත්ථාවිනිබ්භාගමත්ත් රමන්තා. (2)

---

යෙහිදු තමාගේ ශබ්දකරණය හා ශබ්දය නොදන්නා බෙරය මෙන් තමාගේ ශබ්දකරණය ද ශබ්දය ද නොදනී හුදෙක් වාග්භෙදසාවජ්ජනජවන චිත්තජ පඨවිසංඝට්ටනජ සංවිඥප්ති ශබ්දය ද ශ්‍රොත්‍රප්‍රසාදහෘදයවස්තුනිශ්‍රිතචිත්තත්‍රිමාත්‍රයෙන් යථාභිප්‍රායවශයෙන් දන්නී ශරීරය වනාහි තෙමේ තමාගේ ශබ්දකරණය ද ශබ්දය ද නොදනී.

1 සාවජ්ජනජවනචිත්තයාගේ ඒ ඒ ක්‍රියාවිභිතනානත්ව හෙතුවෙන් චිත්තජවායොධාතුහුගේ නානත්වය වන්නේය චිත්තජවායොධාතූහුගේ නානත්වයෙන් ශරීරයාගේ ගමණාදි ක්‍රියානානත්වය සිද්ධවන්නේය ශරීරයාගේ මේ ගමණාදි ක්‍රියා නමුදු පරමාර්ථහෙයින් අනෙකතත්ප්‍රදෙශයෙහි ගමණාදි ඒ ඒ ආකාරයෙන් ඉතරෙතරරූපොත්පාදමාත්‍රයකි ගමණාදි ඒ ඒ ක්‍රියාවිෂය කොට උපන් චිත්තනානත්වයෙන් චිත්තජධාතුනානත්වය වෙයි වායුනානත්වයෙන් ක්‍රියානානත්වය වෙයි ක්‍රියානානත්වය නම් ඒ ඒ ප්‍රදෙශයෙහි උපනුපන් රූපයන් නිරුද්ධ ව අන්‍යඅන්‍යකාලයෙහි අන්‍යඅන්‍යදෙශයෙහි අන්‍යඅන්‍යරූපයන් ආගන්තුක ව පහළවනමාත්‍රයක කාලාන්තරදෙශාන්තරයෙහි රූපාන්තරප්‍රාදුර්භාවය ගමණාදි නම්.

2 චිත්තය පඨවිධාතුය ශබ්දය යන මොවුන්ගේ නානත්වය හෙතු කොටගෙණ නොයෙක් නම් ලොකයෙහි වෙති චිත්තනානත්වයෙන් පෘථවිනානත්වය වෙයි පෘථවිනානත්වයෙන් ශබ්දනානත්වය වෙයි ශබ්දනානත්වයෙන් නාමනානත්වය වෙයි මෙසේ අභිමතාර්ථානුරූපශරීරයෙන් පවත්නා ක්‍රියාශබ්ද දෙදෙනා හෙතු කොටගෙණ ඒ ශරීරයෙහි විනිබ්භාග කැමති ජනයෝ ස්ත්‍රිය පුරුෂය මමය මාගේය යනාදී මිථ්‍යාග්‍රහණයන් ගෙණ ඇලෙන්නාහුය.

කත්වා විනිබ්භොගමිදං සරීරං
නිස්සත්තමෙතන්ති පහාය සඤ්ඤං,
මොහන්ධකාරාතුරජීවලොකො
තුච්ඡං විතක්කෙති ධම්මමෙතං. (1)

අලද්ධා සබ්භිසංවාසං සරීරෙ ධාතුමත්තකෙ,
යථාභූතමජානන්තා කරොන්ති පටිසං රතිං. (2)

භූතප්පජොව භූතානං වසෙනෙව පවත්තති,
නත්ථි කොචි පවත්තෙන්තො පවත්තාපතකො නරො. (3)

නයෙත්ථ දෙවො න බ්‍රහ්මා නත්ථිත්ථී පුරිසොති වා,
ධාතුමත්තාසුභානිච්චදුක්ඛධම්මා පවත්තරෙ. (4)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
සඞ්ඛාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රෑහයෙ.

උපසන්තො උපරතො මන්තභාණී අනුද්ධතො,
ධුණාති පාපකෙ ධම්මෙ දුමපත්තංව මාළුතො.

පඤ්චඞ්ගිකස්ස තුරියස්ස න රති හොති තාදිසී,
යථා එකග්ගචිත්තස්ස සම්මාධම්මං විපස්සතො.

---

1 මේ ශරීරය ධාතුවාදිවශයෙන් වෙන් කොට මෙය සත්ත්වරහිතයයි යනාදි සංඥාවන් හැරපියා මොහාන්ධකාරයෙන්ආතුර ලෝවැසි තෙම ධර්‍මමාත්‍ර වූ මේ ශරීරයෙහි සත්ත්වය ජීවයයි මිථ්‍යායෙන් විතර්කණය කෙරේ.

2 සත්පුරුෂසඞ්ගමය නොලදින් ධාතුමාත්‍ර වූ ශරීරයෙහි තත්ත්වය නො දන්නාහු පටිසය හා ඇල්ම කරන්නාහුය.

3 මෙසේ චිත්තජභූතයන්ගේ වශයෙන් චතුර්විධභූතප්‍රජය ම ගමණාදිආකාරයෙන් පවත්නේය ගමණාදික්‍රියාවශයෙන් පවත්නා වූ ද පවත්වන්නාවූ ද කිසි සත්වයෙක් ලෝකයෙහි නැත්තේය.

4 මේ ශුද්ධසංස්කාරමාත්‍රයෙහි දෙවියෙකු දු නැත්තේය බ්‍රහ්මයෙකු දු නැත්තේය ස්ත්‍රියෙකු දු නැත්තේය පුරුෂයෙකු දු නැත්තේය ධාතුමාත්‍ර වූ අශුභ වූ අනිත්‍ය වූ හුදෙක් දුඃඛ ධර්‍මයෝ ම හෙතුඵල පරාමශීවශයෙන් පවතිත්.

පවිවෙකරසං පිත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං.
සචාපෙවං විනිබ්භොගං සරීරං පරමත්ථතො,
සුවිසඞ්ඛාරපුඤ්ජොයමිති භාවෙය්‍ය පණ්ඩිතො. (1)

මොවුන් භූතොපාදායාදිභෙදවශයෙන් කලාපානත කොට බලන පරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනාභාවනා සඞ්ග්‍රහයෙහි දෙවන ධාත්වාදිසඞ්ග්‍රහය නිමි.

---

තවද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයන් අතුරෙන් රූපස්කන්ධසඞ්ඛාත කෙශාදිද්වාත්‍රිංශදාකාරයන් ආදීනවාදීන්ගේ වශයෙන් බලනපරිදි කිසේයත්? "බහුදුක්ඛො බො අයං කායො බහුආදීනවො-ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති-සෙය්‍යථීදං-චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිනාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවොති" (2) යනාදි පාලිවශයෙන් ද.

---

1 ශරීරය මෙසේ සියක්වාරයෙහි පුළුන් පොළා විසුරුවන්නාක් මෙන් විසන්ධි කොට නුවනැති පුද්ගල තෙමේ ඇඟිල්ලෙන් ඉලිමලගැර සුදු වූ ලොහ මෙන් ඝනවිනිර්භොග ගණ්ඨයෙන් දුරු වූ ශාන්තශුද්ධවිමල ඇත්තේ පරමාර්ථයෙන් මේ ශුද්ධ සංස්කාරපුඤ්ජමාත්‍රයයි මෙසේ නුවනින් මිනා කොට දක්නේයි.

2 ශුක්‍රශොණිතයෙන් හටගත් මේ ශරීරය වනායී බොහෝ දුක් ඇත්තේය බොහෝ උපද්‍රව ඇත්තේය මේ ශරීර

තව ද මෙම ආදීනවයෙහි අවාභූවක් රෝගයෙන් හා න
වාත්‍රාවක්ව්‍යාධියෙන් හා දෙතිස්වණක් අන්තරායෙන් හා අ
සූවක් පණුකුලන් විසින් ගැවසීගත්තේය; කෙස් ලොම්
ණිය දත් මූ ඈ පිරුණුවැසිකිළියක් සෙයින් ඇතුළ නො
යෙක් කුණින් පිරුණේය; තෙල්බත් සිලියෙන බජනක්
සෙයින් නවවණවහමුයෙන් නවාහුදහසක් මැලිගිණ්බස්
ගේය; සැඬොල්නම්දෙදොරෙක්හි පණුහුනු ගවරවළක්සෙයින්
නොයෙක් පණුකුලන්ට බවස්වූයේය; නොයෙක් දෙසින්
බස්නා ගඟබයට පිහිට වූ මහමුහුදසෙයින් නොයෙක්ප
සයෙන් වන රෝගයට පිහිට වූ දුක්මහමුහුද; පිළිසන්ගඩක්
සේයින් දුක්පිඩ; දුස්නාවණමුයක් සෙයින් දුදුගිසහැකිය;
පෙලෙළනගඩක් සෙයින් දුපිරිරිය හැකිය; සෙනගිනිහමුයෙ
හි මකුළුහුසහලෙක්හි තුබූ කුකුළුබිජක්සෙයින් දුරැකියහැකි

---

යෙහි මෙසේ අනෙකප්‍රකාර ආබාධයෝ උපදිත්; ඒ කවර
හු දයත්? ඇස්හි උපදනාරෝගය කණ්තුල උපදනා රෝගය
නැහැයතුළ උපදනා රෝගය දිවෙහි උපදනා රෝගය කයෙ
හි උපදනා රෝගය ශිරෝරෝගය කණ්පිට හටගන්නා රෝ
ගය මුඛයෙහි උපදනා රෝගය දත්මුල උපදනා රෝගය කැ
සිය මුසය නැහැයපිට උපදනා රෝගය දාහය ජ්වරය කුක්ෂි
රෝගය මූර්ඡාය රක්තාතිසාරය සූලරෝගය මහාවිරේකය
කුෂ්ඨය ගෙඩිය කබරය කෂයරෝගය අපස්මාරය දදය කඩු
ණිය කෂුද්‍රවිතච්ඡිකාය නියෙන් ඉරිගැසුනුතැන්හි සැදෙන
රෝගය මහාවිතච්ඡිකාය ලේ පිතය මධුමෙහෙය ලිඟය වගේ
මොහොල්පිලි මෙන් වලයාකාරව හටගන්නා උපදංශ රෝ
ගය බිබිලිය භගන්දරය පිත්තජරෝගය ශ්ලෙෂ්මජරෝගය
වාතජරෝගය සන්නිපාතිකරෝගය ඍතුවිපර්‍යාසයෙන් හෝ
වන් අධිකවූ ශීතොෂ්ණවශීයෙන් උපදනාරෝගය විසම හැ
සිරීමෙන් උපදනාරෝගය වධබන්ධනාදිවූ අනුන්ගේ උපක්‍රම
යෙන් උපදනාරෝගය මේ හෙතුවලින් වෙන්වූ හුදෙක් පූ
ර්වයෙහි කළ කර්මවිපාකවශයෙන් උපදනාරෝගය ශීතය
උෂ්ණය ආහාරසාවය පිපාසය මලපහකිරීමය මූත්‍රවිසර්ජන
යන මොහු ආදීනවයෝයි.

ය; පැන්පවණ්ඇතියක්හට මහඅවුයෙහි පෙණෙන මිරිඟුදියක් සෙයින් නොහැකියහැකිය; මුහුදක්දියෙන් සෝද සකස් කොට ලිය නො හැකිය; පොළවක්ගඩින් වසා සුවඳ කොට ලිය නො හැකිය; දකුත්දකුත්දුකසී; රකුත්රකුත් නසයි; දූග සකස් නො කොට හැකිය; රැක තාවුරු නොකටහැකිය; පස දී සුවපත් නොකටහැකිය; මමත්වැ සිය නොකටහැකිය; හුනුහුනුවත් කෙලෙසන අසුචිවළක්සෙයින් මල්ගඳ විලවුන් හැම මනාසුවඳ දුගඳ කරණසුවඳයොවුන් මිරිකන ජරාවක් සෙයින් හන්හන්වත් කිලුටුකරණ නිසිරිය; උපනුපන්නන්නිරිසත්සරණනිරුගැබ සෙයින් වැලඳුවැලඳුවා නොසකස්කරණමලගැබ; පහළපහළතැනින් සිල්වනකුකුළුබිජුකුඹලක් සෙයින් මැසිමදුරුඇ නොයෙක් දුඹුල්සතුන් විසින් විද ලේඛියහැකිය; නොහරඅත්ලෙහි පිරිවැටලී වෙන් ගෙණයන ගින්නැටියක් සෙයින් ඉරියවුපිරිවැටලී මෙන් මිස නොපිරිවැටලියහැකිය; දුක්පිඩවුත් හරසයි සලකා සප් ගතුවහට දුක් දෙනසෙයින් මෙසිරුරු මම සයි ගතුවහට දුක් දෙනුවුයේ; ගියජාතියෙහි කළ කුශලාකුශලින් ලද්දේත් මෙම කුණුපිඩය මතුමත්තෙහි ලබන්නෙත් මෙව කුණුපිඩය මිට ජාතියයි සම්මත කලෞ්-මේහැම ආදීනව වශයෙන් ද.

තව ද මෙම රූපස්කන්ධසම්බන්ධආදීනව ධර්මයන් අධිකතර ප්‍රයොජනවශයෙන් බලන යොගිහු විසින්

ආදානනික්ඛෙපණතො වයොවුඩ්ඪගාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති. (1)

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො,. (2)

---

1 චුතිප්‍රතිසන්ධිහෙයින් හෝ ජාතිමරණහෙයින් ද වයොවශයෙන් වෘද්ධියට ගිය රූපයාගේ විනාසහෙයින් ද රූපප්‍රත්‍යය ආහාරහෙයින් ද ඍතුහෙයින් ද කර්මහෙයින් ද චිත්තහෙයින් ද ධර්මතා රූපහෙයින් දැයි මෙසේ සත්ප්‍රකාරයකින් විස්තරවශයෙන් විදර්ශනා කරන්නේය.

2 ශූන්‍යාගාරයට වන් (හෙවත්) ජනවිවික්තස්ථානයෙක්හි කර්මස්ථාන මෙනෙහි කෙරෙමින් උන්නා වූ තිවිසිත් ඇ

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතආදීනවධර්මයන් වශයෙන් බලන්නහට කායසම්මතරූපයෝ විශුද්ධමාර්ගයන් විසින් පරිත්‍යක්තවූ වනගහනයක් සෙයින් ආදීනවවිසින් වැටහෙන්නාහුය යි සේයි.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතආදීනවධර්මයන් ධර්මාලම්බන ප්‍රීතිවශයෙන් බලනයෝගීහු විසින්

පුබ්බලොහිතසම්පුණ්ණං බහුස්ස කුණපස්ස ච,
නරවීරකතං වග්ගු සමුග්ගමිව චිත්තිතං. (1)

අල්ලචම්මපටිච්ඡන්නො නවද්වාරෙ මහාවණො,
සමන්තතො පග්ඝරති අසුචී පූතිගන්ධියො. (2)

දුග්ගන්ධො අසුචීකායො කුණපො උක්කරූපමො,
නින්දිතො චක්ඛුභූතෙහි කායො බාලාභිනන්දිතො. (3)

දිපාදකොයං අසුචි දුග්ගන්ධො බහුපද්දවො,
නානාකුණපපරිපූරො විස්සවන්තො තතො තතො. (4)

---

හි රූපාරූපධර්මයන් මනා කොට අනිත්‍යාදිවශයෙන් විශෙෂයෙන් බලන මහණුට විදර්ශනායෙහි අභියොගයක් නැති අන්ධපෘථග්ජනලෞකිකජනයා විසින් ලැබිය නොහැකි විදර්ශනාසඞ්ඛ්‍යාත අමානුසිකප්‍රීතිය ද අෂ්ටසමාපත්තිසඞ්ඛ්‍යාත දිව්‍යරතිය ද වන්නීය.

1 පුසාවෙන් හා ලෙයින් ද බොහෝ කුණපයෙන් ද පිරුණු ශරීරය නරවීරයෙකු විසින් (හෙවත්) දක්‍ෂවඩුවෙකු විසින් කරණලද මාහැඟි සුමුගක් මෙන් සිතියම් කරණලද්දේය.

2 මේ ශරීරය නම් තෙත් සමකින් වැසෙනලද්දේය අසුචි නික්මෙන නවදොරක් ඇත්තේය මහත් ව්‍රණයකි හාත්පසින් අසූචි වැගිරෙයි අපවිත්‍රය කුණුගඳ ඇත්තේය.

3 දුර්ගන්ධ වූ අපවිත්‍රසමූහය වූ කුණප වූ කසලගොඩක් බඳුවූ මේ ශරීරය නුවනැස් ඇත්තවුන් විසින් නින්ද්‍ය කරණලද්දේය අඥානජනයන් විසින් සතුටුවනලද්දේය.

4 දෙපාඇති මේ අපවිත්‍රය දුර්ගන්ධය බොහෝ උපද්‍රව ඇත්තේය නොයෙක් කුණපයෙන් පරිපූර්ණය ඒ ඒ දොරින් නොයෙක් කුණු වැගෙන්නේය.

අසනං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං,
එකද්වාරෙන පවිසිත්වා නවද්වාරෙහි සන්දති. (1)

අසනං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං,
භුඤ්ජති සපරිවාරො නික්ඛාමෙන්තො නිලීයති. (2)

අසනං පානං ඛාදනීයං භොජනඤ්ච මහාරහං,
එකරත්තිපරිවාසා සබ්බං භවති පූතිකං (3)

ඉ තා ප ගබ් නසවෙතස්මිං එතෙනා යන්ති ච පූතිකං
ජනා තුච්ඡං විහඤ්ඤන්ති දෙහස්මිං උභතො මුඛෙ (4)

යථා අග්ගිම්හි පක්ඛිත්තං හොති සබ්බම්පි ඣාරිකං,
තථා දෙහෙපි පක්ඛිත්තං හොති සබ්බං කරීසකං (5)
නච්චාපක්ඛිපිතුං සක්කා පක්ඛිත්තං රක්ඛිතුම්පි ච,
දුප්පමුච්චමිදං දුක්ඛං නරානං සතතානතං. (6)

දුම්මිතො දුබ්භරො කායො දුනෙබ්බො දුප්පරිහාරියො,
දුත්තිත්ථෙප්පා දුරන්දුනො දුප්පදුරෙ දුස්සකො සදා. (7)

---

1 මානැගි බත්පැන්කැවිලිබොජුන් එකදෙරකින් ඇතුළ් වී අපවිත්‍ර ව නවදෙරකින් වැහෙයි.

2 මානැගි බත්පැන්කැවිලිබොජුන් පිරිවරසහිතව හිඳ අනුභවකෙරෙයි නික්මවන්නේ සැඟවෙයි.

3 මානැගි බත්පැන්කැවිලිබොජුන් සියල්ල ම එක්රැය ක් පරණවීමෙන් කුණුවෙයි.

4 මේ ශරීරයෙහි මැතින් බහාලනලද දෙය ඇතින් අශුචිබවට යෙයි ජනයෝ දෙදිසායෙන් මුඛ ඇති මේ ශරීර යෙහි ව්‍යර්ථ ව වෙහෙසෙත්.

5 යම්සේ ගින්නෙහි බහාලූ සියල්ලම අනතයෙහි එකම හලුවන්නේ ද එසේ ම ශරීරයෙහි බහාලනලද සියල්ල අනතයෙහි එක අසුචි ම වන්නේය.

6 මේ ශරීරයෙහි ආහාරාදිය බහානොලන්නටත් බහාලූ දෙය අසුචි විය නොදී රක්නටත් නොපිළිවන මනුෂ්‍යයන්ට මේ සතතයෙන් ම එලඹ සිටි පහ කොට ගත නොහැකි දුකෙකි.

7 ශරීරය හැමකල්හි පොෂ්‍ය කළවුන්ට අනර්ථයට හෙතු වනබැවින් පාපමිත්‍ර ගැල් සියසකිනුදු එලවනලද ප්‍රත්‍යයෙක

නිච්චෙතනො නිරුස්සාහො නිස්සාරෙ නීචගොචරෙ,
නික්කිලෙසපරිච්චත්තො කායො නිග්ගුණසෙවිතො. (1)

නායං මිත්තො න සත්තු ච නච කස්සචි සන්තකො
නිජ්ජීවාසුචිමෙ යනාව කෙවලං කම්මසම්භවො. (2)

අලෙනාසරණො කායො සබ්බාතඞ්කමහාපථො,
ජරාදිපාවකාදිත්තො සබ්බදුක්ඛූපනිස්සයො. (3)

---

න් පොෂ්‍යය කොටත් රැකගත නොහැක්ක හුදුදුක්පිඩය ඒ අතින් ඒඅතට අලල ගෙණයන ගින්නක් මෙන් ඉරියව් ව ශ්‍රයෙන් පවත්වනලද හෙයින් දුකින් පරිහරණීය කටයුත්තේය දවස් පාසා සෝද පිළියම් කොට ද පවිත්‍ර කරන්නටත් නිරෝගී කරන්නටත් නොපිලිවන් හෙයින් පිළියම් නොකොට හැක්කේය මරීචිග්‍රහණියක් මෙන් මමය මාගේයයි නොගතහැක්කේය දවසක්පාසා අසුචිබවට පැමිණි බාහ්‍යව නබැවින් හැමකල්හි ම පිරිය නොහැක්කේය පිරිසිදු වස්ත්‍රකාත් දූෂ්‍ය කරන්නේය.

1 මේ ශරීරය චෙතනාස්වභාවයක් නැත්තේය වීර්‍ය්‍යය නැත්තේය ගතහැකි කිසි සාරයක් නැත්තේය ශෘගාලාදිනී සතුන්ට ගොචරය බුද්ධාදිශ්‍රෙෂ්ඨතරගිතදාත්තමයන් විසින් හැරපියනලද්දේය සත්පුරුෂගුණ නැති අඥනජනයන් විසින් සේවනය කරණලද්දේය.

2 මේ ශරීරය හුදෙක් කිසිවෙකුට මිත්‍ර ද නොවෙයි එසේ ම කිසිවෙකුට නෑද නො වෙයි කිසිවෙකු සන්තක ද නොවෙයි හුදෙක් පූර්වකර්මයෙන් පහලවූ සත්වජීවරහිත වූ අසුචිපුඤ්ජමාත්‍රයෙක් මැයි.

3 මේ ශරීරය තමා ම අනුන්ට සැඟවෙනස්ථානවිය නොහැකිහෙයින් ද තමාට සැඟවෙන ස්ථානය නොලත් හෙයින් ද අලෙනය අනුන්ට පිහිටවියනොහෙනහෙයින් ද තමහට පිහිටක් නොලබනහෙයින් ද අශරණය සියලු අතංක එන මහමගෙක ජරාමරණාදිඑකාදශාග්නියෙන් නිරන්තරයෙන් දිලියෙන්නේය ජාත්‍යාදි සියලු සංසාරදුඃඛයට බලවත් හෙතුභූතකි.

බහුධම්මසමොධානො බහුපච්චයනිස්සිතො,
බහුසාධාරණො කායො බහූපද්දවපීළිතො. (1)

සචෙපි අන්තොගතකොට්ඨාසරාසී
චරෙය්‍ය කාමං බහි නික්ඛමිත්වා,
දණ්ඩං ගහෙත්වා පන කාකසොණෙ
නිවාරයෙ අඤ්ඤමකුබ්බමානො. (2)

න විජ්ජතෙ දුග්ගන්ධමනත්තනිච්චං
සරීරතො පූතිමසාරමඤ්ඤං,
එතාදිසෙ චාපි කරොන්ති ඡන්දං
තතො කිමඤ්ඤං පන මොඝකිච්චං. (3)

විරූපමඤ්ඤං අසුචිං න දෙහතො
භයස්ස මූලං විපරීතචෙතසා,
උපෙන්ති දුක්ඛං කටුකං තහිං රතා
නරොරචක්කෙ විය ගිද්ධමානසො. (4)

---

1 මේ ශරීරය අස්ථ්‍යාදි බොහෝ කොටස් හා බොහෝ සන්තති හා බොහෝ කලාප හා බොහෝ රූපයන්ගේ සමූහමාත්‍රයෙක කාලධම්මක්ලෙශාදි බොහෝ ප්‍රත්‍යයන් ආශ්‍රය කොට ඇත්තේය බොහෝ සත්වසාධාරණය බොහෝ උපද්‍රවයෙන් පීඩිතයි.

2 ශරීරාභ්‍යන්තරයෙහි තිබෙන අතුණුආදි කොඨාසරාශිය ශරීරයෙන් පිටතට නික්ම එලෙන්නේ වී නම් එකාන්තයෙන් අවකාසනැතිහෙයින් අනික්කටයුත්තක් නොකරමින් දණ්ඩක් අතින් ගෙණ කවුඩුබල්ලන් නිරන්තරයෙන් වළකන්නේයි.

3 මේ ශරීරයට වඩා අනික් දුගඳක් ද ආත්මරහිතදෙයක් ද වහාබිඳෙන දෙයක් ද අසුචියෙක් ද අසාරයෙක් ද නැත මෙබඳු ශරීරයෙහි පවා ආලය කෙරෙත් එයට වඩා අනික් නිෂ්ඵලකෘත්‍යයෙක් නම් කවරේද?

4 ශරීරයට වඩා අනික්විරූපයෙක් ද අපවිත්‍රයෙක් ද සියලු භයට හෙතු වූ මූලක් ද නැත විපරීතසිතින් ඒ ශරීරයෙහි ඇලුනු සත්වයෝ උරචක්‍රයෙහි ගිජුසිත්ඇති පුරුෂයා මෙන් ඝොරවූ දුකට පැමිණෙත්.

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රූහයෙ.

උපසන්තො උපරතො මන්තභාණී අනුද්ධතො,
ධුනාති පාපකෙ ධම්මෙ දුමපත්තංව මාළුතො.

පවද්ධිකස්ස තුරියස්ස න රති හොති තාදිසී,
යථා එකග්ගචිත්තස්ස සම්මාධම්මං විපස්සතො.

පවිවෙකරසං පිත්වා රසං උපසමස්ස ච
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිවං.

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති. (1)

මොවුන් ආදීනවාදින්ගේ වශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත කෙශාදිවාත්‍රිංශද්වර්ණයන් අශුභාදින්ගේ වශයෙන් බලනපරිදි කියේයයත්? "පුනච පරං භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති; සෙය්‍යථාපි භික්ඛවෙ උභතොමුඛා මුතොලී පූරා නානාවිහිතස්ස ධඤ්ඤස්ස-සෙය්‍යථීදං-සාලීනං වීහීනං මුග්ගානං මාසානං තිලානං තණ්ඩුලානං තමෙනං චක්ඛුමා පුරිසො මුඤ්චිත්වා පච්චවෙක්ඛෙය්‍ය ඉමෙ සාලී ඉමෙ වීහී ඉමෙ මුග්ගා ඉමෙ මාසා ඉමෙ තිලා ඉමෙ තණ්ඩුලාති; එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු—පෙ—කෙසා ලොමා නඛා දන්තා තචො—පෙ-සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති"(2) යනාදි පාලිවසයෙන් ද.

---

1 යම් තථාගතශ්‍රාවකකෙනෙකුන්ට දිවාභාගයෙහිත් රාත්‍රිභාගයෙහිත් සතතයෙන් ද්වත්තිංසාකාරවසයෙන් හෝ නවසීවථිකාවසයෙන් හෝ චතුධාතුවවත්ථානවසයෙන් හෝ අජ්ඣත්තනීලකසිණාදි රූපධ්‍යානවශයෙන් හෝ කය අරබයා උපදනා සති තොමෝ ඇද්ද ඒ බුද්ධශ්‍රාවකයෝ හැමකල්හි ම පෙහෙන් නිඳා පෙහෙන් පුබුදිනාහ.

2 යොගාවචර මහණතෙම පාදතලයෙන් උඩ කෙශමස්තකයෙන් යට සම හාත්පසින් කෙලවර කොට ඇති නා

තව ද මෙම අශුභ අරමුණෙහි කලලාදී අවස්ථාවෙහි පටන් ක්‍රමයෙන් වැඩී කෙසාදිවත්තිංසභෙදයට ගියාවූ අසුභාරම්මණය නම් මුත්තකින් මැණිකෙකින් මරාවෙකින් පබළුයෙකින් රංගණකින් රිදියෙකින් නිමියේ නොවෙයි; ඇටින් මසින් නහරින් ලෙහෙයෙන් සැමිදුලෙන් කෙලින් සෙමින් පිතින් වටනින් අසුචියෙන් කෙසින් රෝමයෙන් නියයෙන් දතින් වකුගඩුයෙන් හදවතින් අක්මායෙන් බඩදිවින් දලබුයෙන් අතුණෙන් අතුණුබහනින් පැසුනුඅහරින් නොපැසුනුඅහරින් දූයායෙන් ඩහදියෙන් මෙදතෙලින් කඳුලෙන් සොටුයෙන් හිස්මුලින් මූත්‍රයෙන් නිමියේය.

තව ද මෙම අසුභාරම්මණයනම් පෙණපිඩක් සේ දියබුබුළක් සේ ඉන්ද්‍රජාලයක් සේ සිහිනෙන් දුටුරුවක් සේ මුහුදු රළපෙලක් සේ අස්ථිරය නොසබාය; දුර්ගන්ධයට ආකරය අසුචියට පාත්‍රය මූත්‍රයට භාජනය.

ගඩක් වැන්න පොළක් වැන්න රෝගයක් වැන්න ඇවිදිනා අසුචිපිඩක් වැන්න.

තෙමේම තමහට සතුරැය තෙමේම නමහට විෂය තෙමේම තමහට ගිනිය; ඇතුළෙහි අසුචි පුරා පිටයින් සිනියම් කළ කලයක් වැන්නේය: දවසක් නොනැව දවසක් නොඉ

---

නාප්‍රකාර අශුචියෙන් පිරිසිටි මෙම ශරීරය නුවනින් කල්පනා කරන්නේය; ඒ කෙසේද ? මේ ශරීරයෙහි හිස වසාසිටි සමෙහි වියතක් පමණ වැදීතිබෙන කෙශයෝ ඇත්තාහ;—පෙ—මූත්‍ර ඇත්තාහ. b. යම්සේ ඇල් වී මුං මෑ තල සහල් යනා මේ නානාප්‍රකාර ධාන්‍යයෙන් පූරවනලද උඩ යට දෙදියාවෙහි මුඛ දෙකක් ඇති මූතොලි නම් පසුම්බියක් ඇස් ඇති පුරුෂයෙක් මුදා මේ ඇල්ය මේ වීය මේ මු ය මේ මෑය මේ තලය මේ සහල්යයි ප්‍රත්‍යවෙක්‍ෂා කෙරේ ද ? එපරිද්දෙන් ම යොගාවචර මහණ තෙම පාදතලයෙන් උඩ කෙශමස්තකයෙන් යට සම හාත්පසින් කෙලවර කොට ඇති නානාප්‍රකාර අසුචියෙන් පිරිසිටි මෙම ශරීරය ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි—ඉපෙ—

---

b පිළිකුල් සත්තය බලනු.

ලූව දවසක් දත නොමැද්ද පැයක් බුලත් නොකෑව * තෙමේ තමහට අසූචිවළක් සේ වැටහෙන්නේය.

තව ද මෙම අසුභාරම්මණය නම් කන්හි කාරදුලෙසින් සිටි අසුචිය ඇස්හි මඩලෙසින් සිටි අසුචිය නාසායෙහි සොටු ලෙසින් සිටි අසුචිය දත්හි මැලි ලෙසින් සිටි අසුචිය වටන්හි මූත්‍රලෙසින් සිටි අසුචිය වසන්හි මලලෙසින් සිටි අසුචිය යන මේ අසුචියෙන් අතුරක් නැත්තේය.

තව ද මෙම අසුභාරම්මණය නම් රෝගයට ආකරය සෝකයට ආකරය භයට ආකරය උපද්‍රවයට ආකරය අද නස්සී සෙට නස්සී යන නියමයක් නැත්තේය

තව ද මෙම අසුභාරම්මණය නම් ආදි මහාරෞරවනරක යෙහි වැස විඳිනා නොයෙක් දුකට කාරණව සිටියේය සො රවූ ජරාදුකට පිහිට ව සිටියේය මරනු මුයෙහි ගේ විඳිනා මර ණදුකට පිහිට ව සිටියේය; තමාගේ පිළිකුල් තමාම ඉවසා ගත නොහැකි දුර්ගන්ධ ඇත්තේය මිල එකදවසකුදු නෙයී ලැග්න ලැගිනෙය අමුයොනොනස් සේ කරණ පිළිකුලට නිධාන ව සිටියේය.

තව ද මෙම අසුභාරම්මණය නම් නොහත හැක්ක නො දිය හැක්ක නොසිතිය හැක්ක එසේ වූ මේ ශරීරසඞ්ඛ්‍යාත අශුභය හා සමග පවත්නා සිත්මුත් අනික් ආත්මාදි කිසිවෙ ක් නැත්තේය බැලූබැලූසේ අසාරය සිතුසිතූසේ පිළිකුල නු වනනැතියවුන්ට යහපත් ව වැටහෙන්නේය; බුදුඇසිනුදු සර්වප්‍රකාරයෙන් බලා ශුභ යයි කියා හෝ සාර යයි කියා හෝ ගන්නට නිසි කිසිවෙක් නැත්තේය යනාදී මෙහැම් අශුභවශයෙන්ද.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත කේශාදි අශුභධර්මයන් අධිකතර ප්‍රයොජනවශයෙන් බලන යෝගීනු විසින්.

ආදානනික්ඛපනතො වයොවුඩ්ඪත්ථගාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති.

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො.

තව ද මේ රූපස්කන්ධසංඛ්‍යාත කෙශාදිඅශුභධර්මයන් අශුභවශයෙන් බලන්නාහට කායසම්බන්ධරූපයෝ මිරිඟු දශීනයෙහි වෙහෙසීගිය ශ්‍රාන්තමෘගයක්හු සෙයින් අශුභාදි චිත්ත වැටහෙන්නාහුයයි සේයි.

තව ද මෙම රූපස්කන්ධසංඛ්‍යාතකෙශාදි අශුභධර්මයන් ධ්‍යානාලම්බනප්‍රතිවශයෙන් බලනයොගීහු විසින්,

> යථාපි පුප්ඵිතං දිස්වා සිඟාලො කිංසුකං වනෙ,
> මංසරුක්ඛො මයා ලද්ධො ඉති ගන්ත්වාන වෙගසා.
>
> පතිතං පතිතං පුප්ඵං ඩසිත්වා අතිලොලුපො,
> නයිදං මංසං අදුං මංසං යං රුක්ඛස්මිංති ගණ්හති.
>
> කොට්ඨාසං පතිතංයෙව අසුභන්ති තථා බුධො,
> අග්ගහෙත්වාන ගණ්හාති සරීරට්ඨම්පි තං තථා. (1)
>
> තස්මා පස්සෙය්‍ය මෙධාවී ජීවතො වා මතස්ස වා,
> සභාවං පූතිකායස්ස සුභභාවෙන වජ්ජිතං. (2)
>
> සුභාදිසඤ්ඤිනො දෙහෙ සලභාව හුතාසනෙ,
> මොහෙන පටිපජ්ජන්තා සොචන්ති සුචිරං කලී. (3)

---

1 යම්සේ සිවලා වෙනෙහි පිපුනු කැලගස දැක මාවිසින් මාංශවෘක්ෂයක් ලබනලද්දේ යයි වෙගයෙන් ගොස් ඉතා ලොල්වූයේ හුනු හුනු මල් ඩැහැබලා මේ මාංශ නොවෙයි යමක් ගසෙහි තිබේ නම් ඒ මාංශයයි සලකාගෙණ ගසමුල උඩ බලාගෙණ හුන්නේ ද එපරිද්දෙන් අඥානසත්වයා ශරීරයෙහි තිබෙන දෙය ශුභය ශරීරයෙන් හුනු කොටස් ම අශුභ යයි ගණී ප්‍රාඥ තෙමේ එසේ නොගෙණ ශරීරයෙන් හුනුකොටස අශුභය ශරීරස්ථ වූ ම ඒ කොටසත් එසේ ම අශුභ යයි ගන්නේය.

2 එහෙයින් ප්‍රාඥතෙමේ ජීවත්වන්නාහුගේ හෝ මලාහුගේ හෝ කුණුශරීරයෙහි ශුභත්වයෙන් තොරවූ ස්වභාවය බලන්නේය.

3 ගින්නෙහි ඇලුම් කළ පලහැටියන් මෙන් ශරීරයෙහි ශුභසුඛාදි සංඥා ඇති ව මොහයෙන් පිළිපදනා බාලජනයෝ බොහෝ කලක් සොක කෙරෙත්.

ඉමං හි සුභතො කායං ගහෙත්වා තත්ථ මුච්ඡිතා,
බාලා කරොන්තා පාපානි දුක්ඛා න පරිමුච්චරෙ. (1)

අජ්ඣිඤ්ඤං ජ ඤ්ඤසඞ්ඛාතං අසුභං සුභසම්මතං,
නානාකුණපපරිපූරං ජඤ්ඤරූපං අපස්සතො. (2)

ධිරත්ථු මං ආතුරං පූතිකායං
ජෙගුච්ඡියං අසුභං ව්‍යාධිධම්මං,
යත්ථප්පමත්තා අධිමුච්ඡිතා පජා
හාපෙන්ති මග්ගං සුගතූපපත්තියා. (3)

නහාරුචම්මෙහි සමානවත්ථිතෙ
මනොතිලාපායුතුසම්පවත්තිතෙ,
ජරාරුජාමච්චුමලාදිදූරිතෙ
කිමෙත්ථ ගය්හං සුභතො ච සාරතො. (4)

---

1. මේ ශරීරය ශුභවශයෙන් ගෙණ එහි මූර්ඡාවට පත් ව පව් කරණ බාලජනයෝ දුකින් නොමිදෙන්නාහ.

2. පවිත්‍ර නුවූ මේ ශරීරය පවිත්‍ර යයි අඥානයන් විසින් කියනලද්දේය සුචි නොවූ මේ ශරීරය සුචියයි අඥානයන් කෙරෙහි ප්‍රසිඞ්ධ නොයෙක් කුණපයෙන් පරිපූර්ණ වූ මේ ශරීරය නුවනැසින් නො බලන්නාහට පවිත්‍රස්වරූපයෙකි ප විත්‍රාකාරයෙන් වැටහෙන්නේය.

3. යම් ශරීරයෙක්හි නොලශමූර්ඡාවෙන් අතිශයින් මූර්ඡාවට පත් වූ සත්වයෝ ස්වර්ගයෙහි උත්පත්තියට මාර්ගය පිරිහෙලද්ද හෙවත් ස්වර්ගලොකමාර්ගය හැර අපායමාර්ගයට යෙද්ද එසේ වූ සතතයෙන් ආතුර වූ පිළිකුල් වූ අපවිත්‍ර වූ ව්‍යාධිස්වභාව වූ මේ කුණපශරීරයට නින්‍දා වේවා.

4. නවසියයක් නහර්න් හා සමින් හාත්පසින් වෙලෙන ලද චිත්තය වාතය ආපය ජීවිතෙන්‍ද්‍රියය කර්මජතෙජෝධාතුය යන මොවුන් විසින් පවත්වනලද ජරාව්‍යාධිමරණින් හා මූත්‍රපුරීෂාදි අශුචියෙන් පිරුණ වූ මේ ශරීයෙහි පවිත්‍ර වශයෙන් හෝ සාරවශයෙන් හෝ ගතහැකි දේයක් නම් කුමක්ද ?

එවං අනිච්චං වතිදං සරීරං
සදාසුභං කෙවලදුක්ඛපිණ්ඩං,
අලෙනමාදීනවමත්තසුඤ්ඤං
පහාය තං සිද්ධිමුපෙන්ති සන්තො. (1)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො - පෙ -
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිවං.

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතාසතීති.

මොවුන් අශුභාදින්ගේ වශයෙන් බලනපරිදි මෙසේ ද තයුතු.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත කෙශාදිද්වාත්‍රිංශද්ධර්මයන් වර්ණසංස්ථානාදීන් පිළිකුල්වශයෙන් පස්පස්පරිද්දෙකින් බලන පරිදි කිසේයත්?

ඉමස්මිං කායෙ කෙසාපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලා හොන්ති — ඉමස්මිං කායෙ ලොමාපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලා හොන්ති — ඉමස්මිං කායෙ නඛාපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලා හොන්ති — ඉමස්මිං කායෙ දන්තාපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලා හොන්ති — ඉමස්මිං කායෙ තචොපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලො හොති — ඉමස්මිං කායෙ මංසම්පි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලං හොති — ඉමස්මිං කායෙ නහාරූපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලා හොන්ති — ඉමස්මිං කායෙ අට්ඨීපි වණ්ණසණ්ඨානගන්ධආසයඔකාසවසෙන පඤ්චධා පටිකූලා හොන්ති — ඉමස්මිං

---

1. මේ ශරීරය ඒකාන්තයෙන් මෙසේ අනිත්‍යය හැමකල්හි අශුභය හුදෙක් දුක්පිණ්ඩය සැකවීමට ස්ථානනු වූ ආදීනව වූ ආත්මශූන්‍ය වූ ඒ ශරීරය ඡන්දරාගප්‍රහාණියෙන් පහ කොට සත්පුරුෂයෝ නිර්වාණයට පැමිණෙත්.

කායෙ අට්ඨිමිඤ්ජාපි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙ
න පඤ්චධා පටික්කූලා හොන්ති — ඉමස්මිං කායෙ වක්ක
ම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටි
ක්කූලං හොති — ඉමස්මිං කායෙ හදයම්පි වණ්ණසණ්ඨා
නගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූලං හොති —
ඉමස්මිං කායෙ යකනම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔකා
සවසෙන පඤ්චධා පටික්කූලං හොති — ඉමස්මිං කායෙ කි
ලොමකම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්ච
ධා පටික්කූලං හොති — ඉමස්මිං කායෙ පිහකම්පි ව
ණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූ
ලං හොති — ඉමස්මිං කායෙ පප්ඵාසම්පි වණ්ණසණ්ඨා
නගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූලං හොති — ඉ
මස්මිං කායෙ අන්තම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාස
වසෙන පඤ්චධා පටික්කූලං හොති — ඉමස්මිං කායෙ අ
න්තගුණම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්ච
ධා පටික්කූලං හොති — ඉමස්මිං කායෙ උදරියම්පි ව
ණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූලං
හොති — ඉමස්මිං කායෙ කරීසම්පි වණ්ණසණ්ඨානගන්
ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූලං හොති — ඉම
ස්මිං කායෙ මත්ථලුඞ්ගම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔ
කාසවසෙන පඤ්චධා පටික්කූල හොති — ඉමස්මිං කායෙ
පිත්තම්පි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්ච
ධා පටික්කූලං හොති — ඉමස්මිං කායෙ සෙම්හම්පි ව
ණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූ
ලො හොති — ඉමස්මිං කායෙ පුබ්බොපි වණ්ණස
ණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූලො හො
ති — ඉමස්මිං කායෙ ලොහිතම්පි වණ්ණසණ්ඨාන
ගන්ධාසයඔකාසවසෙන පඤ්චධා පටික්කූලං හොති — ඉ
මස්මිං කායෙ සෙදොපි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාස
වසෙන පඤ්චධා පටික්කූලො හොති — ඉමස්මිං කායෙ මෙ
දොපි වණ්ණසණ්ඨානගන්ධාසයඔකාසවසෙන පඤ්චධා
පටික්කූලො හොති — ඉමස්මිං කායෙ අස්සුපි වණ්ණස
ණ්ඨානගන්ධාසඔකාසවසෙන පඤ්චධා පටික්කූලා හො-

නහි — ඉමස්මිං කායෙ වසාපි වණ්ණසණ්ඨානගන්ධාසයොකාසවසෙන පඤ්චධා පටික්කූලා හොති — ඉමස්මිං කායෙ ඛෙලොපි වණ්ණසණ්ඨානගන්ධාසයොකාසවසෙන පඤ්චධා පටික්කූලො හොති — ඉමස්මිං කායෙ සිංඝාණිකාපි වණ්ණසණ්ඨානගන්ධාසයොකාසවසෙන පඤ්චධා පටික්කූලා හොති — ඉමස්මිං කායෙ ලසිකාපි වණ්ණසණ්ඨානගන්ධාසයොකාසවසෙන පඤ්චධා පටික්කූලා හොති — ඉමස්මිං කායෙ මුත්තම්පි වණ්ණසණ්ඨානගන්ධාසයොකාසවසෙන පඤ්චධා පටික්කූලං හොති.

යනාදී පිළිකුල් වශයෙන්ද; තව ද මෙම පිළිකුල්හි මේ දෙතිස් පිළිකුල්කොටස්හුම; මුසු යයි සලකනලද උඳුමුසු බොජුනක් සෙයින් වණ්ණවිසින් පිළිකුල්හු; මිග වැරුද නො සකස්තැන් වන්නාක්හු ඇක්මුණුකලල්දියක් මෙන් සටහන් විසින් පිළිකුල්හු; පියන්උගුළුවූ පිරුණු වැසිකිළියක් සෙයින් ගඳවිසින් පිළිකුල්හු; ගම්දොර උපන් තුවරකුහුරක් සෙයින් ඇසිරුවිසින් පිළිකුල්හු; නොසකස්මතෙනි හි දුනු පුසක් සෙයින් ඔවස්විසින් පිළිකුල්හු; මේ දෙතිස් පිළිකුල්හු.

මෙදෙතිස් පිළිකුල් කොටස් මිස අන්කිසි සිරුරෙක් නැත්; මෙසිරුරු නිසා වැටෙන සිත් මිස අන් කිසි සිතකුදු නැත්; ලොවැසි වනාහි මමය මාගේය යන ගහණෙහි සිට මෙකොටස් රැස්හි ශුභයයි යන විපරීතසංඥාවට පැමිණෙයි; මෙසිරුරෙන් නොරව හුනු කුනු වනාහි නෙමේම තමහට පිළිකුල; මෙසිරුර ඇසිරුකෙළේ වනාහි කුනුයෙහි තුබූ කුනුය ඉති බැවින් මෙසිරුරු වෙශසසින් ම පිළිකුල; නොසිසඳනෙක් හි හුනු පිළිකුල්සෙයින් තමා නොමනාවතුදු උපන් තැන් වනාහි මැනැවෙක් වතුදු නොවනාමය; මෙම සිරුරු වනාහි අතිපිළිකුල්සෙයට අසුචිමහනිරයක් බඳුය; සැඩොල්සෙයට සංඝාත මහනිරයක් බඳුය; ඇඳිරිසෙයට ලොඇඳිරිමහනිරයක් බඳුය යනාදී නොයෙක් පිළිකුල්වශයෙන් ද,

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත ප්‍රතිකූලධර්මයන් අධිකතරප්‍රයොජනවශයෙන් බලන යොගීහු විසින්,

ආදීනවනිස්සරණතො වයොවුඩ්ඪගාමිතො
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්තවිත්ථාරෙන විපස්සති.

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති සම්මාධම්මං විපස්සතො.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත ප්‍රතිකූලධර්‍මයන් ප්‍රතිකූලවශයෙන් පස්පස්පරිද්දෙකින් බලන්නහට කායස ම්මතරූපයෝ ගවරවලෙක්හි හුනු ස්වර්ණහංසයක්හු සෙයින් පරිමුක්තිය ම උතුම් කොට වර්‍ණසංස්ථානාදි පිළිකුල් විසින් වැටහෙන්නාහු යයි සේයි.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත ප්‍රතිකූලධර්‍මයන් ධර්‍ම, ලබ්ධප්‍රීතිවශයෙන් බලන යොගීහු විසින්,

වණ්ණසණ්ඨානගන්ධෙහි ආසයොකාසතො තථා,
පටිකකූලානි කායෙ මෙ කුණපානි විසොළස. (1)

පතිතම්හා (පි) කුණපා ජෙගුච්ජිතං කායනිස්සිතං,
ආධාරෙ හි සුචී තස්ස කායෙ තු කුණපෙ ඨිතං. (2)

මීළ්හෙ කිමිව කායොයං අසුචිම්හි සමුට්ඨිතො,
අන්තො අසුචිසම්පුණ්ණො පුණ්ණවච්චකුටි විය. (3)

---

1, මාගේ ව්‍යාමමාත්‍ර වූ ශරීරයෙහි කෙශාදි දෙතිස් කුණපකොට්ඨාසයෝ වර්‍ණය සටහනය ගන්ධය ආශ්‍රයය අවකාශය යන මොවුන්ගේ වශයෙන් පිළිකුල්හ.

2, ශරීරයෙන් මුක්ත ව වැහුනු මලමූත්‍රාදිකුණපයට වඩා ශරීර නිශ්‍රිත වූ මලමූත්‍රාදි කුණපය ම පිළිකුල් කටයුතුයි, ඒ එසේමැයි-ඒ ශරීරයෙන් මුක්ත වූ කුණපයාගේ භූම්‍යාදි ආධාරය වනාහි පිරිසිදුය ශරීරස්ථකුණපය චර්‍මමාංසාදි කුණපයෙහි ම පිහිටියේය එහෙයින් ම පිළිකුලුයි.

3, අසුචියෙහි උපන් පණුවෙකු මෙන් මේ ශරීරය මව්කුසෙහි වූ අසුචියෙහි උපන්නේය, පිරුණු වැසිකිළියක් මෙන් ඇතුළත පිත් සෙම් ආදි අසුචියෙන් පිරුණේය.

අසුචි සන්දනෙ නිච්චං යථා මෙදකථාලිකා,
නානාකිමිකුලාවාසො පක්කචන්දනිකා විය. (1)

ගන්ධභූතො රොගභූතො වණ්ණභූතො සමුස්සයො,
අතෙකිච්ඡොතිජෙගුච්ඡො පභින්නකුණ්ඩූපමො. (2)

සභාවෙන පටික්කූලො විරූපොසුචිසම්භවො,
බහිසම්භාරසංයුත්තො හොති රාගස්ස කාරණං. (3)

අතිජෙගුච්ඡියං හොති එකාහම්පි අජග්ගිතං,
තථාපි තණ්හා සම්මොහා රාගො හොති සරාගිනං.(4)

දිපාදකොයං චරති ගූථපිණ්ඩා මහාජනං,
දූසෙන්තො අසුචිං නිච්චං පග්ඝරන්තො තතො තතො (5)

සදයං මක්ඛිතො චාපි අසුචිං න ජහෙස්සති,
සුනහාතානුලිත්තොපි වරාහො අසුචිං යථා, (6)

---

1. මේදතෙල් පිරුණු සිල්ව යන භාජනයක් මෙන් සතතයෙන් අසුචි වැහෙන්නේය, ග්‍රීෂ්මකාලයෙහි පැසුනු ගවර වළක් මෙන් නොයෙක් කෘමිකුලන්ට ගෙයකි.

2. මේ ශරීරය පැසුනු ගඬක් වැන්නේය පිළියම් නොකට හැකි රෝගයක් වැන්නේය නාඩිව්‍රණයක් වැන්නේය පිළියම් කොට සුව නොකට හැක්කේය නුවනැත්තන් විසින් අතිශයින් පිළිකුල් කටයුත්තේය නොයෙක් දිසාවෙන් සිල් වගිය මිනීකුණපයක් වැන්නේය.

3. ස්වභාවයෙන් පිළිකුල්වූ විරූපවූ අශුචිරාශිය වස්ත්‍රාදකාදි බාහ්‍යසම්භාරයෙන් යුක්තවූයේ රාගයට හෙතුවන්නේයි

4. එක දවසකුදු පිරිසිදු නොකරණලද්දේ ඉතා පිළිකුල් කටයුතු වන්නේය එසේ වි නමුත් මොහය හෙතු කොට ගෙණ රාගසහිත සත්වයන්ට එහි ඇලුම වන්නේය.

5. දෙපයක් ඇති මේ ශරීර නැමැති අසූචි පිඩ නිතර ඒ ඒ දෙරින් අශුචි වගුරමින් මහාජනයා අපිරිසිදු කෙරෙමින් ඇවිදිනේයි

6. යම්සේ ඌරා සකස් කොටනහවා ආලිම්පනය කරණලද්දේත් තමාගේ ඇඟ අසුචිභාවය නොහරණේද එමෙන් මේ ශරීරයත් පිරින් ගොබවනලද්දේ වී නමුත් හැමකල්හි තමාගේ අසුචිභාවය නො හරණේය.

ජගිච්ඡතොපි අයං කායො විසුද්ධත්තං න ගච්ඡති,
ධොතොපි ච ගූථපිණ්ඩො නිම්මලත්තං න පාපුණෙ. (1)

තතො ච නික්ඛන්තමලං තයිං ච
තවෙයන ලිත්තං සකලෙපි දෙහෙ,
බණෙ ච තස්මිං කිමිගුථගන්ධං
දස්වාපි දුක්ඛං පන කො දූසෙසය. (2)

එකාහනික්ඛන්තමලම්පි දෙහා
පහොති ජාදෙතුමසෙසතො තං,
කිමෙව වුත්තං පන මච්චුකාලා
තථාපි දෙහෙ සුචිසඤ්ඤිබාලො. (3)

යො යන්තරූපො විය සාරහීනො
ඵෙණස්ස දෙහො විය දුබ්බලො ච,
අමෙජ්ඣදෙහො විය පූතිකායො
කරෙයන කො තත්ථ රතිං අබාලො. (4)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො —පෙ—

---

1. මේ ශරීරය නිතර පිරිසිදු කරණලද්දේ වී නමුත් පිරිසුදු බවට නො පැමිණේමය, අසුචි පිඩ කෙපමණ සොධනලද්දේ වි නුමුත් එකම අසුචියෙයින් පිරිසිදු බවට නො පැමිණෙන්නේය.

2. ඒ ශරීරයෙන් ම නික්මුනු මූත්‍රකරීෂාදි අශුචි එහිම සියලු ම ශරීරයෙහි ගල්වනලද්දේ වී නම් එකණෙහි ම පනුවන් හා අශුචිගඳ ඇත්තේ දක්නට ද දුක්වන්නේය අනුරාගයෙන් කවරෙක් නම් සපශී කෙරේ ද?

3. ශරීරයෙන් එක දවසක් නික්මුනු අසුචි පවා ඒ ශරීරය නිඃශෙෂයෙන් වසන්නට සෑහෙයි, මරණකාලය දක්වා ශරීරයෙන් ම හුනු අසුචි කියනු කිම, එතකුදු වුවත් අඥනසත්වයා ශරීරයෙහි සුචිය යන සංඥා ඇත්තේයි.

4. යම් ශරීරයක් පිදුරුආදියෙන් කළ යන්ත්‍රරූපයක් මෙන් සාරයක් නැත්තේ ද පෙණින් කළ ශරීරයක් මෙන් දුර්වල ද අශුචියෙන් කළ ශරීරයක් මෙන් අපවිත්‍ර ද නුවනැති කවරෙක් නම් ඒ ශරීරයෙහි ඇලුම් කරන්නේ ද?

නිද්දරෙ හොති නිප්පාපො ධම්මපීතිරසං පිපං·
සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතාසතීති·

මොවුන් වර්ණසණ්ඨානාදි පිළිකුල් වශයෙන් පස්පස් පරිද්දෙකින් බලනපරිදි මෙසේ දතයුතු·

තව ද මේ රූපස්කන්ධසඞ්ඛ්‍යාත කෙශාදිද්වාත්‍රිංශත්කොට්ඨාසයන් වර්ණසංස්ථානාදීන්ගේ වශයෙන් සත්සත් පරිද්දෙකින් බලනපරිදි කිසේයත්?

ඉමස්මිං කායෙ කෙසාපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ ලොමාපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ නඛාපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ දන්තාපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ තචොපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධො හොති — ඉමස්මිං කායෙ මංසම්පි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධං හොති — ඉමස්මිං කායෙ නහාරූපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ අට්ඨීපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ අට්ඨිමිඤ්ජාපි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධා හොන්ති — ඉමස්මිං කායෙ වක්කම්පි වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධං හොති — ඉමස්මිං කායෙ හදයම්පි — පෙ — ඉමස්මිං කායෙ යකනම්පි — පෙ — ඉමස්මිං කායෙ කිලොමකම්පි — පෙ — ඉමස්මිං කායෙ පිහකම්පි — පෙ — ඉමස්මිං කායෙ පප්ඵාසම්පි — පෙ — ඉමස්මිං කායෙ අන්තම්පි — පෙ — ඉමස්මිං කායෙ අන්තගුණම්පි — පෙ — ඉමස්මිං කායෙ උදරියම්පි

— පෙ — ඉමස්මිං කායෙ කරීසම්පි — පෙ — ඉමස්මිං කායෙ මත්ථලුඞ්ගම්පි — පෙ — ඉමස්මිං කායෙ පිත්තම්පි — පෙ — ඉමස්මිං කායෙ සෙම්හම්පි — පෙ — ඉමස්මිං කායෙ පුබ්බම්පි — පෙ — ඉමස්මිං කායෙ ලොහිතම්පි — පෙ — ඉමස්මිං කායෙ සෙදම්පි — පෙ — ඉමස්මිං කායෙ මෙදම්පි — පෙ — ඉමස්මිං කායෙ අස්සුම්පි — පෙ — ඉමස්මිං කායෙ වසාපි — පෙ — ඉමස්මිං කායෙ ඛෙළොපි — පෙ — ඉමස්මිං කායෙ සිංඝාණිකාපි — පෙ — ඉමස්මිං කායෙ ලසිකාපි — පෙ — ඉමස්මිං කායෙ මුත්තම්පි වණ්ණසණ්ඨාන දිසාවකාසපරිච්ඡෙදසභාගවිසභාගවසෙන සත්තවිධං හොති-යනාදීන් සත්සත්ප්‍රකාරවශයෙන් ද.

තව ද මෙම වර්ණාදිසප්තකයෙහි; මේ ශරීරය නම් දුටුවන් ප්‍රිය කරවන්නාවූ කැවත් නසන්නාවූ කිළිච්ලයක් සෙයින් වර්ණවිසින් සිටියේය, කලල්මඩෙහි පියවරසටහනක් සෙයින් සටහන්විසින් සිටියේය, දිසාවිසින් පෙකණියෙන් මතු උඩදිසාවය පලලු යටදිසාවය, ඔකාසවිසින් මූලාලකලසෙයින් කෙසග අගසින් අනන්තාවකාශයෙහි සිටියේය, පරිච්ඡෙදවිසින් දෙතිස්කොටසෙක් වන්නේය, සභාගවිසින් එක එක ම කොටසක් සත්සත්පරිද්දෙකින් යුක්ත වන්නේය, විසභාගවිසින් කෙශය රොමයයනාදි වෙනවෙන ම නාමව්‍යවහාරයට ගියේය, යනාදීන් වර්ණසණ්ඨානාදි සත්සත්ප්‍රකාරවශයෙන් ද.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතව ර්ණාදිසප්තකධර්මයන් අභ්‍යන්තරප්‍රයොජන වශයෙන් බලන යොගීහු විසින්,

ආදානනික්ඛෙපනතො වයොවුද්ධත්ථගාමිතො
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති.

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත වර්ණාදි සප්තකධර්මයන් වර්ණසණ්ඨානාදීන්ගේ වශයෙන් සත්සත්පරිද්දෙන්

බලන්නාහට කායසඞ්ඛ්‍යාතරූපයෝ වර්ණසංස්ථානාදිවිසින් ගවයන් හැඳින ගවයන් රක්‍ෂා කරන්නාවූ ගොපල්ලක්හු සෙයින් වර්ණසංස්ථානාදී විසින් වැටහෙන්නාහුයයි සේයි.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත වර්ණාදිසප්තකධර්ම, යන් ධර්මාලම්බනප්‍රීති වශයෙන් බලන යෝගීහු විසින්.

ජීවවණ්ණාතිණ්ණච්ඡන්නපපාතො අන්ධපාණිනං,
වණ්ණාමිසපරිච්ඡන්නබලිසං බාලුදකායුතං. (1)

පසාරිතවයං ජලං කායො සනාගිමහාපථෙ,
ඔඩ්ඩිතං මාරලුද්දෙහි දිපාදකම්ජාලං. (2)

නගරං මොහරාජස්ස තණ්හාලොලමහෙසිනො,
බලිං මච්චුපිසාචස්ස දෙහො කිම්පිලම්හිරිතො. (3)

ගන්ධාසයොකාසවිරූපවණ්ණ
සණ්ඨානතො භෙදිතාසුචිරාසිං,
විජානති සබ්බං විචරන්තමෙතං
සමන්නාති මඤ්ඤන්ති කලිධ මොහා. (4)

---

1. අන්ධජනයන්ගේ පතනයට ජීවවර්ණ නැමැති තෘණයෙන් වැසෙනලද ගැඹුරු ප්‍රපාතයකි බාලජන නැමැති මත්ස්‍යයන්ට වර්ණ නැමැති ආමිසයෙන් වැසුනු බිලියකි.

2. මේ ශරීරය නිවන් යන මහවත අහුරා බඳනාලද දැලකි කර්මක්ලේශ නැමැති වැද්දන් විසින් අටවනලද දෙපාළුදැලෙකි.

3. මේ ශරීරය නම් තෘෂ්ණා නැමැති ලොල්වූ මෙහෙසිය ඇති මොහ නැමැති රජහුගේ නුවරෙකැයි මරණ නැමැති ප්‍රේතයාට බිලියෙකැයි කිම්පලයෙකැයි ද කියනලදී. (කිම්පල නම් අඹඅසහා සදෘශවූ ගස්හි අඹ වැනි වර්ණ ගන්ධ රස හා සටහන් ඇති ඵලජාතියකි කැකල්හි කත්ක්‍ෂණයෙහි ම ජීවිතක්‍ෂය වේ)

4. දුර්ගන්ධය ආශ්‍රය අවකාසය විරූපවර්ණය සටහනය යන මොවුන්ගේ වශයෙන් ප්‍රභෙදගත වූ මේ අශුචිරාශිය සිත හා ඒකාබද්ධ ව ඇවිදිනා දැක මේ ලොකයෙහි බාලජනයෝ මොහයෙන් සත්වයෙක ස්ත්‍රියෙක පුරුෂයෙකැයි සිතත්.

එවං අනිච්චං අසුචිං අසාරං
දුග්ගන්ධියං ආතුරං ව්‍යාධිධම්මං,
ධුවස්සවං දුක්ඛමහාවනද්ධං
පලොකමාරාමිසමිළ්හගබ්භං. (1)

අලෙනමාදීනවපුණ්ණසල්ලං
ජෙගුච්ඡියං තාණ සුනිබ්බිසොටං,
අතප්පියං සබ්බභයස්ස මූලං
කිම්මාලයං දුක්ඛිතමස්සිරිකං,
පස්ස ඉමං යොනිසො භික්ඛු කායං
නිබ්බින්දයෙතම්හි පහාය ඡන්දං. (2)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො—පෙ—
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිපං.
සුප්පබුද්ධංපබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතාසතීති.

මොවුන් වර්ණසංස්ථාදීන්ගේ වශයෙන් සත්සත්පරිද්දෙකින් බලනපරිදි මෙසේ දතයුතු.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත අනුලොමිකප්‍රතිලොමික ධර්මයන් අනුලොමප්‍රතිලොම වශයෙන් බලනපරිදි කිසේයයත් ?

කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අ

---

1. මහණ ? මෙසේ අනිත්‍ය වූ අපවිත්‍ර වූ අසාර වූ දෞර්ගන්ධ්‍ය වූ සතතයෙන් ආතුර වූ ව්‍යාධිස්වභාව ඇති නිතර අපවිත්‍ර වහනය කරන්නා වූ කුණපසමින් වෙළඳනාලද ව්‍යාධි ජරා මරණයන්ගෙන් පළඳුවන මාරයාට යොදුරු වූ අශුචිගර්භ වූ,

2. සැඟවීමට නුසුදුසු වූ කෘපණ වූ ආදීනවශූන්‍ය වූ උලක් වැනි වූ පිළිකුල්කටයුතු වූ රක්නට නො හැකි වූ අතිශයින් පිරිසිදු නොකටහැකි වූ නොපිණිවියහැකි වූ සියලු භයට මූල් වූ පණුගුලක් බඳු වූ නොයෙක් දුකින් යුක්ත වූ නිශ්‍රීක වූ මේ ශරීරය නුවනින්බලව මෙහි ඡන්දය පහ කොට සලකිරෙව.

න්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙලො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං — මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙලො වසා අස්සු මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරූ මංසං තචො දන්තා නඛා ලොමා කෙසා.

කෙසා ලොමා නඛා දන්තා තචො—පෙ—උදරියං කරීසං මත්ථලුඞ්ගං — මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරූ මංසං තචො දන්තා නඛා ලොමා කෙසා.

කෙසා ලොමා නඛා දන්තා තචො—පෙ—සිඞ්ඝාණිකා ලසිකා මුත්තං — මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙලො වසා අස්සු මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං — පිත්තං සෙම්හං—පෙ—සිඞ්ඝාණිකා ලසිකා මුත්තං,

මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙලො වසා අස්සු මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරූ මංසං තචො දන්තා නඛා ලොමා කෙසා.

කෙසා ලොමා නඛා දන්තා තචො; තචො දන්තා නඛා ලොමා කෙසා; කෙසා ලොමා නඛා දන්තා තචො. 1.

මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං; වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරූ මංසං; මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං. 2.

හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං; පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං; හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං. 3.

අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං; මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං; අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං. 4.

පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො; මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං; පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො. 5.

අස්සු වසා ඛෙළො සිංඝාණිකා ලසිකා මුත්තං; මුත්තං ලසිකා සිංඝාණිකා ඛෙළො වසා අස්සු; අස්සු වසා ඛෙළො සිංඝාණිකා ලසිකා මුත්තං. 6.

මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙළො වසා අස්සු; අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං; මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙළො වසා අස්සු. 7.

මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං; පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො; මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං. 8.

මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං; අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං; මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං. 9.

පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං; හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං; පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං. 10.

වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං; මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං; වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං. 11.

තචො දන්තා නඛා ලොමා කෙසා; කෙසා ලොමා නඛා දන්තා තචො; තචො දන්තා නඛා ලොමා කෙසා. 12.

කෙසා ලොමා නඛා දන්තා තචො—පෙ—සිඞ්ඝාණිකා ලසිකා මුත්තං. 13.

මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙළො වසා අස්සු මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසාති *—යනාදීන් අනුලොමප්‍රතිලොමවශයෙන්ද.

---

* කෙසා ලොමා නඛා දන්තා තචො; තචො දන්තා නඛා ලොමා කෙසා; මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං; වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා; හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං; පප්ඵාසං

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතධර්මයන්ගේ අනුලොම්කප්‍රතිලොම්කක්‍රමය උපමාවශයෙන් බලන යොගීහු විසින් සම්සේ තල්ගස් දෙතිසකින් යුත් තල්උයනෙක්හි ආධාවන පරිධාවනවශයෙන් කොලඟ දිව මෙහෙයී සා ඤ්ඤමඨායා ඇති එක්කොලතුරෙක්හි සැඟවී හුන් ශාඛාමෘගපැටවක්හු සෙයින් චිත්තය වත්තිංසාරම්මණයෙහි අනුලොමප්‍රතිලොම වශයෙන් දුවවමින් වෙහෙසවා සරූප එක් අරමුණෙක්හි එල්බවා අසම්මොහනිද්‍රායෙන් සැතපිහිඳ සරූපපරියායව් පැවැත්වීමෙන් අර්පණා ඉපදවීමෙන් කුසල්දම් වැඩියයුතු-මේ අනුලොමප්‍රතිලොම නම් වේ — මෙසේ උපමාවශයෙන් ද බැලියයුතු.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතඅනුලොමප්‍රතිලොම්කධර්මයන් අධිකතරප්‍රයොජනවශයෙන් බලන යොගීහු විසින්

ආදානනික්ඛෙපණතො වයොවුඩ්ඪත්ථගාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති.

---

පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා; අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං; මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා; පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො; මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා; අස්සු වසා ඛෙලො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං; මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙලො වසා අස්සු මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා — මේ විශුද්ධිමාර්ගයෙහි දක්වනලද ක්‍රමයයි- මේ ප්‍රකරණයෙහි යොදනලද ක්‍රමය ඊට වෙනසියි.

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතධර්මයන් අනුලෝමප්‍රතිලෝමවශයෙන් බොහෝ කොට බලන්නහට කාශ්‍යපස්ථවිර පාදයෝ පලාලපුඤ්ජයක් සෙයින් අමූලාග්‍රව වැටහෙන්නාහු යයි සේයි.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාතධර්මයන් අනුලෝමප්‍රතිලෝමවශයෙන් බොහෝ කොට බිණීමෙහි ආත්සංසධර්මා ලබනප්‍රීතිවශයෙන් බලන යෝගීහුවිසින්.

සහස්සමපි චෙ වාචා අනත්ථපදසංහිතා,
එකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. (1)

සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා,
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. (2)

යො ච ගාථාසතං භාසෙ අනත්ථපදසංහිතා,
එකං ධම්මපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. (3)

---

1. නිර්වාණප්‍රකාශ නොවූ ආකාශවර්ණනා පර්වතවර්ණනා වනවර්ණනා පුරවර්ණනාදි අනර්ථපදයෙන් යුක්තවූ නොහොත් අවැඩ කොටසින් යුක්ත වූ වචන දහසෙක් වූ නමුත් ඔහු උත්තම නොවෙති, පඤ්චස්කන්ධ ද්වාදශායතනාදි වූ යම් එක අර්ථපදයකුදු අසා පුද්ගලයා රාගාදික්ලේශව්‍යුපසමයෙන් සන්සිඳේද එසේ වූ නිර්වාණ ප්‍රතිසංයුක්ත ස්කන්ධධාත්වායතනාදීන් ප්‍රකාශකරන්නා වූ අර්ථසාධක එක පදයකුදු උත්තමයි,

2. එසේ වූ–පෙ–එකගාථාපදයෙකුදු උත්තමයි.

3. යම් පුද්ගලයෙක් ආකාශවර්ණනාදි අනර්ථපදයෙන් යුක්ත වූ නොහොත් අවැඩ කොටසින් යුක්ත වූ ගාථා සීයක් කියේ නමුදු ඒ ගාථාවෝ උත්තම නොවෙති, යම් එක ධර්මපදයකුදු අසා ක්ලේශව්‍යුපසමයෙන් සන්සිඳේද එසේ වූ අර්ථසාධක වූ එක ධර්මපදයකුදු උත්තමයි.

බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො,
ගොපොව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති. (1)
අප්පම්පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී,
රාගං ච දොසං ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්තචිත්තො,
අනුපාදියානො ඉධ වා හුරං වා
සභාගවා සාමඤ්ඤස්ස හොති. (2)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො,
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රූහයෙ.

උපසන්තො උපරතො මන්තභාණී අනුද්ධතො,
ධුනාති පාපකෙ ධම්මෙ දුමපත්තංව මාලුතො.

පවිවෙකස්ස තුරියස්ස න රති හොති තාදිසී,
යථා එකග්ගචිත්තස්ස සම්මාධම්මං විපස්සතො.

---

1. ප්‍රමත්ත පුද්ගලයා ත්‍රිපිටකබුද්ධවචනය බොහෝ කොට කියන්නේ ද නොහොත් බොහෝවූ ද ත්‍රිපිටකබුද්ධවචනය ඉගෙණගෙණ අනුන්ට කියන්නේ වී නමුත් ඒ ධර්මය නො කරන්නේ වී නම් අනුන්ගේ ගෙරි රක්නා ගොපල්ලා මෙන් සතරමග සතරපලයයි කියනලද ශ්‍රාමණ්‍යගුණයට හිමි නොවන්නේයි.

2. ත්‍රිපිටකබුද්ධවචනය ස්වල්පයකුත් ඉගෙණගෙණ අනුන්ට කියන්නා වූ පුද්ගලයා නවලොකොත්තරධර්මයට අනුරූප වූ ශීලපූරණාදිපූර්වභාගප්‍රතිපත්තියෙහි පවත්නා සුදු ඒ නම් රාගද්වෙෂමොහ යන ක්ලෙශයන් ඒ ඒ මාර්ගයට අනුරූපපරිච්ඡෙදයෙන් ප්‍රහාණය කොට පිරිසිඳ දතයුතු ධර්මයන් මනා කොට දන්නා වූ සකලක්ලෙශයන් කෙරෙන් මනා කොට මිදුනු සිත්ඇති මෙලොව පරලොව දෙක්හි පවතිනා අධ්‍යාත්මිකබාහ්‍ය වූ ස්කන්ධධාත්වායතනයන් නිත්‍යාදි වශයෙන් නොගන්නා වූ ඒ මහාක්ෂීණාශ්‍රව වූ චතුර්ථාර්‍යපුද්ගල තෙම ශ්‍රාමණ්‍යගුණයට හිමිවන්නේයි.

පවිවෙකරසං පීත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිපං.

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතාසති.

පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛන්ති. (1)

මෙහි ආදීනවාදිනිද්දේශය ආදිකොට අනුලොමප්‍රතිලො මනිද්දේශය අන්තකොට ඒ ඒ ධර්මයන් තත්තත්ස්වභාව යෙන් යථාක්‍රමයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනාභාවනා සඞ්ග්‍රහයෙහි තුන්වන ආදීනවාදිසඞ්ග්‍රහය නිමි.

---

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් අතුරෙන් රූපස්කන්ධසඞ්ඛ්‍යාතකෙශාදිද්වාත්‍රිංසද්ධර්මයන් ජාත්‍යාදිදුඃඛ ව ශයෙන් නවශිවපිකා අනත කොට බලනපරිදි කිසේද යත්?

ගර්භාවක්‍රාන්තිමූලකදුඃඛය ගර්භපරිහරණමූලකදුඃඛය ග ර්භවිපත්තිමූලකදුඃඛය විජායනමූලකදුඃඛය බහිර්නිෂ්ක්‍රම ණමූලකදුඃඛය ආත්මොපක්‍රමමූලකදුඃඛය පරොපක්‍රමමූල කදුඃඛය දුක්ඛදුක්ඛය විපරිනාමදුක්ඛය සංස්කාරදුඃඛය ප්‍ර ච්ඡන්නදුඃඛය අප්‍රච්ඡන්නදුඃඛය පර්‍යායදුඃඛය නිෂ්පර්‍යාය දුඃඛය ජාතිදුක්ඛය ජරාදුක්ඛය ව්‍යාධිදුක්ඛය මරණදුක්ඛය සොකදුක්ඛය පරිදෙවදුක්ඛය කායිකදුක්ඛය චෛතසිකදුඃ ඛය උපායාසදුඃඛය අප්‍රියසම්ප්‍රයොගදුඃඛය ප්‍රියවිප්‍රයොග දුඃඛය කැමතිදෙයක් නොලැබීමෙන් වන දුක්ඛය සංක්ෂෙ පයෙහින් පඤ්චොපාදානස්කන්ධදුඃඛය යනාදි නොයෙක් දුක්ඛ යන්ගේ වශයෙන්ද.

---

1. ප්‍රමාදයෙහි ද කාමරතියෙහි ද නොයෙදියයුතුයි නො පමාව සමථවිදර්ශනා භාවනාකරණ පුද්ගලයා මහත් වූ නිවන් සුවයට පැමිණෙන්නේයි.

තව ද මෙම ජිනිඳුසබිගෙහි

සො ඝොරරූපං නිරයං උපෙති
සුභාසුභං මුත්තකරීසපූරං,
සත්තා සකායෙ න ජහන්ති ගිද්ධා
යෙ හොන්ති කාමෙසු අවීතරාගා.(1)

මිද්ධී යදා හොති මහග්ඝසො ච
නිද්දායිතා සම්පරිවත්තසායී,
මහාවරාහොව නිවාපපුට්ඨො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො. (2)

යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
ඉදමෙව සෙය්‍යො ඉති මඤ්ඤමානො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො. (3)

---

1. ඒ අන්ධබාලයා සංසාරයෙහි භයපත් වූ යොගාවචර ශුභයන්ට අශුභවූ මූත්‍රකරීෂදෙකින් පිරුණු දරුණු වූ ඝොර රූප ඇති මාතෘකුක්ෂිසඞ්ඛ්‍යාත නිරයට පැමිණෙන්නේය. යම්කෙනෙක් කාමයෙහි අවීතරාගයෝ ද කිලිඝනයෝ ද ඔහු ඒ මාතෘකුක්ෂි සඞ්ඛ්‍යාත ආස්ථානය නො හරිත්.

2. යම්කාලෙක්හි පුරුෂ තෙම ථීනමිද්ධයෙන් මඩනාලැබේ ද පමණ නො දැන බොහෝ කොට කාද කුඩු ආදී ශුකර භක්තයෙන් පොෂ්‍යය කරණලද ස්ථූලශරීරඇති මහගම් ඌරෙකු මෙන් උන්සිටිතැන ම නිදන්නේවේ ද ස්ථූලහෙයින් අනික් ඉරියව්වකින් පවත්නට අසමර්ථව පෙරලි පෙරලි වැදහෝනේ වේ ද එකල්හි ඒ පුරුෂයා අනිත්‍යය දුඃඛය අනාත්මයයි කියනලද ත්‍රිලකුණු මෙනෙහි කරණට අසමර්ථය ත්‍රිලකුණු මෙනෙහි නො කිරීමෙන් ප්‍රඥාවෙන් තොරවූයේ නැවත නැවත මව්කුසට එලඹෙන්නේයි.

3. අභිවෘද්ධිකැමති හිත සිතින් අනුකම්පා කරන්නහුවිසින් අවවාදකරණලබන යමෙක් මෙම උතුමැයි සිතන්නේ අනුශාසනාව නො කෙරේ ද ඒ නුවනමද පුද්ගලයා නැවත නැවත මව්කුසට එලඹෙන්නේයි.

යං චාපි ගූථනරකෙ විය මාතුගබ්භෙ
සණ්ඨානා වයං චිරමතො බහි නික්ඛමඤ්ච,
පප්පොති දුක්ඛමතිඝොරමිදම්පි නත්ථි
ජාතිං විනා ඉතිපි ජාතිරියං හි දුක්ඛාති. (1)

කියනලද මවුකුස්නිරුහි සත්ත්වයා ආමාශයපක්වාශයද්වැතු රෙන් මව උතුනීලේ හා පියාණුකුරුකොටස ඇසුරු කොට ඉපද කුණුමස්ගවරවලෙක්හි උපන් පුලපණුවක්හු සෙයින් දසමසක්මන්තෙහි පිහින්නෙත්හි ගිදෙනලද තල්පලපුවක් සෙයින් දලබුවෙන් වසනලදු ව මවුකුස්හින්නෙන් නිරතුරු ව ඉදෙමින් අගිනු ආඞ්ගකයක්හු අත්හි හුනු සෘපිලවක්හු සෙයින් මවගේ නොසපඉරියව්පෙරලීමෙන් බිලී දුක් විඳ කම්ජ වා පැහැර මහහවූකලකල්හි සිරුරුබිත්වනදුකින් මුත ගොත් පිලිසත්ගඩඇතුලෙහි ඉපද වණමුයෙන් බිහිවූ පුල පණුවක්හු සෙයින් නොයෙක් කුණුගදින් පිරිවැහිගිය කෙසිසිදකින් හදනාලද නාඹඇතක්හු සෙයින් දුගඳ පිළිකුල් දියටනුමගින් ඇතුල ඔවස්නොලදින් බිහිවනකල්හි.

මීළ්හෙන ලිත්තා රුහිරෙන මක්ඛිතා
සෙම්හෙන ලිත්තා උපනික්ඛමන්ති,
යං යං හි කායෙන ඵුසන්ති තාවදෙ
සබ්බං අසාතං දුඛමෙව කෙවලං,
දිස්වා වදම් නහි අඤ්ඤතො සවං
පුබ්බෙනිවාසං බහුකං සරාමීති. (2)

---

1. ගූථනරකය වැනි මව්ගැබ බොහො කලක් වාසය කරන්නා වූ ද එයින් නික්මෙන්නාවූ ද සත්ත්වයා ඉතා දරුණු වූ යම් දුකකට පැමිණේ ද මේ දුක ද ජාතියෙන් වෙන්ව නැත්තේය එහෙයින් ද මේ ජාතිය දුක්වන්නීමය.

2. අසුචින් ලිප්ත වූ රුධිරයෙන් වැකුනා වූ සෙමින් ලිප්ත වූ සත්ත්වයෝ මව්කුසින් නික්මෙන්නාහු ද යමක් යමක් නික් මෙනවේලෙහි ශරීරයෙන් ස්පර්ශ කරනනාහු ද ඒ සියල්ලම එකාන්තයෙන් ම අමධුරය හුදෙක් දුක්මය; ශ්‍රමණබ්‍රාහ්මණාදි වූ අන්‍යයන්හු ගෙන් අසා නොකියමි අනික්කෙනෙකුගෙන් අසා, නොකිය තුඩු වැලි කෙසේදගත්? පෙරවිසූ සඳපි ළීංවෙලයයි කියනලද පූර්වේනිවාසය බොහෝ කොට හෙවත් කල්ලක්‍ෂ යක් අධික කොට ඇති දෙයාසඛ්‍යයක් කප් සිහි කෙරෙමි,

සනාදි දුක්ඛයන්ගේ වශයෙන්ද.
තව ද මෙම ජාතිදුක්ඛයෙහි

එවං සො පාතුභූතොව සත්තොයං මාතුකුච්ඡිතො,
මංසපිණ්ඩකපෙසොව සුඛුමාලසරීරකො. (1)

දීනො නිච්චපරාධීනො වත්ථුභූතො දයාය සො,
අවිධෙය්‍යඞ්ගපච්චඞ්ගො සදා උත්තානසෙය්‍යකො. (2)

අසත්තො පච්චයෙ කිච්චං සුස්සමානසරීරකො,
ඉරියාපථමඤ්ඤං වා අලභං රුචිමත්තනො. (3)

නිච්චාසුචිසමාකිණ්ණො නිච්චරොගී සුදුබ්බලො,
ඉච්ඡිතානිච්ඡිතත්ථාය පරිදෙවපරායණො· (4)

ගච්ඡෙය්‍ය මරණං නො චෙ මහන්තමුපගච්ඡති,
ජීවිතුං විජ්ජමානඤ්චෙ පුඤ්ඤකම්මෙ තදුත්තරිං. (5)

පුඤ්ඤකම්මෙසු නිච්ඡන්දො, හිරොත්තප්පවිවජ්ජිතො,
කිච්චාකිච්චමජානන්තො තිරච්ඡානොව ජීවති. (6)

---

1. මෙසේ මව්කුසින් පහළ වූ ම ඒ මේ සත්වතෙම මාංසපෙශිප්‍රත්‍යක්ෂු මෙන් මොලොක් ශරීර ඇත්තේ.

2. බැගෑවූයේ සතතයෙන් අනුන් අයිති පැවතුම් ඇත්තේ අනුකම්පාවට පිහිටවූයේ තමා වසඟ නොවන අඟපසඟ ඇත්තේ හැමකල්හි පිටින් ම හෝනේය.

3. ක්ෂීරාදිප්‍රත්‍යය නැතිකල්හි අව්‍යවහි ලූ පුෂ්පයක් සේ වහා ම වියලෙන ශරීර ඇත්තේ තමාට රුචි වූ ඊර්‍ය්‍යාපථයක් හෝ අනුභව කරණ සෙසුදෙයක් හෝ නොලබන්නේ.

4. නිති අශුචියෙන් වැකුනු ශරීර ඇති සතතයෙන් ගිලන්වූයේ අතිසයින් දුර්වලවූයේ කැමති නොකැමති දෙය පිණිස කියන්නට අසමර්ථ ව හැඬීම ම පිහිට කොට ඇත්තේ.

5. මරණයට නො පැමිණියේ වී නම් එයින් මතු ජීවත් වීමට කුශලකර්මයක් ඇතහොත් මහත්බවට පැමිණේ.

6. කුශලකර්මයෙහි අදහස් නැති ව විලිබියදෙකින් තොර ව කටයුතු නො කටයුතු නොදනිමින් තිරිසනෙකු මෙන් ජීවත් වේ.

මන්දෝ, තරුණවච්ඡෝව පරිධාවම්හිතො විතො,
හත්ථභඞ්ගාදිකං දුක්ඛං පාපුණාති අසංසදිතො. (1)
යතො මහත්තං පත්තො සො විසදින්ද්‍රියමාණවො,
ඉට්ඨාදිගොචරෙ නිච්චමභිරජ්ජති දුස්සති. (2)
රත්තො රාගෙන දොසෙන දුට්ඨො මොහෙන මුච්ඡිතො,
තං තං පාපවසං පත්තො උම්මත්තො විය ජීවති. (3)
චරං උම්මත්තවෙසෙන කත්වා දුච්චරිතං බහුං,
සූලාදිං උපනීතො සො ඵලං වින්දති ජාතියා (4)
ඛුදම්පිපාසං සීතුණ්හං වධබන්ධනතාළනං,
එසනාදිමනෙකඤ්ච ජාතො දුක්ඛං නිගච්ඡති. (5)
විලාපො දොමනස්සඤ්ච සොකො දුක්ඛමසය්හකං,
උපායාසොති සබ්බෙ තෙ ජාත-ව අනුවත්තරෙ. (6)

---

1. මුලාවූ ලදරුවකු මෙන් සාවසංසයක් නැතිව ඔබිනොබ දුවත්තේ අත්පා බිඳීම් ආදී දුකට පැමිණේ.

2, එයින් මහත්බවට පැමිණියා වූ විසද වූ ඉන්ද්‍රියයන් ඇති ඒ ලදරු තෙමේ නිතරම ඉෂ්ට අරමුණෙහි ඇලේ අනිෂ්ට අරමුණෙහි ගැටෙයි.

3 රාගයෙන් ඇලුනු ද්වෙෂයෙන් දූෂිත වූ මොහයෙන් මුලාවූ හෙතෙම රාගාදි ඒ ඒ පාපයන්ගේ වසඟයට පැමිණි උන්මත්තකයෙකු මෙන් ජීවත් වේ.

4. රාගාදීන් වසඟ ව උම්මත්තවෙසයෙන් ඇවිදිනේ බොහෝ දුශ්චරිත කොට උල් ආදියට එලවනලද හෙතෙම ජාතියෙහි විපාක අනුභව කරන්නේය.

5. උපන් සත්වයා ක්ෂුධාපිපාසාරොගවධබන්ධනතාඩනපර්යේෂණාදි නොයෙක් දුකට ද පැමිණේ.

6. හැඬීමය දොම්නසය ශොකය නොයිවසියහැකි කායිකදුක්ඛය බලවත්පීඩාය යන මේ සියලු ම දුක් උපන් සත්වයාම අනුව පවතිත්.

දසාකුසලකම්මානි දූරෙත්වාන බහූනිධ,
පතිත්වාපායදුග්ගෙසු චිරං සග්ගං න පස්සන්ති හි. (1)

ජාත්‍යාදි දුක්ඛයන්ගේ වශයෙන් ද
තව ද මෙම ජාතිදුක්ඛයෙහි.

ජායෙථ නො චෙ නරකෙසු සත්තා
තත්ථග්ගිදාහාදිකමප්පසය්හං,
ලබ්භෙථ දුක්ඛං නු කුහිං පතිට්ඨං
ඉච්චාහ දුක්ඛාති මුනීධ ජාතිං. (2)

දුක්ඛං තිරච්ඡෙසු කසාපතොද
දණ්ඩාභිඝාතාදිභවං අනෙකං,
යන්තං කථං තත්ථ භවෙය්‍ය ජාතිං
විනා තහිං ජාති තතොපි දුක්ඛා. (3)

පෙතෙසු දුක්ඛං පන ඛුප්පිපාසා
වාතාතපාදිප්පභවං විචිත්තං
යස්මා න ජාතස්ස න තත්ථ අත්ථි
තස්මාපි දුක්ඛං මුනි ජාතිමාහ. (4)

---

1. මේ ලොකයෙහි බොහෝ වූ දශාකුශලකර්මයන් රැස් කොට ගෙණ සතරඅපායදුකෙහි පතිත ව බොහෝ කලක් සුගතිය නොදකී.

2. සත්ත්වයා නරකයෙහි නූපන්නේ නම් එහි වහනිදාහාදි ඉවසියනොහැකි දුක් මෙහි කොහි පිහිටා ලබන්නේ ද අන් තැනක පිහිටා නොලබන්නේමය එහෙයින් මුනීන්ද්‍රයන්වහන්සේ ජාතිය දුකයයි වදාළසේක.

3. තිරිසනුන් කෙරෙහි සැමිටිකැවිටිමුගුරුවලින් තැළීම් ආදියෙන් වන අනෙකප්‍රකාර වූ යම් දුකෙක් ඇද්ද ඒ දුක ඒ තිරිසනුන්කෙරෙහි ඉපදීම හැර එහි කෙසේ වන්නේ ද? ඒ මේ කරුණෙනුත් ජාතිය දුක්ම යයි සර්වඥයන්වහන්සේ වදාළසේක, තිරිසන්යොන්හි දුකත් ජාතිය ඇතිකල්හිම වන බැවින් ජාතිය දුක්මය යනු භාවයි.

4. ප්‍රෙතයන් කෙරෙහි ක්‍ෂුත්පිපාසායෙන් හා අව්සුලඟින් වන පුදුම දුක ද යම්හෙයකින් එහි නූපන්නාහට නැත්තේ ද එහෙයිනුත් සර්වඥයන්වහන්සේ ජාතිය දුක්ම යයි වදාළසේක.

තිබ්බන්ධකාරෙ ච අසංභසීතෙ
ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං,
න තං භවෙ තත්ථ නචස්ස ජාති
යතො අයං ජාති තතොපි දුක්ඛා. (1)

කිම්භාසිතෙන බහුනා නනු යං කුහිඤ්චි
අත්ථි කිඤ්චිපි දුක්ඛමිදං කදාචි,
නෙවත්ථි ජාතිවිරහෙ යදතො මහෙසී
දුක්ඛාති සබ්බපඨමං ඉමමාහ ජාතිං. (2)

මේහැම ජාතිදුක්ඛ නම් වන්නේයි.

සබ්බානත්ථසමුට්ඨානං ජාතිදුක්ඛවසං ගතො,
ජාතිපච්චයසම්භූතං ජරාදුක්ඛං නිගච්ඡති. (3)

සරීරං දිබ්බකප්පම්පි රුක්ඛො දවනහිතා විය,
විරූපං හොති අච්චන්තං ජරාපාවකදූසිතං. (4)

පීතයොබ්බනපූසොයං ජරායක්ඛිණියා නරො,
භුසං පීතරසො උච්ඡුසටංවා නිජ්ජිගුච්ඡියො. (5)

---

1. සම්භෙයකින් බොල් වූ ඇඳිරි ඇති නොසිවසිය හැකි සිහිල් ඇති ලොකාන්තරිකයෙහි අසුරයන් කෙරෙහි යම් දුකෙක් ඇද්ද එහි නූපන්නේ නම් ඒ දුක ද නොවන්නේය ඒ කාරණයෙනුත් මේ ජාතිය දුක්ම යයි වදාළසේක.

2. බොහෝ කොට කීමෙන් ප්‍රයොජනනැත්තේය මේ ලොකයෙහි කිසිපෙදෙසෙක්හිදු කවරකලෙක්හිදු ස්වල්ප වූ ද යම් දුකෙක් ඇද්ද ඒ මේදුක හැම්තැන්හි ම හැමකලම ජම්ගෙයකින් ජාතිය හැර නොවේ ද එහෙයින් සර්වඥයන් වහන්සේ සියලු දුඃඛයන්ට පළමු කොට මේ ජාතිය දුකයයි වදාළසේක.

3. සියලු අනර්ථයට කරුණු වූ ජාතිදුක්ඛවසභයට පැමිණි සත්ත්වයා ජාතිය කරණකොටගෙණ වූ ජරාදුකට පැමිණේ.

4. ලැව්ගින්නෙන් ද, විරූපයට ගිය වෘක්ෂයක් මෙන් දිව්‍යසදෘශශරීරය පවා ජරානැමැතිගින්නෙන් දූෂ්‍ය කරණ ලද්දේ අතිශයින් ම විරූප වේ.

5. ජරා නැමැති යක්ෂිණිය විසින් යොවනරසය බොන ලද මේ සත්ත්වයා උක්සපයක් මෙන් අතිශයින් පිළිකුල් කට යුත්තේය.

පලිතාකිණ්ණකෙසොව ඛණ්ඩදන්තො ඛරස්සරො,
ඛරසම්ඵස්සදුබ්බණ්ණො පූතිගන්ධවලිත්තචො. (1)

අට්ඨිසඞ්ඝාටපෙතොව දිස්සමානඞ්ගපඤ්ජරො,
ඛීණලොහිතමංසොව කිසො ධමනිසන්ථතො. (2)

පවෙධමානො අබලො සදා දණ්ඩපරායණො,
පමුඛොභග්ගදෙහොව මන්දො අවිසදින්ද්‍රියො. (3)

පරිඛීණො සතාදීහි සම්පත්තො මච්චුසන්තිකං,
අවිධෙය්‍යඞ්ගපච්චඞ්ගො සකිච්චෙ අවසඞ්ගතො. (4)

විලුත්තභොගො අඤ්ඤෙහි විජ්ජමානෙව ජීවිතෙ,
පච්ඡින්නපුඤ්ඤකම්මො සො සෙති මච්චුපරායණො. (5)

---

1. පලිතයෙන් ගැවසීගත් හිස ද කඩවගිය දත්ද කර්කශ වූ කණ්ඨස්වර ද රළුපහස් ද ඇති දුර්වර්ණ වූ දුර්ගන්ධ වූ රැලි ඇති සම ද ඇත්තේය.

2. ඇටසැකිලි ප්‍රෙතයෙකු මෙන් වෙනවෙනම පෙණෙන සන්ධි අවයව ඇති ඇටමැදිරිය ඇති පරික්‍ෂීණ වූ ලෙහෙ මස් ඇති කෘශවූ නහරින් ගැවසුනු ශරීර ඇත්තේයි.

3. ශක්තිය නැතු ව වෙවුලමින් හැමකල්හි ම සැරයටිය පිහිට කොට ඇති ඉදිරියට නැමුනු ශරීර ඇති මුළා වූ අවිශද වූ ඉන්ද්‍රියයන් ඇත්තේයි.

4. සිහිනුවනාදියෙන් පිරිහුණේ මරුසමීපයට පැමිණියේ තමාවසඟ නොවන අඞ්පසඟ ඇත්තේ අනපානාභ්‍යවහරණාදී තමාගේ කටයුත්තෙහි පවා අවසඟබවට පැමිණියේ.

5. ජීවිතය පවතිමින් සිටියදී ම අනුන් විසින් පැහැරගත් භොග ඇති හෙතෙම සිදීගිය කුශලකර්ම ඇත්තේ හැඳම පිහිට කොට ඇති ව හෝනේයි; (මේ භවයෙහි ඵලදායක කුශලක්‍ෂය වූහෙයිනුදු යෞවනාදි පරික්‍ෂයෙන් දැන් කරණ කුශලාදියක් නැතිහෙයින් ද ප්‍රච්ඡින්න වූ කර්ම ඇත්තේ නම් වේ)

සදා විතමලවාරෙ පූතිගන්ධසරීරකො,
කපණො ඨිතනලජ්ජීව චත්තපෙමො ච බන්ධුහි (1)

අතෙකිච්ඡකව්‍යාධී ච සප්පායං රුච්චමත්තනො,
අලභන්තො පරාධීනො පංසුපෙතොව ජීවති. (2)

දයාය වජ්ජිතො සො බාලො විය ජළො භවෙ,
ජීවමානොපි යං ජිණ්ණො මතො විය නිරත්ථකො. (3)

විසංසදපූතිඛෙලොඝං හසන්තොපි මහල්ලකො,
නට්ඨයොබ්බනසොභො සො මණ්ඩිතොපි න සොභති. (4)

ලොකෙ විරූපපිණ්ඩොව ජඞ්ගමො ජිණ්ණපුග්ගලො,
දිස්වාන යං ජිගුච්ඡන්ති සපෙමා අපි බන්ධවා. (5)

කරොන්ති අපහාසං වා අවඤ්ඤං වා දිසමහනො,
අපනෙන්ති මුඛං අඤ්ඤෙ භණමානෙ මහල්ලකෙ. (6)

---

1. හැමකල්හි ම රැස් වූ අශුචිඇති චක්ෂුර්වාරාදීන් ඇති දුර්ගන්ධශරීරඇති බැගෑ වූ ලජ්ජාරහිත වූ යේම බන්ධූන්විසින් හැරපියනලද ප්‍රේම ඇතිවූයේ.

2. සුව නොකටහැකි රොග ඇත්තේ තමාට රුචි වූ සැපයක් නොලබන්නේ අනුන් අයිති පැවතුම් ඇති ව පාංසුපිශාචයෙකු මෙන් ජීවත් වේ.

3. හෙතෙමේ කරුණාවට වැනූ වූයේ බාලබිලිඳෙකු මෙන් ජඩවන්නේයි, මේ මහලු තෙමේ ජීවත් වෙතත් මළඑකෙකු මෙන් තමාහට වත් අනුන්ට වත් ප්‍රයොජන නැත්තේය.

4. මේ මහලු තෙමේ මුඛයෙන් පිටතට වැහෙන කුණුකෙල ඇත්තේ සිනහසෙතත් නො හොබිනේය නෂ්ට වූ යෞවනශොභා ඇති හෙතෙම පුෂ්පාභරණාදියෙන් සැරසෙනලදුවත් නො හොබනේය.

5. යමක්හු දක ප්‍රේමඇති බන්ධුහු පවා පිළිකුල් කෙරේද්ද එසේ වූ මේ ජීර්ණපුද්ගල ලොකයෙහි ඇවිදිනා විරූපපිණ්ඩයෙක්මැයි.

6. මහලු පුරුෂයා බණිනකල්හි සෙස්සෝ අපහාස හෝ කෙරෙත් අහක හෝ බලත්.

දට්ඨුං තං තස්ස සොතුම්පි වචනං අපි බන්ධවා,
ඵුසිතම්පි ජිගුච්ඡන්ති තස්ස හත්ථෙන තාදිසං. (1)
අසුචිංව ජිගුච්ඡන්ති අත්‍රජාපි මහල්ලකං,
තෙන සම්භාසසංවාසං නෙච්ඡන්ති කථංචිපි. (2)
පුබ්බෙ මනාපො හුත්වාන ජිණ්ණො යොබ්බනකාරණා,
පච්ඡා සොචති අනාථො ඛිණ්ණපාථෙය්‍යකො විය. (3)
මරණං හොති ආසන්නං ආගතාය ජරාය හි,
සුරියාසන්නතාමොව අරුණුග්ගති සටාගතෙයි. (4)

මේ හැම ජරාදුඃඛ නම් වන්නේය.

එවං ජරාය ජිණ්ණොපි තරුණො වාපි පුග්ගලො,
ජාතිපච්චයසම්භූතං ව්‍යාධිදුක්ඛං නිගච්ඡති. (5)
යදා සො ගහිතො හොති ව්‍යාධියක්ඛෙන පුග්ගලො,
අසමත්ථො තදා සෙති ඡින්නපක්ඛො දිජො විය. (6)

---

1. බන්ධුහු පවා මහලු පුරුෂයා දක්නටත් ඔහුගේ බස් අසන්ටත් අප්‍රිය වෙත් ඔහුගේ අතින් ස්පර්ශ කරණලද ආහාර දිය ද පිළිකුල් කෙරෙත්.

2. දරුවෝ පවා මහලු පුරුෂයා අශුචි මෙන් පිළිකුල් කෙරෙත් කිසිසේත් ඔහු එක්ව වැලඳීම ද විසීම ද කැමැති නොවෙත්.

3. මහලු පුරුෂ තරුණකල යෞවනය කරුණු කොට ගෙණ බොහෝදෙනාට මනාප වී යෞවනක්ෂයට ගියකල්හි ක්‍ෂයවගිය භාණ්ඩොපකරණ ඇත්තෙකු මෙන් කිසි ආරක්ෂාවක් නැති ව සොවන්නේයි.

4. අරුණු නැගී කල්හි සූර්යෝදයෙහි ආසන්නභාවය මෙන් ජරාව පහළ වූ කල්හි ඒකාන්තයෙන් මරණය ආසන්න වේ.

5. මෙසේ ජරාවෙන් ජීර්ණ වූ ද ලදරු වූ ද පුද්ගල තෙම ජාතිප්‍රත්‍යයෙන් හටගත් ව්‍යාධිදුඃඛයට පැමිණේ.

6. යම් කලෙක්හි ඒ පුද්ගල තෙම ව්‍යාධිනැමැති යක්ෂයාවිසින් ගන්නාලද්දේ වේ ද එකල්හි පියාපත් සිඳි පක්ෂියෙකු මෙන් නො පාමොසත්ව හෝනේයි.

මනාපං වණ්ණසණ්ඨානං ඨිතිං හිරිමසෙසතො,
සරීරෙ සබ්බසම්පත්තිං ව්‍යාධියක්ඛො විලුම්පති. (1)

අදිස්සමානරූපම්හි අච්චුණ්ණෙන සුදාරුණෙ,
ආගතෙ ව්‍යාධියක්ඛස්මිං මරණෙ හොති සංසයො. (2)

ඉට්ඨවියොගහෙතුච දෙහං නිස්සාරකාරකො,
පරාභූතකරෙ දෙහී නත්ථි ව්‍යාධිසමො රිපු. (3)

මණ්ඩනං හසනඤ්චෙව විලාසො කීළනම්පි ච,
ආගතෙ ව්‍යාධියක්ඛම්හි සබ්බමන්තරධායති. (4)

අසමත්ථො සභොගම්පි භුඤ්ජිතුං ව්‍යාධිපීළිතො,
උට්ඨානාදීසු කිච්චෙසු පරාධීනො නිපජ්ජති. (5)

සකෙ මුත්තකරීසම්හි පලිපන්නො රුදම්මුඛො,
දයාලුකානං සත්තානං කම්පෙති හදයම්බුජං. (6)

---

1. මනවඩන වර්‍ණය සංස්ථානය ස්ථිතිය ලජ්ජාවය ශරීරයෙහි අවශෙෂ සියලු සම්පත්තිය යන මොවුන් නිශෙෂයෙන් ව්‍යාධිනැමැති යක්‍ෂයා පැහැරගණී.

2. ඇසට නො පෙණෙන ස්වරූප ඇති කිසි කටයුත්තක් නො අසන ඉතා දරුණු වූ ව්‍යාධිනැමැති යක්‍ෂයා ආ කල්හි මියෙම් දෝහෝ සැක උපදී.

3. වර්‍ණසංස්ථානාදි ඉෂ්ටයෙන් වියෝබවට හෙතු වූ ශරීරය අසාර කරන්නා වූ ශරීර ඇති දෙහය අනුන් අයිති කුරුන්නා වූ ව්‍යාධිය හා සමාන සතුරෙක් නැත්තේය.

4. සැරසීමය සිනාවය ලීලාවය කෙළිය යන මේ සියල්ල ම ව්‍යාධි නැමැති යක්‍ෂයා ආ කල්හි අතුරුදහන් වේ.

5. ව්‍යාධියෙන් පීඩිත පුද්ගල තෙම තමාගේ භොග පවා අනුභව කරන්නට පොහොසත් නුවූයේ නැගිසිටීම් ආදි තමන්ගේ කෘත්‍යයෙහිත් අනුන් අයිති ව හෝනේයි.

6. තමාගේ මලමූත්‍රයෙහි තැරවුනේ විලාපකළමුහුණු ඇත්තේ කුළුණු ඇති සත්ත්වයන්ගේ ලය අතිශයින් කම්පා කරවයි.

තස්ස දිස්වාන සම්මොහං ව්‍යාධිදුක්ඛමුපාගතං,
අච්චන්තමනුතාපෙන්තො සොකග්ගි අභිවඩ්ඪති. (1)

දුක්ඛං සහිතු මසක්කොන්තො පුග්ගලො ව්‍යාධිපීළිතො,
සයමෙවාපි දුල්ලභං හන්ති ජීවිතමත්තනො. (2)

අච්චන්තං චිත්තවික්ඛෙපං අප්පියත්තං පරස්ස ච,
පාපුණාති නරො ඛිප්පං ව්‍යාධිදුක්ඛවසං ගතො. (3)

නොපෙතනාගතං භොගං චිත්තං න පරිභුඤ්ජති,
කල්‍යාණඤ්ච න සක්කොති කාතුමපිච්ඡති ව්‍යාධිතොති. (4)

මේ හැම ව්‍යාධිදුක්ඛ නම් වන්නේය.

යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මාණවො,
අබ්භුට්ඨිතො ව සයති සගච්ඡං න නිවත්තති. (5)

---

1. තමා කර ආවා වූ ඉතා භයානක වූ ව්‍යාධි නැමැති යක්ෂයා දැක ඕහට අතිශයින් ම අනුතාපකරණ ශොකාග්නිය වැඩේ.

2. ව්‍යාධියෙන් පීඩිත පුද්ගල දුක් ඉවසන්නට නො පොහොසත්වූයේ දුකින් ලද තමාගේ ජීවිතය තෙමේම නසාගන්නේයි.

3. ව්‍යාධි නැමැති යක්ෂයාගේ වසඟයට පැමිණි සත්ව තෙම අතිශයින් ම චිත්තවික්ෂෙපයට ද අනුන්ට අප්‍රියබවට ද වහා ම පැමිණේ.

4. ව්‍යාධියෙන් පීඩිත පුද්ගල නො උපන් භොගයට නො පැමිණෙයි රැස් කරණලද භොගය තමා රුචිසේ අනුභවකරන්ට නො පොහොසත් වෙයි කුසල් කරන්ට කැමැතිවූවත් ඊට නො පොහොසත් වේ.

5. සත්වතෙම යම් එක රාත්‍රියෙක්හි පළමු කොට (පිළිසිදගත් කෙණෙහි) මව්කුස වෙසේ ද ඒ ප්‍රථමක්ෂණයෙහි පටන් නැංගා වූ මේඝයක් මෙන් මරණාභිමුඛ ව යේමය මෙසේ යන්නා වූ ඒ මාණවක තෙම ක්ෂණමාත්‍රයෙකුදු නොනවතී.

අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඔදකං. (1)

ඵලානමිව පක්කානං පාතො පපතනා භයං,
එවං ජාතානං මච්චානං නිච්චම්මරණතො භයං. (2)

යථාපි කුම්භකාරස්ස කතං මත්තිකභාජනං, *
සබ්බං භෙදනපරියන්තං එවං මච්චානජීවිතං. (3)

උස්සාවොව තිණග්ගම්හි සුරියුග්ගමනම්පති,
එවමායු මනුස්සානං මා මං අම්ම නිවාරයෙ. (4)

පාපස්ස පාපකම්මාදිනිමිත්තමනුපස්සතො,
භද්දස්සාපසහන්තස්ස වියොගං පියවත්ථුකං.

මීයමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතො,
සබ්බෙසං චාපියං සන්ධිබන්ධනච්ඡෙදනාදිකං.

විතුජ්ජමානමම්මානං හොති දුක්ඛං සරීරජං,
මරණං වත්ථු යෙනෙතං දුක්ඛමිච්චෙව භාසිතං. (5)

---

1. දිවාරාත්‍රීහු ඉක්මෙති ජීවිතය නිරුද්ධ වෙයි පර්වතයෙන් බට ක්ෂුද්‍රනදීන්ගේ ජලය මෙන් ආයු ක්ෂය වේ; යම් හෙයකින් දිවාරාත්‍රීහු ඉක්මෙද්ද එහෙයින් දිවි නිරුද්ධ වෙයි යම්හෙයකින් දිවි නිරුද්ධ වේ ද එහෙයින් පර්වතයෙන් බට ක්ෂුද්‍රනදීන්ගේ ජලය ක්ෂයවන්නාක් මෙන් ආයු ගෙවෙයි දන්න.

2. පැසුනු ඵලයන්ගේ උදෑසන්හි පතනයෙන් රුක්හිමියන්ට යම්සේ භය උපදී ද එපරිද්දෙන් ම උපන් සත්වයන්ට හැමවේලෙහි ම මරණින් භය වේ.

* ඛුද්දකං ච මහන්තං ච යං පක්කං යං ච ආමකං.

3. කුඹලා විසින් කරණලද සියලු මැටි බඳුන් යම්සේ බිඳීම ම කෙලවර කොට ඇත්තේ ද සත්වයන්ගේ ජීවිතයත් එසේ ම මරණය කෙලවර කොට ඇත්තේය.

4. සූර්ය්‍යොදගමනය හේතු කොටගෙණ යම්සේ තණ අග පිනි බිංදු සිඳේද මනුෂ්‍යයන්ගේ ආයුෂයත් මෙසේ මය එබැවින් මෑනියෙනි මා පැවිදිවන්නාහු නොවළක්වන්න.

5. පාපකර්මය කර්මනිමිත්තය ගතිනිමිත්ත යයි කියනලද මරණකාලයෙහි එළඹ සිටි අකුශලවිපාකාලම්බනය අනුව

නියම්මානස්ස සතතං ජරාරොගෙහි නිච්චසො,
ඝොරං මච්චුමුඛං නත්ථි තාණං ලෙනඤ්ච සබ්බසො. (1)

මහාවාතසමුට්ඨිතො සුක්ඛකච්ඡංව පාවකො,
විප්පං ඩහති නරං මච්චුජරාරොගසහායකො. (2)

නරං අත්තනි ජාතාව ජරාරොගාරයො උභො,
ආකඩ්ඪෙත්වාන පාතෙන්ති මරණානලකාසුයං. (3)

අසය්හප්පටිකාරෙන මච්චුදුක්ඛෙන පීළිතො,
තාණං ලෙනමපස්සන්තො නිමුග්ගො සොකසාගරෙ. (4)

ජහිත්වා සබ්බසම්පත්තිං සරීරම්පි ච අත්තනො,
අකාමං මරණං යාති ඵන්දමානො රුදම්මුඛො. (5)

---

දක්නා පාපකර්ම ඇත්තාහට ද කරණලද කුශලකර්ම ඇති ප්‍රියවිප්‍රයොගවස්තුක දුක නොසහමින් මැරෙණුවහට ද සිතෙහි හටගන්නා දුකක් වේ ද සාමාන්‍යයෙන් වාතයෙන් විදිනුලබන මර්මස්ථාන ඇති හැමදෙනාට ම හන්දි හා බැමි පිපිරීමාදි නො ඉවසියහැකි පිළියම් නො කොට හැකි යම් කායිකදුකෙක් වේ ද යථොක්ත මානසිකකායික දුකට මේ මරණය යම් හෙයකින් වස්තු වේ ද එහෙයින් දුඃඛය ම යයි වදාරණලදි.

1. මෙසේ ජරාව්‍යාධි දෙදෙනා විසින් නිරන්තරයෙන් ඝොරමරුමුවට ගෙණයනු ලබන්නාවූ ඕහට සර්වප්‍රකාරයෙන් රක්‍ෂාවක් ද මුවාස්ථානයක් ද නැත්තේය.

2. මහසුලඟින් කම්පිත ගින්නක් වියලිදර දවන්නාක් මෙන් ජරාව්‍යාධි දෙදෙන සහාය කොට ඇති මාරයෙම සත්වයා වහා ම නසන්නේයි.

3. තමා කෙරෙහි ම උපන් ජරාරොග නැමැති සතුරන් දෙන්න සත්වයා ඇදගෙණ මරණ නැමැති ගිනිවළෙහි හෙළත්.

4. නො ඉවසියහැකි පිළියම් නොකටහැකි මරණදුකින් පීඩිත වූ යෝ! ආරක්‍ෂාවක් මුවාවක් නො දක්නේ සොක නැමැති මුහුදෙහි ගැලුනේ.

5. තමාගේ දුකින් ඉපද වූ සියලු සම්පත්තියත් බොහෝ

න කාලනියමෙනෙති නවාගන්තාපි දිස්සති,
හනති සීඝතරං ආයු ආගතො මච්චු තඞ්ඛණෙ. (1)

ගහෙත්වා ජීවිතං මච්චු ගච්ඡන්තොපි න දිස්සති.
ගහිතං න පුනානෙති රුදන්තෙපි මහාජනෙ. (2)

න ඤාතිභොගා සක්කොන්ති න මිත්තා නපි බන්ධවා,
න කොචි බලවා ලොකෙ මච්චුතො නං විමුච්චිතුං. (3)

නත්ථි තාදිසකො හෙතු යෙන ජනො න මීයති.
කො තං සක්කොති වාරෙතුං ජාතියා සහ ආගතං. (4)

ඨපෙත්වා කතකල්‍යාණං ඝොරං මච්චු භයං ඉමං,
නත්ථි කොචි භවෙ තස්ස සමත්ථො පටිබාහිතුං. (5)

---

කලක් පොෂ්‍යය කල ශරීරයත් හැර වෙව්ලමින් විලාපකඳුලු මුහුනුඇති ව නො කැමැත්තාවූයේ ම මරණයට පැමිණේ.

1. මරුවා කල් නියමයකින් ද නො එන්නේය කාලනියමයක් නැතු ව එන්නෝ ද නො පෙණෙන්නේය නොපෙණී ආයේ ද ඒ තමා ආවා වූ ක්ෂණයෙහි ම ලුහුව ජීවිතය පැහැරගන්නේය.

2. මරුවා ජීවිතය පැහැරගෙණ යන්නේ ද නො පෙණෙන්නේය මහාජනයා හැඬුව ද පැහැරගත් ජීවිතය නැවත එම ශරීරයට නො ගෙණෙන්නේය.

3. ඒ මරුඅතට පැමිණී සත්වයා මරුවාගෙන් මුදාගන්නට නෑයෝ ද භොග ද මිත්‍රයෝ ද බන්ධුහු ද නො පොහොසත්හ ලොකයෙහි බලවත් වූ ශක්‍රබ්‍රහ්මාදි කිසිවෙක් ද නො හැකිමය.

4. යම් කාරණයකින් උපන් සත්වයා නොමියේ ද එබඳු හෙතුවක් ලොකයෙහි කිසි ප්‍රකාරයෙකිනුදු නැත්තේය ප්‍රතිසන්ධික්ෂණයෙහි ම ආවා වූ ඒ මරහු වළක්වන්නට සමර්ථයෙක් නම් නැත්තේය.

5. කරණලද කල්‍යාණකර්මය විනා ඔහුගේ ඝොර වූ මේ මරණභය වළක්වන්නට සමර්ථ වූ කිසිවෙක් භවත්‍රයෙහි ම නැත්තේය.

නත්‍ථි ඝොරතරෝ නාම අනත්‍ථො මරණපරො,
යෙන යාති අනිට්ඨං සො වියොගං පියවත්‍ථුනො. (1)

කිච්ඡෙන පටිලද්ධං යං එකමෙවම්හි ජීවිතං,
අනන්‍තොපද්දවා තස්ස උපඝාතොපපීළකා. (2)

නිරුද්ධමත්තෙව මනම්හි සබ්බෙ
භොගා ච බන්‍ධූ ච සරීරලීලා,
ජහන්‍ති තං යාති සුසානමෙකො
කො පස්සිය තත්‍ථ කරෙය්‍ය රාගන්‍ති. (3)

යනාදීන් අනෙකප්‍රකාරයෙන් වර්‍ණනා කොට වදාරණ ලද ජාතිජරාව්‍යාධිමරණසඞ්ඛ්‍යාත සියලු දුඃඛයන්ට භාජන වූ නිසත්ත්‍ව නිර්ජීව වූ මේ ධාතුසන්තානරූපය පඨවිදයින් හම්ම තුලැබෙයි ආපොදයින් උපදනාලැබෙයි තෙජෝදයින් තුක ණු විය දෙනු ලැබෙයි වායොදයින් ඉරියව් පවත්වා භාවභාව ලීලායෙන් බාලජනා පොලඹමින් ආයු කැමජගිනි විනැණ පියොවින් පැවති ආයු කැමජගිනි විනැණපියොවින් නිරුද්ධ කල්හි මිත්‍රපුත්‍රකලත්‍රාදීන් විසින් අපසාදනීයභාවයට පැමිණ මෘත කලෙබරසඞ්ඛ්‍යාවට ගියේ සොහොන්හි හැර දියනලද්ද ද වන්නේයි.

මේ හැම මරණදුඃඛ නම් වන්නේය.

තව ද මෙම ස්කන්‍ධසඞ්ඛ්‍යාත ජාත්‍යාදිදුඃඛධර්‍මයන් අධිකතරප්‍රයොජනවශයෙන් බලන යොගීහු විසින්.

---

1. ඒ සත්ත්‍ව තෙම යම් කාරණයක් කරණකොට මරණ දුඃඛාදි අනිෂ්ටයටත් ප්‍රිය සත්ත්‍වසංස්කාරාදිවස්තුවෙන් වියෝ බවටත් යන්නේ ද මරණයට වඩා එබඳු වූ අනික් ඝොරතර වූ අනර්‍ථයෙක් නම් නැත්තේය.

2. දුකින් ලද්දවූ යම් එකම මනුෂ්‍යජීවිතයෙක් ඇද්ද ඒ ජීවිතයට උපඝාත වූ ද උපපීඩක වූ ද උපද්‍රවයෝ අනන්‍ත යහ.

3. සිත නිරුද්ධ වූ ක්‍ෂණයෙහි ම භොගය බන්‍ධුය ශරීර කලාපය යනමේ සියල්ලෝ ම ඔහු හැරපියති හුදකලාව සොහොනට යෙයි එසේ වූ ශරීරයෙහි නුවනැති කවරෙක් ඇලුම් කෙරේ ද.

ආදනනිකෙඛපණනෙ මයොවුඩඪිතාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති.

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රති හොති සම්මාධම්මං විපස්සතොති.

තව ද මෙම ස්කන්ධසඞ්ඛ්‍යාතජාත්‍යාදිදුඃඛධර්මයන් ජාත්‍යාදිදුඃඛවශයෙන් බලන්නාහට ඇසිඳියෝ ගිනිගෙන දිලියෙන සාලතුරුවලෙක්හි හුනුවක්හට සෙයින් දුක් විසින් වැටහෙන්නාහු යයි දත්යි.

තව ද මෙම ස්කන්ධසඞ්ඛ්‍යාතජාත්‍යාදිදුඃඛධර්මයන් ධර්මාලම්බනප්‍රීතිවශයෙන් බලන යොගීහු විසින්.

තණ්හාසුචිසමාකිණ්ණො අන්ධො අපරිනායකො,
බාලො චරති වට්ටම්හි ජච්චන්ධොව එකෙකකො. (1)

සතං ධම්මමපස්සන්තො විපල්ලාසපුරක්ඛතො,
මිගො මරීචිලුද්ධොව පරිධාවතිතො චිතො. (2)

සිද්ධො ජාති කම්මෙන ඉධ ලොකෙ පරත්ථ ච,
බහූනං පච්චයා හොති දුක්ඛානං ජාතිහෙතුකං. (3)

යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බන්තං ජාතිපච්චයා,
සබ්බසො ජාතියාභාවෙ කුතො දුක්ඛස්ස සම්භවො. (4)

---

1. පයෙළිණණතෘෂ්ණාදි අශුචියෙන් ගැවසීගත් නුවනැස් නැතිව අන්ධ වූ අහිතයෙන් නගා හිතයෙහි පිහිටුවන කල්‍යාණමිත්‍රයෙකු නැති බාලයා වනයෙහි තනි වූ ජාත්‍යන්ධයෙකු මෙන් සසර බොහෝකලක් එකලාව ඇවිදිනේයි.

2. බුද්ධාදිසත්පුරුෂයන්ගේ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය නොදක්නේ අනිත්‍යාදියෙහි නිත්‍යසංඥාදිමාදශවිපර්‍ය්‍යාසයෙන් පිරිවරණලදු ව මිරිඟුයෙහි ඇලුනු බාලමෘගයෙකු මෙන් භවයෙන් භවයට චුතිප්‍රතිසන්ධිවශයෙන් දුවන්නේයි.

3. කර්මයෙන් සිද්ධ වූ එකම ජාතිතොමෝ මේ ලොකයෙහි බොහෝ දුඃඛයන්ට ප්‍රත්‍යයවන්නීය පරලොව්හි ද ජාතිහෙතුක වූ බොහෝ දුඃඛයන්ට ද ප්‍රත්‍යය වේ.

4. සසර ඇවිදින සත්ත්වයාහට අපායදුඃඛාදි යම්කිසි දුකෙක් වේ ද ඒ සියලු දුක් ම ජාතිප්‍රත්‍යයෙන් ම වේ සර්වප්‍රකාරයෙන් ජාතිය නැතිකල්හි දුඃඛයාගේ වීම කොයින් ද?

යො සන්තරූපොපි පුරෙ ධනූනනං
විරූපදෙහො පුන යො ජරාය,
ජිගුච්ඡිතබ්බො අපි බන්ධවෙහි
සංවෙගඨානං නනිදං බුධානං. (1)

කාතුං න සක්කොති නරො පතිට්ඨං
යෙනාධිභූතො සති ජීවිතෙපි,
ව්‍යාධිං තමෙවං කුසලො විදිත්වා
ආදිත්තසීසොව චරෙය්‍ය ධම්මං. (2)

ගිලියමානෙ සති ජීවිතම්හි
නිරන්තරං මච්චුමහොරගෙන,
හාසො නු කො කා නු ච තුට්ඨි භොගෙ
කාතබ්බමෙකං නනු පුඤ්ඤමෙව. (3)

ජාතස්ස යොබ්බනරසං හි ජරාපනෙති
රොගො බලං හරති මච්චු අකාමමායුං,
භොගෙ හරන්ති ච පරෙ තනුමෙසි කාමං
ධම්මංව හො ඉහ සතං අනුගාමිමෙකං. (4)

---

1. යමෙක් ලද රූකල්හි බොහෝ දනාට ප්‍රියරූප ඇත්තේ ද හැවත ජරාවෙන් විරූප ව ගිය ශරීරඇති හෙතෙම බඳුන් විසිනුදු පිළිකුල් කටයුතු වන්නේයි, මේ නුවනැත්තන්ට සංවෙග උපදවන්ට කාරණයක් නොවේ ද ?

2. යම් ව්‍යාධියකින් මඩනාලද පුරුෂයෙම ජීවිතය ඇතිවත් කුසල් කරන්ට අසමර්ථ වන්නේ ද ඒ ව්‍යාධිය නුවනැත්තේ මෙසේ දනගෙණ ගිය ගිනිගත් පුරුෂයෙකු මෙන් වහා ම කුශලධර්මයෙහි හැසිරෙන්නේයි.

3. මරණ නැමැති මහපිඹුරා විසින් ජීවිතය සතතයෙන් ගිලිමින් සිටිකල්හි කවරනම් හාසයෙක් ද ? භොගයෙහි කවර නම් සතුටෙක් ද ? එහෙයින් දුකින් ලද මේ ජීවිතයෙහි සතතයෙන් කටයුතු කුසල් ම නොවේ ද ? එසේමැයි.

4. භවත්නි උපන් සත්ත්වයාගේ යොවනරසය ජරා නැමැති යක්ෂිණිය උරාගණී රෝග නැමැති සතුරා ශක්තිය පැහැරගණී මරුවා බලාත්කාරයෙන් ජීවිතය පැහැරගණී

යා එකකච්ඡායිනිද්දසුභං ගතම්පි
පාපෙති ජාති ගහලද්ධද්ධිද්දභාවං,
සාධූහි ඤාත පරිභුත්ත ගුමෙත්තනච්චං
නිබ්බාණමෙව නනු දුල්ලභො බුධෙහි. (1)

සංසරිත්වා චිරං කාලං අනන්ත ජාති සාගරෙ,
කො පමජ්ජෙය්‍ය ධම්මෙසු ලද්ධා කිලෙසයිමං ඛණං. (2)

කොනු හාසො කිමානන්දො නිච්චං පජ්ජලිතෙ සති,
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ. (3)

පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසංකප්පං යස්ස නත්ථි ධුවං ඨිති. (4)

---

රාජචොරාදීහු භොගතන් පැහැරගන්නාහ. ශරීරය ශිල්ප පැහැරගණී. එකාන්තයෙන් එනම අනුගාමිකවූ ධනය නම් මේ ලොකයෙහි සඬහා පිහිත් කරණලද කුශලධර්මය ම යි.

1. යම් ජාතියක් නොමෙර් වස වන්ති සැපතට පැමිණියහු ද දිව්‍යරාජසම්පත්තියට පැමිණියහු ද ලජ්ජාරහිත ව කබලක් අතින් ගෙණ පයින් පෙළිපෙළී අනුන්ගේ දොර දොර සිඟනා දිළිඳුබවට පමුණුවන්නී ද එහෙයින් නුවනැති සාධුජනයන් විසින් වහා නිවන් ජාතියෙන් මිදෙන්නට සෙවිය යුතු නිවන් ම නොවේ ද?

2. අනන්ත වූ ජාතිසාගරයෙහි බොහෝ කල්ක් වුන්නු හිසරණබනයෙන් ඇවිද අවිකලෙන්ද්‍රිය ඇති දුලභ මනුෂ්‍යත්වය බුද්ධොත්පාදකාලය සම්පාදනය කොට මෙයින් සම්ප්‍රාප්ත වූ මේ නවවන ක්ෂණය දුකින් ලදින් දානශීලසමථවිදර්ශනාදී කුශලධර්ම පිරීමෙහි නුවනැති කවරෙක් පමාවන්නේ ද? නොවන්නේ මය.

3. මේ ලොකසන්නිවාසය රාගාදි එකොළොස් ගින්නෙන් ඇවිලගෙණ නිතර දිලියෙන කල්හි තොප හැමදෙනාට සොම්නසක් වත් සතුටෙක් වත් කවරේ ද? දුඃඛාදි අටතැන්හි උපදනා සම්මොහා වූ අන්ධකාරයෙන් වලඳනාලද්ද වූ තෙපි ඒ මොහාන්ධකාරය නසන පිණිස මාර්ගඵල ප්‍රඥානැමැති ප්‍රදීපය තුමනට නො සොයව් ද?

4. නිත්‍ය වූ පැවැත්මෙක් නැත එකාන්තයෙන් නස්නා සුලු වූ සිරෙණ සුළු වූ ව්‍රණසහිත වූ තුන්සියයක් ඇට නැ

යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං,
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති. (1)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො-පෙ-
නිද්දරෙ හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං,

යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතාසති,
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො,
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා. (2)

තස්මා හවෙ අප්පමත්තො අනුයුඤ්ජෙථ පණ්ඩිතො,
එවං අනෙකානිසංසං ඉමං කායගතාසතින්ති. (3)

මොවුන් ජාත්‍යාදිදුඃඛවශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

---

ළපි වැඩෙනලද සත්තයෙන් ගිලන් වූ බොහෝදෙනා විසින් ශුභය ශුචියයි කල්පනාකරණලද වස්ත්‍රාභරණමාලාගන්ධාදීන් සරහා විසිතුරු කරණලද මේ ශරීරය අසුචි දුගඳ පිළිකුල්සේ බල.

1. දියබුබුල ඉපද වහා නස්නේයයි ද තුච්ඡය අසාරයයි ද යම්සේ බලාද මිරිඟුපැන ගන්නට නො හැකියයි යම්සේ බලාද එපරිද්දෙන් ම ස්කන්ධායතනධාතුසඞ්ඛ්‍යාත ලොකය ඉපද වහා නස්නේය තුච්ඡය අසාරය ආත්ම ආත්මීයභාවයෙන් ගන්නට නො නිසියයි නුවනැසින් බලන මහණහු මෘත්‍යුරාජතෙම තමහට අවිෂය වූ නිවන්පුරයට ගියහෙයින් නො දක්නේය,

2. යම්කෙනෙකුන් විසින් කායගතාසතිභාවනාව නිතර මනා කොට වඩනලද්දී ද මහණුන් විසින් කටයුතු වූ ශීලපරිපූරණය ධුතාඞ්ගපරිහරණය භාවනාරාමතාය යන මෙහි සතතක්‍රියා ඇත්තා වූ ඔහු ශරීරමණ්ඩන පත්‍රකාරමණ්ඩනාදි අකෘත්‍යය සෙවනය නො කරති සිහිනුවනින් යුක්ත වූ ඒ පුද්ගලයන්ගේ කාමාදිචතුරාශ්‍රවයෝ ම පරික්‍ෂයට යන්නාහුයි.

3 එහෙයින් නොපමා වූ පණ්ඩිතතෙමේ මෙබඳු නොයෙක් අනුසස් ඇති මේ කායගතාසතියෙහි එකාන්තයෙන් යෙදන්නේය.

තව ද මෙම රූපස්කන්ධසංඛ්‍යාතධර්මයන් නවසීවථිකා වශයෙන් බලනපරිදි කිසේද යත් ?

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං එකාහමතං වා ද්වීහමතං වා තීහමතං වා උද්ධුමාතකං විනීලකං විපුබ්බකජාතං සො ඉමමෙව කායං උපසංහරති අයම්පි ඛො කායො එවං ධම්මො එවම්භාවී එතං අනතීතොති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං කාකෙහි වා ඛජ්ජමානං කුලලෙහි වා ඛජ්ජමානං ගිජ්ඣෙහි වා ඛජ්ජමානං සිගාලෙහි වා ඛජ්ජමානං සුපානෙහි වා ඛජ්ජමානං විවිධෙහි වා පාණකජාතෙහි ඛජ්ජමානං සො ඉමමෙව කායං උපසංහරති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං සමංසලොහිතං නහාරුසම්බන්ධං සො ඉමමෙව කායං උපසංහරති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං අපගතමංසලොහිතං නහාරුසම්බන්ධං සො ඉමමෙව කායං උපසංහරති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි අපගතසම්බන්ධානි දිසාවිදිසාසු වික්ඛිත්තානි අඤ්ඤෙන හත්ථට්ඨිකං අඤ්ඤෙන පාදට්ඨිකං අඤ්ඤෙන ජඞ්ඝට්ඨිකං අඤ්ඤෙන ඌරට්ඨිකං අඤ්ඤෙන කටට්ඨිකං අඤ්ඤෙන පිට්ඨිකණ්ටකං අඤ්ඤෙන සීසකටාහං සො ඉමමෙව කායං උපසංහරති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි සෙතානි සඞ්ඛවණ්ණූපනිභානි සො ඉමමෙව කායං උපසංහරති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි පුඤ්ජකිතානි තෙරොවස්සිකානි සො ඉමමෙව කායං උපසංහරති—

සෙය්‍යථාපි පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකානි පූතීනි චුණ්ණකජාතානි සො ඉමමෙව කායං උපසංහරති

අයම්පි ඛො කායො එවං ධම්මො එවංභාවී එතං අනතීතොති —

යනාදි පාලිවසයෙන් ද.

තව ද මෙම සීවථිකායෙහි සොහොන්හි හැරපියනලද මළසිරුර මළ එක්දා දෙදා ඉක්මීමෙන් වයින්පිරුණු සම්පි වාසක්හු සෙයින් ඉදිම නිල්ව නොයෙක් දෙසින් බිඳිවස්නා පූයාහා ලේහා නවවණදොරින් වැම්මෙන පණුකැලන්විසින් ආකුලව කා ගිජු උකුසු නහ කැණහිල් ඈ නොයෙක් සතුන් විසින් හිරහිරා නොයෙක්දෙසට හැදහැද මස් ලියා කෑකල්හී නහරබහන් සිඳී ඇටසැකිලිබවට පැමිණ දසනුදෙසෙහි විසිරෙණලදුව වා අවෙවන් වියලී වැසිදියෙන් තෙමී අවුරුදු සියයක් ගියකල්හි දිරා සුණුවිසුණුව අපවත්බවට පැමිණෙන්නේය; යනාදීන් මරණීන් සුන්විසුන්බවට පැමිණෙනු දැක කාගියාසී වැඩියයුතුයි.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත ධර්මයන් නවසීවථිකාවසයෙන් බලන්නාහට කායසම්මතවූ මේ ඇටසැකිලි වනාහි ගින්නෙහි ද අළුරැසක් ව යන දරුබඩයන් සෙයින් සුන්විසුන් විසින් වැටෙන්නාහුය යි සේයි.

තව ද මෙම රූපස්කන්ධසඞ්ඛ්‍යාත නවසීවථිකාවන් ධර්මාලම්බනප්‍රීතිවශයෙන් බලන යොගීහු විසින්.

ආයු උස්මා ච විඤ්ඤාණං යදා කායං ජහන්තිමං,
අපවිද්ධො තදා සෙති යථා කට්ඨං අචෙතනං. (1)

භොගබන්ධුපරිච්චත්තො පතිතො කම්මබන්ධනා,
එකතො කපණො සෙති ජඩ්ඩිතබ්බො ලහුං තදා. (2)

---

1. මේ ශරීරය රූපජීවිතෙන්ද්‍රිය කර්මජතෙජොධාතුවය විඤ්ඤාණය යන මොවුන් තුන්දෙන යම්කලෙක හැර පියද්ද ඒකල්හි ආයුෂාදීන් විසින් දමනලද්දේ අචෙතනස්කාෂ්ඨයක් මෙන් හෝනේයි.

2. භොගය බන්ධුය යන මොවුන් විසින් හරණලද්දේ කර්ම නැමැති බන්ධනයෙන් ගිලිහුණේ බැගෑවූයේ වහා ම දැමිය යුත්තේ හුදකලාවූයේ එකල්හි හෝනේයි.

ජෙගුච්ඡවිවටද්වාරෙ සජීවාකාරනිස්සටො,
අවිස්සාසපුරෙගබ්භාරෙ අවමඞ්ගලසජ්ජිතො. (1)

ගූථපිණ්ඩොව සඞ්කාරකූටාදීසු නිරත්ථකො,
කායො අපෙතවිඤ්ඤාණො අනපෙක්ඛෙහි ඡඩ්ඩිතො. (2)

ද්වීහතීහවයෙනෙව උද්ධුමාතකතං ගතො,
විරූපො හොති සුභීමො විජාතායපි මාතුයා. (3)

සබ්බෙ නීලත්තමායන්ති වණ්ණා සාමාදයො තතො,
පක්කභාවං ගතෙ පච්ඡා දෙහනිස්සිතලොහිතෙ. (4)

සහෙවාසුවිසොතෙහි පග්ඝරන්ති කිමී තතො,
ඡාදෙන්ති සකලං දෙහං සිද්ධභත්තපුටං විය. (5)

තථා පුබ්බං පග්ඝරන්ති භින්දිත්වාන ඉතොවිතො,
ඡින්නබන්ධනයන්තාව ජීජ්ජතෙ සන්ධිබන්ධනං. (6)

---

1. පිළිකුල් වූ විවෘත නවදොරක් ඇති සජීවාකාරයෙන් පහවූයේ දිවිනිරුඹවූ තැන් පටන් තමන් කෙරෙහි විශ්වාස නැති ජනයන් විසින් පිරිවරණලද්දේ අවමඟුලෙන් සදනු ලද්දේ.

2. කසලගොඩ ආදියෙහි නිරර්ථක අශුචිපිඩක් මෙන් විඥ්ඥාණයෙන් පහ වූ ශරීරය අපෙක්‍ෂා නැත්තවුන් විසින් දමනලද්දේ.

3. දෙතුන්දවසක් ඇවෑමෙන් ම ඉදිමුනුබවට පැමිණියේ වැදූමවට පවා අතිභයානක වූ විරූප වන්නේයි.

4. ඉක්බිතෙතන් සියලු ශ්‍යාමාදිවර්ණයෝ නිල්බවට පැමිණෙති පසුව ශරීරනිශ්‍රිතරක්තය පූයා බවට ගියකල්හි.

5. ඇතුලෙන් පිටතට වැගිරෙණ අශුචිධාරා හා එක් ව පණුවෝ වැගිරෙත් ඉක්බිතෙතන් ඉදුනු හැල්සාල් බත්මුලක් මෙන් සියලු ශරීරය වසාගණිත්.

6. එසේ ම ඔබිනොබින් සිල්ව කුණු වැගිරෙත් දිරාගිය බැඳුම් ඇති යතනුරූපයක් මෙන් ඇටසන්ධියෙහි නහරබන්ධන කුණුව වැටෙන්නේයි.

විකිණ්ණො භවෙය්‍ය කායො තත්‍ථ තත්‍ථ විභාගසො,
ඛාදිතො සොණකාදීහි දෙහභාවම්පි නොදති. (1)

අනිලාතපවුට්ඨීහි තුන්නො ජිණ්ණභාවමාගතො,
සබ්බ අස්සරධාසන්ති නාමම්පි නො භවෙ. (2)

යානිමානි අපත්ථානි අලාබූනෙව සාරදෙ,
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රති. (3)

යෙ පූතිකායම්හි කරොන්ති ඡන්දං
ජාතිං ජරං ව්‍යාධිමතො චුතිඤ්ච,
පුනප්පුනන්තෙ සමුපෙන්ති බාලා
බාලො යථා බෙනුමුපෙති වච්ඡො. (4)

තතො සරීරෙ බහුපද්දවාලයෙ
පහාය එතම්හි රතිං අසෙසතො,
විචින්තයන්තො පරමං ඉමං විධිං
තරෙය්‍ය ඛිප්පං භවසාගරම්බුධො. (5)

---

1. බලු ආදීන් විසින් කනලද ශරීරය ඒ ඒ තන්හි කොටස් බෙදී විසිරයන්නේය ඉක්බිතෙන් ශරීර සටහන් ද පහකරන්නේයි.

2. ඉක්බිත්තෙන් අව්සුලඟින් හා වැසෙසාන් ජීර්ණබවට පැමිණි කල්හි සියලු අභද්‍රත්‍යාදිහු අනාඩම්බරයට යෙති නම් පමණකුත් නො වන්නේය.

3. සරත්කාලයෙහි ඒ ඒ තැන දමනලද ලබු වැනි වූ කොබෝවන්පැහැ ඇති ඒ මිනීඇට දැක තොපට කවර නම් කාමරතියක් වන්නී ද ?

4. යම් කෙනෙක් කුණු ශරීරයෙහි ආලය කෙරෙත් නම් එහෙයින් ඒ බාල සත්ත්වයෝ මව් දෙන කරා නැවත නැවත එලඹෙන වස්සා මෙන් නැවතනැවත භවයෙහි ජාතිජරා ව්‍යාධිමරණ යන මේ දුක්ඛයන්ට පැමිණෙත්.

5. එහෙයින් බොහෝ උපද්‍රවයන්ට පිහිට වූ මේ ශරීරයෙහි ඇලුම් නිඃශේෂයෙන් ම හැරපියා නුවනැති පුද්ගල තෙම උතුම් වූ මෙම ක්‍රමය නුවනින් සිතන්නේ වහා ම සංසාරසාගරය තරණය කරන්නේයි.

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො–පෙ–
එවං අනෙකානිසංසං ඉමං කායගතාසතිං.

තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා,
ඵුසන්ති ධීරා නිබ්බාණං යොගක්ඛෙමං අනුත්තරන්ති (1)

මෙහි ජාත්‍යාදිදුඃඛනිර්දේශය ආදිකොට නවශිවථිකානිර්දේශය අන්ත කොට ඒ ඒ ධර්මයන් තත්තත් ස්වභාවයෙන් යථාභූතවයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

ක්ෂුද්‍රකාඛ්‍යායී විදර්ශනායි

මෙතෙකින් ශ්‍රී විමුක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනාභාවනා
සඞ්ග්‍රහයෙහි සතරවන ජාත්‍යාදි
දුඃඛසඞ්ග්‍රහය නිමි.

---

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් උදයව්‍යයානුපස්සනා ඤාණවශයෙන් බලනපරිදි කෙසේදයත් ?

අවිජ්ජාසමුදයා රූපසමුදයො තණ්හාසමුදයා රූපසමුදයො කම්මසමුදයා රූපසමුදයො ආහාරසමුදයා රූපසමුදයො අවිජ්ජානිරොධා රූපනිරොධො තණ්හානිරොධා රූපනිරොධො කම්මනිරොධා රූපනිරොධො ආහාරනිරොධා රූපනිරොධො; අවිජ්ජාසමුදයා වෙදනාසමුදයො තණ්හාසමුදයා වෙදනාසමුදයො කම්මසමුදයා වෙදනාසමුදයො ඵස්සසමුදයා වෙදනාසමුදයො අවිජ්ජානිරොධා වෙදනානිරොධො තණ්හානිරොධා වෙදනානිරොධො කම්මනිරොධා වෙදනානිරොධො ඵස්සනිරොධා වෙදනානිරොධො; අවිජ්ජාසමු

---

1. සමථවිදර්ශනා භාවනා කරන්නා වූ අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අභීෂ්ටාර්ථප්‍රතිලාභය දක්වා සතතයෙන් පැවති කායිකචෛතසිකවීර්‍ය්‍ය ඇති පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණියයුතු නිර්වාණයට නො පැමිණ අතරෙහි නොනවතිම්යි මෙසේ නිතර පැවති දෘඪවීර්‍ය්‍ය ඇති ඒ ප්‍රාඥයෝ කාමයොගාදි සතරයොගයෙන් නිර්භය වූ අනුත්තර වූ අත්‍යන්තශාන්ත වූ අමෘතමහානිර්වාණය විපාකයෙන් ස්පර්ශ කරන්නාහ (හෙවත් අරමුණුකිරීම් වශයෙන් නිවණට පැමිණෙන්නාහ.)

දයා සඤ්ඤාසමුදයො තණ්හාසමුදයා සඤ්ඤාසමුදයො ක
ම්මසමුදයා සඤ්ඤාසමුදයො ඵස්සසමුදයා සඤ්ඤාසමුදයො
අවිජ්ජානිරොධා සඤ්ඤානිරොධො තණ්හානිරොධා සඤ්ඤා
නිරොධො කම්මනිරොධා සඤ්ඤානිරොධො ඵස්සනිරොධා
සඤ්ඤානිරොධො; අවිජ්ජාසමුදයා සඞ්ඛාරසමුදයො තණ්හා
සමුදයා සඞ්ඛාරසමුදයො කම්මසමුදයා සඞ්ඛාරසමුදයො ඵස්ස
සමුදයා සඞ්ඛාරසමුදයො අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො
තණ්හානිරොධා සඞ්ඛාරනිරොධො කම්මනිරොධා සඞ්ඛාර
නිරොධො ඵස්සනිරොධා සඞ්ඛාරනිරොධො; අවිජ්ජාසමුදයා
විඤ්ඤාණසමුදයො තණ්හාසමුදයා විඤ්ඤාණසමුදයො
කම්මසමුදයා විඤ්ඤාණසමුදයො නාමරූපසමුදයා විඤ්ඤා
ණසමුදයො අවිජ්ජානිරොධා විඤ්ඤාණනිරොධො තණ්හා
නිරොධා විඤ්ඤාණනිරොධො කම්මනිරොධා විඤ්ඤාණනි
රොධො නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො; යනාදීන්
උදයව්‍යයානුපස්සනාඤාණවසයෙන් ද. (1)

---

1. සම්මර්ශනඥානය උපන් කල්හි නැවත ත්‍රෛභූමිකසං
ස්කාරයන් කෙරෙහි ම උදව්‍යය දෙක අවිද්‍යාවගේ රැස්වීම
කරණ කොටගෙණ රූපයාගේ පහලවීම වේ තෘෂ්ණාව රැස්
වීම කරණ කොටගෙණ රූපයාගේ පහලවීම වේ භවගාමික
ර්මයන්ගේ රැස්වීම කරණකොට ගෙණ රූපයාගේ පහලවී
ම වේ ආහාරය රැස්වීම කරණකොට ගෙණ රූපයාගේ පහ
ලවීම වේ යයි ද ප්‍රත්‍යයපරාමර්ශනය නො කොට හුදෙක්
රූපස්කන්ධයාගේ පහලවීම් ස්වභාවය දක්නේ ද රූපස්ක
න්ධයාගේ උදය දක්නේයි, එසේ ම අවිද්‍යාවගේ නිරොධය
කරණ කොටගෙණ රූපයාගේ නො පැවැත්ම වූ නිරොධ
ය වේ, තෘෂ්ණානිරොධයෙන් රූපනිරොධය වේ, කර්මනි
රොධයෙන් රූපනිරොධය වේ ආහාරනිරොධයෙන් රූප
නිරොධය වේ යයි ද ප්‍රත්‍යවශයෙන් නො ගෙණ හුදෙක්
රූපස්කන්ධයාගේ විපරිනාම ලක්ෂණය දක්නේ ද රූපස්ක
න්ධයාගේ ව්‍යය දක්නේයි, මෙසේ රූපස්කන්ධයෙහි ද; අව
ශෙෂ වෙදනා සංඥා සංස්කාර යන ස්කන්ධත්‍රයෙහි ද සතරව
න ආහාර ප්‍රත්‍යය හැර ඵස්සසමුදයා වෙදනාසමුදයො ඵස්සනි

තව ද මෙම ජාතිසඞ්ඛාත පච්චයක්ඛණයෙහි—අවිජ්ජම්පජානාති අවිජ්ජාසමුදයම්පජානාති අවිජ්ජානිරොධම්පජානාති රූපම්පජානාති රූපසමුදයම්පජානාති රූපනිරොධම්පජානාති තණ්හම්පජානාති තණ්හාසමුදයම්පජානාති තණ්හානිරොධම්පජානාති රූපම්පජානාති රූපසමුදයම්පජානාති රූපනිරොධම්පජානාති කම්මම්පජානාති කම්මසමුදයම්පජානාති කම්මනිරොධම්පජානාති රූපම්පජානාති රූපසමුදයම්පජානාති රූපනිරොධම්පජානාති ආහාරම්පජානාති ආහාරසමුදයම්පජානාති ආහාරනිරොධම්පජානාති රූපම්පජානාති රූපසමුදයම්පජානාති රූපනිරොධම්පජානාති; අවිජ්ජම්පජානාති අවිජ්ජාසමුදයම්පජානාති අවිජ්ජානිරොධම්පජානාති වෙදනම්පජානාති වෙදනාසමුදයම්පජානාති වෙදනානිරොධම්පජානාති තණ්හම්පජානාති තණ්හාසමුදයම්පජානාති තණ්හානිරොධම්පජානාති වෙදනම්පජානාති වෙදනාසමුදයම්පජානාති වෙදනානිරොධම්පජානාති කම්මම්පජානාති කම්මසමුදයම්පජානාති කම්මනිරොධම්පජානාති වෙදනම්පජානාති වෙදනාසමුදයම්පජානාති වෙදනානිරොධම්පජානාති ඵස්සම්පජානාති ඵස්සසමුදයම්පජානාති ඵස්සනිරොධම්පජානාති වෙදනම්පජානාති වෙදනාසමුදයම්පජානාති වෙදනානිරොධම්පජානාති;

---

රොධා වෙදනානිරොධො යනාදීන් ඵස්සය බහාලා විඤ්ඤාණ ස්කන්ධයෙහි ද සතරවන ස්පර්ශප්‍රත්‍යය හැර නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො යනුවෙන් නාමරූපය බහාලා කියනලද මේ සම පණස් ලක්‍ෂණයෙහි යථොක්ත අවිද්‍යාදි ප්‍රත්‍යයයන්ගේ සද්භාවයෙහි රූපාදීන් වීමය අවිද්‍යාදි ප්‍රත්‍යයන්ගේ අභාවයෙහි රූපාදීන් නොවීම යයි කියනලද ප්‍රත්‍යයවශයෙන් ද ප්‍රත්‍යය පරාමර්ශනය නො කොට නිර්වෘත්තිලක්‍ෂණමාත්‍ර විපරිනාමලක්‍ෂණමාත්‍රවශයෙන් දක්නා හෙයින් ලක්‍ෂණවශයෙන් දැයි එකී එකී ස්කන්ධයෙහි ප්‍රත්‍යයවශයෙන් සතරෙක ලක්‍ෂණවශයෙන් එකෙකැයි පඤ්චපඤ්චප්‍රකාර වූ උදයද පඤ්චවිධ වූ ව්‍යයදැයි දශ දශ උදව්‍යය දර්ශනවශයෙන් සම පණස් ආකාරයෙකින් පවත්නා ඥානය උදයව්‍යයානුපස්සනා ඥාන නම් වේ.

අවිජ්ජම්පජානාති අවිජ්ජාසමුදයම්පජානාති අවිජ්ජානිරොධම්පජානාති සඤ්ඤම්පජානාති සඤ්ඤාසමුදයම්පජානාති සඤ්ඤානිරොධම්පජානාති තණ්හම්පජානාති තණ්හාසමුදයම්පජානාති තණ්හානිරොධම්පජානාති සඤ්ඤම්පජානාති සඤ්ඤාසමුදයම්පජානාති සඤ්ඤානිරොධම්පජානාති කම්මම්පජානාති කම්මසමුදයම්පජානාති කම්මනිරොධම්පජානාති සඤ්ඤම්පජානාති සඤ්ඤාසමුදයම්පජානාති සඤ්ඤානිරොධම්පජානාති ඵස්සම්පජානාති ඵස්සසමුදයම්පජානාති ඵස්සනිරොධම්පජානාති සඤ්ඤම්පජානාති සඤ්ඤාසමුදයම්පජානාති සඤ්ඤානිරොධම්පජානාති; අවිජ්ජං-පෙ-සඞ්ඛාරෙ පජානාති සඞ්ඛාරසමුදයම්පජානාති සඞ්ඛාරනිරොධම්පජානාති තණ්හම්පජානාති තණ්හාසමුදයම්පජානාති තණ්හානිරොධම්පජානාති සඞ්ඛාරෙ පජානාති සඞ්ඛාරසමුදයම්පජානාති සඞ්ඛාරනිරොධම්පජානාති කම්මම්පජානාති කම්මසමුදයම්පජානාති කම්මනිරොධම්පජානාති සඞ්ඛාරෙ පජානාති සඞ්ඛාරසමුදයම්පජානාති සඞ්ඛාරනිරොධම්පජානාති ඵස්සම්පජානාති ඵස්සසමුදයම්පජානාති ඵස්සනිරොධම්පජානාති සඞ්ඛාරෙ පජානාති සඞ්ඛාරසමුදයම්පජානාති සඞ්ඛාරනිරොධම්පජානාති; අවිජ්ජම්පජානාති අවිජ්ජාසමුදයම්පජානාති අවිජ්ජානිරොධම්පජානාති විඤ්ඤාණම්පජානාති විඤ්ඤාණසමුදයම්පජානාති විඤ්ඤාණනිරොධම්පජානාති තණ්හම්පජානාති තණ්හාසමුදයම්පජානාති තණ්හානිරොධම්පජානාති විඤ්ඤාණම්පජානාති විඤ්ඤාණසමුදයම්පජානාති විඤ්ඤාණනිරොධම්පජානාති කම්මම්පජානාති කම්මසමුදයම්පජානාති කම්මනිරොධම්පජානාති විඤ්ඤාණම්පජානාති විඤ්ඤාණසමුදයම්පජානාති විඤ්ඤාණනිරොධම්පජානාති නාමරූපම්පජානාති නාමරූපසමුදයම්පජානාති නාමරූපනිරොධම්පජානාති විඤ්ඤාණම්පජානාති විඤ්ඤාණසමුදයම්පජානාති විඤ්ඤාණනිරොධම්පජානාති යනාදී අනුපස්සනාවන්ගේ වශයෙන් ද. (1)

---

1 යට කී පරිද්දෙන් ස්කන්ධයන්ගේ පහලවීමට හා විනාසයට ප්‍රත්‍යය වන අවිද්‍යා තෘෂ්ණා කර්ම ආහාර ස්පර්ශ නාම රූප යන මේ ප්‍රත්‍යයධර්මයන්ගේ හා ප්‍රත්‍යසමුත්පන්න

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චක්ඛන්ධයෙහි-රූපං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං. වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා සඤ්ඤා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා සඞ්ඛාරා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා විඤ්ඤාණං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං නාම්.

තත්ථ කතමං රූපං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔලාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං රූපං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං, තත්ථ කතමා වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔලාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ වා සන්තිකෙ වා සබ්බා වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, තත්ථ කතමා සඤ්ඤා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා යා කාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔලාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ වා සන්තිකෙ වා සබ්බා සඤ්ඤා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, තත්ථ කතමා සඞ්ඛාරා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගත

---

ධර්මයන්ගේ ස්වභාවය උත්පත්තිය නිරොධය යන මොවුන් පිළිවෙළින් ප්‍රකට ව දැන විදර්ශනාකිරීම අනුපස්සනාය යි කියනලදී.

පච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙ වා සන්තිකෙ වා සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, තත්ථ කතමං විඤ්ඤාණං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීණං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති; යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද. (1)

---

1. රූපය අනිත්‍යය සඞ්ඛතය ප්‍රත්‍යයසමුත්පන්නය ක්‍ෂයධර්මය ව්‍යයධර්මය විරාගධර්මය නිරොධධර්මය—වෙදනා—පෙ—නිරොධධර්මය යි සම්මර්ශනය කෙරෙයි මේ සඞ්ක්‍ෂෙපයි—විස්තර නම්—එකිඑකී ස්කන්ධය එකොළොස් එකොළොස් තැනකින් පිරිසිඳ සම්මර්ශනය කෙරෙයි-එනම් අතීතත්‍රිකයෙන්ද, අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා, යනාදීන් අජ්ඣත්තිකාදි සතරදුක වසයෙන්දූයි මෙසේ සියලු ම රූපය එකාදශාකාරයකින් කලාපවශයෙන් සංක්‍ෂෙප කොට අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කෙරෙයි; හෙවත් අතීතයෙහි උපන් රූපය වර්ත්තමානයට නො පැමිණ එහි ම නිරුද්ධය මතු උපදනා රූපය එහි ම නිරුද්ධ වන්නේය වර්ත්තමානයෙහි උපදින රූපය අනාගතයට නො පැමිණ එහි ම නිරුද්ධ වන්නේය එසේ ම අධ්‍යාත්මික බාහ්‍ය සූක්‍ෂ්ම ඖදාරික හීන ප්‍රණීත රූපාදීහු ඒ ඒ කාලයෙහි ම ඉපද නිරුද්ධ වන්නාහ යනාදීන් රාශිවශයෙන් ගනුලුවා ක්‍ෂයට පැමිණෙන අර්ථයෙන් අනිත්‍යය ආයාමාදිවශයෙන් නො පැමිණි සත්වය භයට කාරණ හෙයින් දුඃඛය අසාරාර්ථයෙන් අනාත්මයයි විදර්ශනා කරන්නේය, වෙදනාදියත් මෙසේමයි— මෙසේ අතීතම්පි රූපං අනිච්චං, අනාගතම්පි රූපං අනිච්චං යනාදීන් සම්මර්ශනය කරණ යොගී තෙම ක්‍ෂය ස්වභාවයෙන් ද ව්‍යයස්වභාවාදියෙන් ද සම්මර්ශනය කෙරෙයි.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චක්ඛන්ධයෙහි-රූපං අනිච්චතො පස්සති දුක්ඛතො පස්සති රොගතො පස්සති ගණ්ඩතො පස්සති සල්ලතො පස්සති අඝතො පස්සති ආබාධතො පස්සති පරතො පස්සති පලොකතො පස්සති ඊතිතො පස්සති උපද්දවතො පස්සති භයතො පස්සති උපසග්ගතො පස්සති චලතො පස්සති පභඞ්ගුතො පස්සති අද්ධුවතො පස්සති අතාණතො පස්සති අලෙනතො පස්සති අසරණතො පස්සති රිත්තතො පස්සති තුච්ඡතො පස්සති සුඤ්ඤතො පස්සති අනත්තතො පස්සති ආදීනවතො පස්සති විපරිණාමධම්මතො පස්සති අසාරකතො පස්සති අඝමූලතො පස්සති වධකතො පස්සති විභවතො පස්සති සාසවතො පස්සති සංඛතතො පස්සති මාරාමිසතො පස්සති ජාතිධම්මතො පස්සති ජරාධම්මතො පස්සති ව්‍යාධිධම්මතො පස්සති මරණධම්මතො පස්සති සොකධම්මතො පස්සති පරිදෙවධම්මතො පස්සති උපායාසධම්මතො පස්සති සංකිලෙසිකධම්මතො පස්සති. වෙදනා-පෙ-සඤ්ඤා-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං අනිච්චතො පස්සති-පෙ-(1)

---

1. රූපය අශාශ්වත බැවිනුත් පූර්වාපරකොටි ඇති බැවිනුත් අනිත්‍යහෙයින් දකී, උත්පාද ව්‍යය දෙකින් ක්ෂණක්ෂණයෙහි පෙළෙන බැවිනුත් දුකට වස්තු හෙයිනුත් දුක්හෙයින් දකී, සුදුසු ප්‍රත්‍යයයෙන් යපියයුතු බැවිනුත් සියලු රොගයන්ට මුල් බැවිනුත් රොගහෙයින් දකී. ත්‍රිවිධ දුඃඛ නැමැති රුජාවෙන් යුත් බැවිනුත් කෙලෙස් නැමැති අසුචි වහනය වන බැවිනුත් ජාතිජරාභඞ්ගයන්ගෙන් ඉදිම පැසී බිඳෙන් බැවිනුත් ගඩ හෙයින් දකී, පීඩා උපදවන හෙයිනුත් ඇතුළෙහි විදිනා හෙයිනුත් ආර්‍යමාර්ග නැමැති අඬුවෙන් මුත් නොහැරිය හැකි බැවින් උල් හෙයින් දකී, ගැරහියයුතු බැවිනුත් නො වැඩ එලවන හෙයිනුත් විපත්තියට වස්තු හෙයිනුත් පාප හෙයින් දකී, අනෛශ්වර්‍යභාවය හෙවත් පරවශ බව කරණ හෙයිනුත් ආබාධයට පිහිට වන බැවිනුත් ආබාධ හෙයින් දකී, ස්වවශයෙහි නො පවත්නා හෙයිනුත් නො දිරව නො මියව යි නියොග කොට නො වැළකිය හැකි

බැවිනුත් ජරහෙයින් දැකී, ව්‍යාධිජරාමරණයන්ගෙන් නස්නා බැවින් පළුදුහෙයින් දැකී, නො කටයුතු හා විපාකයින් ඵලවන හෙයින් ඊතිකම් වූ උවදුරු හෙයින් දැකී, නො දන්නාලද ම විපුල වූ අනර්ථයන් ඵලවන හෙයිනුත් සංවේගපදව යන්ට වැඩු හෙයිනුත් උපද්‍රව හෙයින් දැකී, සියලු භයට ආකර හෙයිනුත් දුඃඛව්‍යූපසම සංඛ්‍යාත පරමාශ්වාසයට ප්‍රතිපක්ෂහෙයිනුත් භය හෙයින් දැකී, නොයෙක් අනර්ථයන් අනුව බඳනාලද හෙයිනුත් අරමුණු හෙතු කොට ගෙණ සැපියයුතු හෙයින් රාගාදි දෙෂයන් විසින් ලගනාලද බැවිනුත් දෙවතුප සංහාර වසයෙන් පැවැති ව්‍යාධි ආදි අනර්ථයක් මෙන් ඉවසනට නුසුදුසු බැවිනුත් උපසර්ග හෙයින් දැකී, ව්‍යාධිය ජරාය මරණය යන මෙයිනුත් ලාභාදි අෂ්ටලොකධර්මයෙනුත් ප්‍රචලිත බැවින් චලහෙයින් දැකී, උපක්‍රමයෙනුත් ස්වරසයෙනුත් භඞ්ගයට එලඹෙන සුලු බැවින් ප්‍රභඞ්ගහෙයින් දැකී, වෘක්ෂඵලයන් මෙන් සියලු අවස්ථාවෙහි පතනය වන සිලිබැවිනුත් ස්ථිරභාවයාගේ අභාවයෙනුත් අධ්‍රුවහෙයින් දැකී, රක්ෂා නොකට හැකිබැවිනුත් නො ලැබිය හැකි ක්ෂෙම ඇති බැවිනුත් අත්‍රාණහෙයින් දැකී, සැඟවෙන අදහසින් ඇලෙනට නුසුදුසු බැවිනුත් ඇලුනවුන්ටද දුක් නැවැත්වීම වූ ලෙනකෘත්‍යය නොකරණ හෙයිනුත් අලෙන හෙයින් දැකී, ආශ්‍රය කල උන්ගේ ජාත්‍යාදි භය නොනසන බැවින් අසරණ හෙයින් දැකී, පරමාර්ථහෙයින් අවිද්‍යමානවූ බාලජන පරිකල්පිත ප්‍රකාර ඇති ධ්‍රැවශුභසුඛ ස්වභාවයෙන් සිස්වූ හෙයින් රිත්තහෙයින් දැකී, සිස්වූ හෙයින් ම ලාමක බැවින් හෝ තුච්ඡහෙයින් දැකී, ස්වාමිය නිවාසිය කාරකය වෙදකය අධිෂ්ඨායකය යන ආත්මයෙන් තොරවූ හෙයින් ශූන්‍ය හෙයින් දැකී, තමා ද අස්වාමකාදි ස්වභාව බැවින් අනාත්මහෙයින් දැකී, භවයෙහි පැවැත් ම දුක් බැවිනුත් දුඃඛයාගේ ද ආදීනව හෙයිනුත් කෘපණ මනුෂ්‍යයන් වැනි බැවින් ආදීනවහෙයින් දැකී, ජරා මරණ දෙකින් පෙරලෙන සුලු බැවින් විපරිනාමධර්මහෙයින් දැකී, දුර්වල බැවිනුත් ඵලයක් මෙන් අනායාසයෙන් බිඳෙන බැවිනුත් අසාරහෙයින් දැකී,

සනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද,

පාපයට හෙතු බැවින් අඝමූල හෙයින් දකී, විචිත්‍රමුඛ ඇති සතුරෙකු මෙන් විශ්වාසකළවුන් නසන හෙයින් වධකහෙයින් දකී, අභිවෘඬියෙන් පහවූ හෙයිනුත් තෘෂ්ණාදෘෂ්ටි නැමැති විභවයෙන් වූ හෙයිනුත් විභවහෙයින් දකී, ආශ්‍රවයන්ට ප්‍රත්‍යය වූ බැවින් ආශ්‍රව සහිතහෙයින් දකී, හෙතු ප්‍රත්‍යය දෙකින් කරණලද බැවින් සඞ්ඛතහෙයින් දකී, මෘත්‍යුමාරක්ලෙශමාරය යන මොවුන්ට ගොදුරු වූ බැවින් මාරාමිස හෙයින් දකී, ජාති, ජරා, ව්‍යාධි මරණ ධර්මහෙයින් දකී ශොකය පරිදෙවය උපායාසය යන මොවුන්ට හෙතු බැවින් ශොක, පරිදෙව, උපායාස ධර්මහෙයින් දකී, තෘෂ්ණාසංක්ලෙශය දෘෂ්ටිසංක්ලෙශය දුශ්චරිතසංක්ලෙශය යන මොවුන්ට විෂය ස්වභාවයෙන් සංක්ලෙශික ධර්මහෙයින් දකී, මෙසේ රූපස්කන්ධය අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කෙරෙයි වෙදනාදියත් මෙසේමැයි; මෙසේ ප්‍රභෙදහෙයින් කියනලද අනිත්‍යාදි සම්මර්ශනයාගේ වශයෙන් සම්මර්ශනය කෙරෙයි.

මෙහි වනාහි "අනිච්චතො පලොකතො චලතො පභඞ්ගුතො අධුවතො විපරිනාමධම්මතො අසාරකතො විභවතො සඞ්ඛතතො මරණධම්මතො" යි යනුවෙන් එකිඑකී ස්කන්ධයෙහි දශය දශය බැගින් පණසක් අනිච්චානුපස්සනායි; "පරතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො" යි යනුවෙන් එකිඑකී ස්කන්ධයෙහි පසක් පසක් බැගින් පස්විස්සක් අනත්තානුපස්සනායි; "දුක්ඛතො රොගතො" යනාදි සෙසු පස්විස්ස එකිඑකී ස්කන්ධයෙහි පස්විස්ස පස්විස්ස බැගින් එකසිය පස්විස්සක් දුක්ඛානුපස්සනායි.

අනත්තෙ පඤ්ච හොන්ති අනිච්චෙ හොන්තිමා දස
තා පඤ්චවීසතිච්චෙව යාව දුක්ඛෙ පවුච්චරෙ.

අනිච්චෙ හොන්ති පඤ්ඤාස අනත්තෙ පඤ්චවීසති,
සතං චාපි පඤ්චවීස හොන්ති දුක්ඛානුපස්සනා.

තව ද මෙම ප්‍රතිසම්භිදාප්‍රකරණයෙහි ‘උදයං අනුපස්සන්තො දිට්ඨිං පජහති වයං අනුපස්සන්තො සස්සතදිට්ඨිං පජහති වයං අනුපස්සන්තො ආයූහනං පජහති’ මෙහැම උදයව්‍යයානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ප්‍රතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධධර්මයන් අතිශයතර ප්‍රයොජනවශයෙන් උදයව්‍යයානුපස්සනාඥානයෙන් බලන යොගීහු විසින්.

රූපඤ්ච වෙදනා සඤ්ඤා සෙසා චෙතසිකා තථා
විඤ්ඤාණම්පි පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධාති භාසිතා. (1)

යථාපි නාවං නිස්සාය මනුස්සා යන්ති අණ්ණවෙ,
එවමෙව රූපං නිස්සාය නාමකායො පවත්තති. (2)

යථා මනුස්සෙ නිස්සාය නාවා ගච්ඡති අණ්ණවෙ
එවමෙව නාමං නිස්සාය රූපකායො පවත්තති. (3)

උභො නිස්සාය ගච්ඡන්ති මනුස්සා නාවං ච අණ්ණවෙ
එවං නාමඤ්ච රූපඤ්ච උභො අඤ්ඤමඤ්ඤනිස්සිතා. (4)

පරපච්චයතො ච ජායරෙ පරආරම්මණතො සමුට්ඨිතා.
ආරම්මණපච්චයෙහි ච පරධම්මෙහි ඉමෙ පභාවිතා (5)

---

1. රූපය වෙදනාවය සංඥාවය වෙදනාසංඥාදෙකින් අවශේෂ වූ පණිස් චෛතසිකයෝය විඥානය යන මොහු පස් දෙන පඤ්චස්කන්ධයහයි වදාරණලදහ.

2. යම්සේ නැව නිසා මිනිස්සු සමුද්‍රයෙහි යෙද්ද එපරිද්දෙන් ම රූපය නිසා නාම කය පවති.

3. යම්සේ මිනිසුන් නිසා නැව සමුද්‍රයෙහි යේද එපරිද්දෙන් ම නාමය නිසා රූපකය පවති.

4. මිනිස්හුද නැවද යන දෙදෙන ඔවුනොවුන් නිසා සමුද්‍රයෙහි යෙත්ද එපරිද්දෙන් ම නාමරූප දෙදෙන ඔවුනොවුන් නිසා පවත්නාහ.

5. අන්‍යධර්මයන්ගේ ජනකප්‍රත්‍යයභාවයෙන් උපදනාහ අන්‍යධර්මයන්ගේ උපනිශ්‍රයකප්‍රත්‍යය වූ ආලම්බනභාවයෙන් උපදනාහ තමා කෙරෙන් අන්‍යධර්ම වූ ආලම්බනප්‍රත්‍යයෙන් ද උපනිශ්‍රයජනකප්‍රත්‍යය දෙකින් ද මේ සඞ්ඛතයෙ' වඩනලදහ.

ඛන්ධා නිරුජ්ඣන්ති තදඤ්ඤො අපෙක්ඛො,
ඛන්ධානං භෙදො මරණන්ති වුච්චති,
එතසං බයං පස්සති අප්පමත්තො
මණිංව විජ්ඣං වජිරෙණ යොනිසො. (1)

ජීවිතං ව්‍යාධිකාලො ච දෙහනික්ඛෙපණං ගති,
පඤ්චෙතෙ ජීවලොකස්මිං අනිමිත්තා න ඤායරෙ. (2)

---

1. ස්කන්ධයෝ ම නිරුද්ධ වෙයි ස්කන්ධවිනිර්මුක්ත වූ ආත්මාදි කිසිවෙක් නැත්තේය ස්කන්ධයන්ගේ භෙදය මරණයයි කියනු ලැබේ, ඒ ස්කන්ධයන්ගේ ක්ෂණක්ෂණයෙහි වැටහෙන භඞ්ගය අප්‍රමාද ප්‍රතිපත්තියෙන් යුක්ත වූයේ නුවනින් බලයි, කුමක්මෙන් ද යත් වජ්‍රයෙන් නුවනින් මැණික විදින්නෙකු මෙනි; යම්සේ උපායෙන් මැණික විදින්නා මැණිකෙහි සිදුර ම බලා මෙනෙහි කෙරේ ද මැණිකෙහි වර්ණාදිය නො බලා ද එසේ ම සංස්කාරයන්ගේ නිරන්තරයෙන් භඞ්ගයම නුවනින් මෙනෙහි කෙරෙයි සංස්කාරයන් මෙනෙහි නො කෙරෙයි; නොහොත් වජ්‍රයෙන් මැණික විදිනා කල විද්දතැන නැවත නො නැගේද එපරිද්දෙන් වජ්‍රසදෘශභඞ්ගානුදර්ශනඥානයෙන් භඞ්ගය දුටුකල නැවත නිත්‍යග්‍රහණය නො වැඩේ ද එසේ ම භඞ්ගය දකී.

2. මෙපමණකල් ම ජීවත්වියයුතුය මෙයින් මතු නැතැයි ව්‍යවස්ථා නොකටහැකිහෙයින් ජීවිතයද මේ රෝගයෙන් මිස අන් රෝගයකින් සත්ත්වයෝ නො මැරෙති යි ව්‍යවස්ථා නොකට හැකිහෙයින් ව්‍යාධියද මේ කාලය මිස අන් කලක සත්ත්වයෝ නො මැරෙතියි වෙන්කොටලිය නොහැකි බැවින් කාලය ද මැරෙණ සත්තුන්ගේ සිරුරු අසවල්තැන මිස සෙසු තැනක නො දැමිය යුතුයයි වෙන් නොකට හැකි හෙයින් ශරීරනික්ෂෙපය ද මෙලොවින් චුතවන සත්ත්වයා අසවල් ගතියේ මිස අන් ගතියක නූපදියයි වෙන් නොකට හැකි හෙයින් ගතියද යන මේ පස සත්ත්වලොකයෙහි නිමිත්තරහිතයහ නො දත්නාලැබෙත්.

කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
යොධෙථ මාරං පඤ්ඤායුධෙන
ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියාති. (1)

ශනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම අර්ථය ප්‍රකාශ කොට බලන යොගීහු විසින්–

ආදානනික්ඛෙපණතො වයොවුඩ්ඪත්ථගාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො
ධම්මතාරූපතො සත්ත විත්ථාරෙන විපස්සති. (2)

කලාපතො ච යමතො ඛණිකතො පටිපාටිතො
දිට්ඨිඋග්ඝාටනා මානසමුග්ඝාතනතොපි ච
නිකන්තිපරියාදානා සත්තාරූපවිපස්සනා. (3)

---

1. ප්‍රාඥ වූ කුලපුත්‍ර තෙම තමාගේ මේ ශරීරය කුලාලභාජනයක් මෙන් බිඳෙන සුලු යයි දැනගෙණ තමාගේ මේ විදර්ශනාචිත්තය පසමිතුරන් විසින් නො බිඳියහැකි සුරක්ෂිත නුවරක් මෙන් කෙලෙස් සතුරන් විසින් පැරදවිය නො හැකි කොට තබා ගෙණ විදර්ශනාමය වූ ද ආර්‍ය්‍යමාර්ගමය වූ ද ප්‍රඥා නැමැති ආයුධයෙන් ක්ලෙශමාරයා කපන්නේය දිනන ලද හෙවත් උපදවනලද තරුණ විදර්ශනාව ද රක්නේය අනාලය වන්නේය හෙවත් සමාපත්තියෙහි ආලය නො කරන්නේය.

2. භවග්‍රහණ විසර්ජනයෙන් හෙවත් ජාතිමරණ දෙකින් ද වයස්වශයෙන් වැඩුනු රූපයාගේ විනාශහෙයින් ද ආහාරජරූපහෙයින් ද ඍතුජරූපහෙයින් ද කර්මජරූපහෙයින් ද චිත්තජරූපහෙයින් ද අයලොහතුම්පාෂාණාදි භෙද ඇති නොයෙක් සටහන් ඇති ස්වභාවයෙන් සිද්ධ වූ ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ නොවූ ධර්මතාරූපහෙයින් දැයි යන මේ සප්තප්‍රකාරයෙන් විස්තරයෙන් සම්මර්ශනය කෙරේ.

3. කලාපහෙයින් ද යුගලහෙයින් ද ක්ෂණිකහෙයින් ද පටිපාටිහෙයින් ද දෘෂ්ටිඋද්ඝාටනහෙයින් ද මානසමුද්ඝාතන හෙයින් ද නිකාන්ති පර්‍ය්‍යාදාන හෙයින් ද සම්මර්ශනය කෙරෙයි මෙසේ මේ සප්තාරූපවිදර්ශනාවෝ යි.

දුක්ඛං තෙභූමකං වට්ටං තණ්හා සමුදයො භවෙ
නිරොධො නාම නිබ්බාණං මග්ගො ලොකුත්තරොමතො.(1)

නාබාධකං යතො දුක්ඛං දුක්ඛා අඤ්ඤං න බාධකං
බාධකත්තනියාමෙන තතො සච්චමිදං මතං. (2)

තං විනා නාඤ්ඤතො දුක්ඛං න හොති නච තං තතො,
දුක්ඛහෙතු නියාමෙන ඉති සච්චං විසත්තිකා. (3)

නාඤ්ඤා නිබ්බාණතො සන්ති සන්තං නච න තං යතො,
සන්තභාවනියාමෙන තතො සච්චමිදං මතං. (4)

---

1. ත්‍රෛභූමිකවෘත්තය දුඃඛසත්‍ය නම් වෙයි එකසියඅටක් ප්‍රභෙද වූ තෘෂ්ණාව සමුදයසත්‍යය නම් වෙයි මාර්ගඵලයන් අරමුණු කොට ඇති අසංස්කෘතධර්මය නිරොධසත්‍ය නම් වෙයි නිරොධගාමිනී ප්‍රතිපද්නාමයෙන් කියනලද මාර්ගය ලොකොත්තරමාර්ගයයි දත්නාලදී.

2. යම් කරුණෙකින් දුඃඛය තෙමේ නො පෙළන්නෙන් නොවේ ද දුක්ඛයෙන් පිටත් බාධකයෙක් නැද්ද ඒ කරුණෙන් බාධකබැවින් දුක්ඛය බාධකමය දුක්ඛය ම හෝ බාධකයයි දෙපරිද්දෙකින් පෙළනබව නියමහෙයින් මේ දුක්ඛය සත්‍යයයි දත්නාලදී.

3. ඒ විසත්තිකා නම් තෘෂ්ණාව මිස අනිකෙකින් දුක්ඛය නොවේ ද ඒ දුක්ඛය ඒ තෘෂ්ණාවෙන් නොවන්නේ නොවේද මෙසේ දුක්ඛයට හෙතු භාවයෙහි නියමයෙන් තෘෂ්ණා තොමෝ සත්‍යනම් වේ; අවශෙෂ ක්ලෙශාදීන්ගේ දුක්ඛ හෙතුභාවය ඇතත් තෘෂ්ණාව විනා ඔවුන්ගේ දුක්ඛහෙතු භාවය නොවෙයි ඔවුන් විනා ද තෘෂ්ණාවගේ දුක්ඛහෙතු භාවය වේ.

4. යම් කරුණෙකින් නිර්වාණය හැර අනික් ශාන්තියෙක් නැද්ද ඒ නිර්වාණය අශාන්ත නොවේ ද ඒ කාරණයෙන් ශාන්තභාවනියමයෙන් මේ නිර්වාණය සත්‍යයයි දත්නාලදී.

මග්ගා අඤ්ඤං න නිය්‍යාණං අනිය්‍යාණො නචාපි සො,
තච්ඡනිය්‍යාණභාවත්තා ඉති සො සච්චසම්මතො. (1)

ඉති තච්ඡාවිපල්ලාස භූතභාවං චතුස්වපි,
දුක්ඛාදීස්වවිසෙසෙන සච්චට්ඨං ආහු පණ්ඩිතාති. (2)

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපච්චයතාදිධර්මයන් ඝටපටාදීන්ගේ උදයව්‍යය දක්නා කුම්භකාරයකු සෙයින් උදයව්‍යයානුපස්සනා ඥාණයෙන් බලා ආරබ්ධවිදර්ශකව නිවන් අරමුණු කොට පවත්නාවූ උදයව්‍යයානුපස්සනාඥාණයෙන් ධර්මයන් අප්‍රමාදව සිත්හි ලා වඩන්නාහට පරිකර්මභූමියෙහි පටන් ලොකොත්තරධ්‍යානවිපාකපර්‍යවසාන කොට විදර්ශනාභාවනා සඞ්ඛ්‍යාත සියලු ම මාර්ගභාවනාවෝ යථාක්‍රම යෙන් වැඩෙන්නාහුගයි සේයි.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපච්චයතාදිධර්මයන් ධර්මාලම්බනප්‍රීතිවශයෙන් උදයව්‍යයානුපස්සනාඥාණයෙන් බලන යොගීහු විසින්.

සලක්ඛණපරිවජ්ජෙන පච්චයායත්තවුත්තිකෙ,
කායෙ නිබ්බිරියාභොගෙ කුතො සත්තොපලබ්භති. (3)

---

1. මාර්ගය හැර නිර්‍යාණයෙක් නැද්ද ඒ මාර්ගය අනෛර්‍යාණික නොවේ ද මෙසේ තථ්‍යව නිර්‍යාණ වූ බැවින් ඒ මාර්ගය සත්‍යයයි දන්නාලදී.

2. මේ විවිධ නියමයෙන් තථ්‍යවූ අවිපර්‍යාශ වූ විද්‍යමානභාවය දුඃඛාදි සතරෙහි ම සාමාන්‍යයෙන් ප්‍රාඥයෝ සත්‍යාර්ථය කීහු.

3. කර්කශත්වාදි තමතමන්ගේ ලක්ෂණයෙන් පිරිසුන් කර්කශත්වාදි ස්වභාව මාත්‍රයමුත් අන් කිසිවක් නැති උත්පාදාදි අවස්ථාවෙහි තමතමන්ට නිසි ප්‍රත්‍යයන් අයිති ව පවත්නාහෙයින් ප්‍රත්‍යයායත්ත උත්පාදාදි ප්‍රවෘත්ති ඇති ප්‍රත්‍යයයන් නිසා වන්ටද ඔවුනොවුන් සහජාතවන්ටද උත්සාහ ආභොග නැති පඨවිධාත්වාදි භූතොපාදරූපසමූහයෙහි සත්වයෙක් නම් කොයින් ද? කවර ප්‍රකාරයෙකින් ලැබේද ? නොලැබෙන්නේයි.

නාමඤ්ච රූපඤ්ච ඉධත්ථි සච්චතො
නහෙත්ථ සත්තො මනුජො ච විජ්ජති,
සුඤ්ඤං ඉදං යන්තමිවාභිසංඛතං
දුක්ඛස්ස පුඤ්ජො තිණකට්ඨසාදිසො. (1)
දුක්ඛමෙව හි සම්භොති දුක්ඛං තිට්ඨති වෙති ච,
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤං දුක්ඛා නිරුජ්ඣති. (2)
යමකං නාමරූපං ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා,
එකස්මිං භිජ්ජමානස්මිං උභො භිජ්ජන්ති පච්චයා. (3)
යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං,
ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං. (4)
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො-පෙ-
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං

---

1. පරමාර්ථයෙන් නාමරූපදෙක මේ ශරීරයෙහි ඇත්තේය මේ ශරීරයෙහි සත්ත්වයෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ නැත්තේය මේ ශරීරය දරු ආදියෙන් කරණලද යන්ත්‍රරූපයක් මෙන් ජීවශූන්‍යය ප්‍රත්‍යයන් නිසා පවත්නා නිත්‍යාතුරබැවින් දුඃඛරාශියය ආත්මශූන්‍යබැවින් තෘණ කාෂ්ඨ සදෘශයි.

2. ත්‍රිවිධදුඃඛයම තමාගේ ප්‍රත්‍යයෙන් උපදියි එම දුඃඛය ක්ෂණස්ථිති ප්‍රබන්ධස්ථිති වශයෙන් සිටිනේය ක්ෂණනිරොධ ආයුඃක්ෂණනිරොධාදිවශයෙන් නිරුද්ධ වන්නේය දුකින් පිටත් අන්කිසි ධර්මයෙක් නො වන්නේය දුකින් පිටත් අන්කිසි ධර්මයෙක් නිරුද්ධ නො වේ.

3. නාමරූප දෙක යුගලය දෙදෙන ඔවුනොවුන් නිසා පවත්නාහ, එකක් බිඳෙනකල ඔවුනොවුන්ට ප්‍රත්‍යය වූ දෙදෙනම බිඳෙත්.

4. භාවනායෙහි නියුක්ත මහණ තෙම යම්යම් කලෙක රූපාදි පඤ්චස්කන්ධයන්ගේ පස්විසි ආකාරයෙන් උදය හා පස්විසි ආකාරයෙන් ව්‍යය සන්මර්ශනය කෙරේ ද එකල්හි මෙසේ සම පණස් ආකාරයෙන් ස්කන්ධයන්ගේ උදයව්‍යය සලකන මහණ යම් ධර්මප්‍රීතියක් යම් ධර්මප්‍රමොද්‍යයක් ලබාද සප්‍රත්‍යය වූ නාමරූපධර්මයන් ප්‍රකට ව වැටහෙනකල්හි උපන්නා වූ ඒ ප්‍රීතිප්‍රමොද්‍යය අමෘතමහානිර්වාණයට පමුණුවනහෙයින් නුවනැත්තන්ට අමෘත නම් වේ.

යො ච වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයං. (1)

යො ච වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො ධම්මමුත්තමං. (2)

අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො,
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා. (3)

මොවුන් උදයව්‍යයානුපස්සනාඥාණවශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම්වූ විදර්ශනාභාවනා සඞ්ග්‍රහයෙහි පස්වන උදයව්‍යයානුපස්සනාඥාණ සඞ්ග්‍රහය නිමි.

---

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් තිලක්ඛණානුපස්සනාඥාණයෙන් ප්‍රත්‍යේකවශයෙන් බලනපරිදි කිසේයයත් ?

රූපං අනිච්චං වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා සඞ්ඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්චන්ති.

---

1. පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය දෙක නො දක්නා යම් පුද්ගලයෙක් අවුරුදු සියයක් ජීවත් වී නමුත් ඔහුගේ ජීවත්වීමට වඩා ස්කන්ධයන්ගේ උදයව්‍යය නුවනැසින් දක්නැකියුහුගේ එක දවසකුදු ජීවත්වීම උත්තමයි.

2. උත්තම නවලොකොත්තරධර්මය නුවනැසින් නො දක්නා යම් පුද්ගලයෙක් අවුරුදු සියයක් ජීවත් වී නමුදු ඔහුගේ ජීවත්වීමට වඩා උත්තම නවලොකොත්තරධර්මය නුවනැසින් දක්නා පුද්ගලයාගේ එක දවසකුදු ජීවත්වීම උත්තමයි.

3. ශක්‍රදෙවෙන්ද්‍ර තෙම අප්‍රමාදභාවය හෙතු කොටගෙණ දෙව්රජබවට පැමිණියේය, නොපමා බව සියලු ලෞකිලොකොත්තරගුණවිශෙෂයන්ගේ ප්‍රතිලාභයට කාරණ හෙයින් බුඩාදි පණ්ඩිතවරයෝ ප්‍රශංසා කෙරෙති, පමාබව හැමකල්හි ම සියලු විපත්තියට කාරණහෙයින් බුඩාදි ආර්‍ය්‍යයන් විසින් නින්‍දාකරණලදී.

තත්ථ කතමං රූපං අනිච්චං ? කෙසා අනිච්චා ලොමා අනිච්චා නඛා අනිච්චා දන්තා අනිච්චා තචො අනිච්චං මංසං අනිච්චං නහාරූ අනිච්චා අට්ඨී අනිච්චා අට්ඨිමිඤ්ජා අනිච්චා වක්කං අනිච්චං හදයං අනිච්චං යකනං අනිච්චං කිලොමකං අනිච්චං පිහකං අනිච්චං පප්ඵාසං අනිච්චං අන්තං අනිච්චං අන්තගුණං අනිච්චං උදරියං අනිච්චං කරීසං අනිච්චං මත්ථලුඞ්ගං අනිච්චං පිත්තං අනිච්චං සෙම්හං අනිච්චං පුබ්බො අනිච්චො ලොහිතං අනිච්චං සෙදො අනිච්චො මෙදො අනිච්චො අස්සු අනිච්චං වසා අනිච්චා ඛෙළො අනිච්චො සිඞ්ඝානිකා අනිච්චා ලසිකා අනිච්චා මුත්තං අනිච්චන්ති ඉති රූපං අනිච්චං.

තත්ථ කතමා වෙදනා අනිච්චා ? සුඛා වෙදනා අනිච්චා දුක්ඛා වෙදනා අනිච්චා සොමනස්සා වෙදනා අනිච්චා දොමනස්සා වෙදනා අනිච්චා අදුක්ඛමසුඛා වෙදනා අනිච්චාති ඉති වෙදනා අනිච්චා.

තත්ථ කතමා සඤ්ඤා අනිච්චා? රූප සඤ්ඤා අනිච්චා සද්ද සඤ්ඤා අනිච්චා ගන්ධසඤ්ඤා අනිච්චා රස සඤ්ඤා අනිච්චා ඵොට්ඨබ්බසඤ්ඤා අනිච්චා ධම්මසඤ්ඤා අනිච්චාති ඉති සඤ්ඤා අනිච්චා.

තත්ථ කතමෙ සඞ්ඛාරා අනිච්චා? පුඤ්ඤාභිසඞ්ඛාරා අනිච්චා අපුඤ්ඤාභිසඞ්ඛාරා අනිච්චා ආනෙඤ්ජාභිසඞ්ඛාරා අනිච්චා කායසඞ්ඛාරා අනිච්චා වචීසඞ්ඛාරා අනිච්චා චිත්තසඞ්ඛාරා අනිච්චාති ඉති සඞ්ඛාර අනිච්චා.

තත්ථ කතමං විඤ්ඤාණං අනිච්චං ? චක්ඛුවිඤ්ඤාණං අනිච්චං සොතවිඤ්ඤාණං අනිච්චං ඝාණවිඤ්ඤාණං අනිච්චං ජිව්හාවිඤ්ඤාණං අනිච්චං කායවිඤ්ඤාණං අනිච්චං මනොවිඤ්ඤාණං අනිච්චන්ති ඉති විඤ්ඤාණං අනිච්චං.

ඵෙණපිණ්ඩූපමං රූපං වෙදනා බුබ්බුලූපමා
මරීචිකූපමා සඤ්ඤා සඞ්ඛාරා කදලූපමා
මායූපමං ච විඤ්ඤාණං දෙසිතාදිච්චබන්ධුනාති.

'ඉති නාමං අනිච්චං ඉති රූපං අනිච්චං ඉති නාමරූපං අනිච්චන්ති' යනාදීන් අනිත්‍යවශයෙන් ද.

කතමං ච භික්ඛවෙ දුක්ඛං අරියසච්චං ? ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. (1)

---

1. මහණෙනි දුඃඛාර්‍ය්‍යසත්‍යය කවරේද ? ජාතිය හෙවත් ඉපදීම ද දුක්වන්නීය ජරාවද දුක්වන්නීය ව්‍යාධියද දුක්වන්නේය මරණයද දුක්වන්නේය ශොකය විලාපය කායික දුක්ඛවෙදනාවය මානසිකදුක්ඛවෙදනාවය දැඩි ආයාසය යන මොහු ද දුක්වන්නාහ, යමක් පතමින් නොලබාද හෙද දුක්වන්නේය සංක්‍ෂෙපාර්ථයෙන් ආශ්‍රවසහිත ස්කන්ධ පස දුක් වන්නාහ.

ඒ ඒ නානාප්‍රකාරසත්ත්වයන්ගේ ඒ ඒ ගති ආදියෙහි ආත්මභාවප්‍රතිලාභය ජාති නම්, ඒ ජාති තොමෝ නොයෙක් දුකට වස්තුවනබැවින් දුක් නම් වේ; විස්තර යට කී නයින් දතයුතු — එසේ පහල වූ ආත්මභාවයාගේ පරණවීම ජරා නම්, ඕතොමෝ කායික මානසික සියලු දුකට වස්තුවනබැවින් දුක් නම් වේ — එක භවයකට ඇතුළත් එම ආත්මභාවයාගේ අවසන්වීම මරණ නම්, ඒ සියලු කායිකමානසික දුකට වස්තුවනබැවින් දුක් නම් වේ — ඥාතිව්‍යසනාදීයෙන් ස්පර්ශකරණලද්දහුගේ චිත්තසන්තාපය ශොක නම්, ඒ අර්ථවශයෙන් දෞර්මනස්සමයි, ජරාදී නොයෙක් දුක් එලවනබැවින් දුක් නම් වේ, කෙසේද යත් ? දුර්වල වූ ද ශොකයෙන් වහා ජරාවට පැමිණෙන බැවින් ශොකය ජරාවද එලවයි, බලවත් ශොකයෙන් අතිසාරාදිරොග වනබැවින් ශොකය ම ව්‍යාධිද එලවයි, විපුල බවට පැමිණි ශොකයෙන් ලය පැලීමියන බැවින් ශොකය ම මරණයද එලවයි — ශොකාතුරයාගේ වාග්විලාපය පරිදෙව නම්, වැලපෙන්නහුගේ උගුර තොල් තාලු වියලීමාදියෙන් ශොකයට වඩා බලවත් දුකට පැමිණෙන බැවින් දුක් නම් වේ — කයෙහි හට ගත් දුක්ඛවෙදනා දුක්ඛ නම්, මේ කායික දුක්ඛය කය පෙළනහෙයිනුත් වැඩි කොට මානසික දුක උපදවන හෙයිනුත් විශෙෂයෙන් දුකැයි වදරණලදී — සිතෙහි හටගත් දුක්ඛ

කතමා ච භික්ඛවෙ ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති භික්ඛවෙ ජාති.

කතමා ච භික්ඛවෙ ජරා? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති භික්ඛවෙ ජරා.

කතමංච භික්ඛවෙ මරණං? යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදො කළෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදං වුච්චති භික්ඛවෙ මරණං.

කතමො ච භික්ඛවෙ සොකො? යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො අයං වුච්චති භික්ඛවෙ සොකො.

---

වෙදනාව දෞර්මනස්ස නම්, ඒ සිත කය දෙක පෙළීමාදී බලවත් නොයෙක් දුක් එලවනහෙයින් දුක් නම් වේ — ඥාතිව්‍යසනාදියෙන් ස්පර්ශකරණලද්දහුගේ බලවත් චිත්තදුක්ඛයෙන් උපයනලද දැඩි වූ පරිශ්‍රමය උපායාස නම්, ඒ බලවත් සිත්තැවුලි ආදී දුක් එලවනහෙයින් දුක්ඛ නම් වේ — තමා විසින් ප්‍රාර්ථනා කරණලද යම්කිසි වස්තුවක්හුගේ නො ලැබීම ඉච්ඡිතාලාභ නම්, නො ලැබිය යුත්තු පතන ඉච්ඡාව කාරණ කොට ඇති වෙහෙසය ඉච්ඡිතාලාභදුක්ඛ නම් වේ — ආශ්‍රව සහිත රූපාදි ස්කන්ධයෝ පඤ්චොපාදානස්කන්ධ නම් වෙත්, ජාත්‍යාදි කොට සර්වඥයන්වහන්සේ විසින් වදාළ හෝ වදාළනාක් සියලු ම දුක් මේ ස්කන්ධයන්ගෙන් වෙන් නොවී මෙහි ම ඇතුළත්වන බැවින් සංක්ෂෙපාර්ථයෙන් පඤ්චොපාදනස්කන්ධයෝ දුක් යයි වදාරණලද්දහ.

කතමො ච භික්ඛවෙ පරිදෙවො? යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං අයං වුච්චති භික්ඛවෙ පරිදෙවො.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං? යං ඛො භික්ඛවෙ කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං.

කතමඤ්ච භික්ඛවෙ දොමනස්සං? යං ඛො භික්ඛවෙ චෙතසිකං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චති භික්ඛවෙ දොමනස්සං.

කතමො ච භික්ඛවෙ උපායාසො යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං අයං වුච්චති භික්ඛවෙ උපායාසො.

කතමඤ්ච භික්ඛවෙ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං? ජාතිධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න ජාතිධම්මා අස්සාම න ච වත නො ජාති ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

ජරාධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න ජරාධම්මා අස්සාම න ච වත නො ජරා ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

ව්‍යාධිධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න ව්‍යාධිධම්මා අස්සාම න ච වත නො ව්‍යාධි ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

මරණධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න මරණධම්මා අස්සාම න ච වත නො මරණං ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

සොකධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න සොකධම්මා අස්සාම න ච වත නො සොකො ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං. ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

පරිදෙවධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න පරිදෙවධම්මා අස්සාම න ච වත නො පරිදෙවො ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

දුක්ඛධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහොවත මයං න දුක්ඛධම්මා අස්සාම න ච වත නො දුක්ඛං ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

දොමනස්සධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න දොමනස්සධම්මා අස්සාම න ච වත නො දොමනස්සං ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

උපායාසධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න උපායාසධම්මා අස්සාම න ච වත නො උපායාසො ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, ඉදං වුච්චති භික්ඛවෙ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

කතමෙ ච භික්ඛවෙ සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා? රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධොති, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛාති.

යනාදී දුක්ඛානුපස්සනාඤාණවසයෙන් ද.

චක්ඛුං අනත්තා රූපං අනත්තා සොතං අනත්තා සද්දා අනත්තා ඝාණං අනත්තා ගන්ධා අනත්තා ජිව්හා අනත්තා රසා අනත්තා කායො අනත්තා ඵොට්ඨබ්බා අනත්තා මනො අනත්තා ධම්මා අනත්තාති–යනාදීන් අනත්තානුපස්සනාඤාණවසයෙන්ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතපඤ්චස්කන්ධයෙහි මෙපෙරෙවත් නුඹුස්හි පහළ විදුලියක් සෙයින් අනිත තණඅග පිනිබිඳක් සෙයින් අනිත දියෙහි ඇඳි රේඛාවක් සෙයින් අනිත මිරිඟු දස්නක් සෙයින් අනිත මුහුදු ජලපෙළක් සෙයින් අනිත.

තව ද මෙපෙරෙවත් ගජපියවරට පත් කිකිළිබිජක් සෙයින් දුක දෙකෙළවර ගිනිගත් ගුණ්පුරුකක් මැද තැවෙන සුනුණු බිලිඳක්හු සෙයින් දුක කඩිසිනිජලෙක්හි හසුවූ ගැඩවිල් බිලිඳක්හු සෙයින් දුක දැල හසුවූ මසකුසෙයින් දුක අත්පා සිඳ හරණලද දරුබිලිඳක්හු සෙයින් දුක.

තව ද මෙපෙරෙවත් අනත් බැවින් පැන්පවස් ඇතියක්හට මිහඳවෙව්හි පෙණෙන මිරිඟු දස්නක් සෙයින් අනත සිතිඝම් කළ ගින්නක් සෙයින් අනත සිහිනෙන් වැලඳූ භොජනයක් සෙයින් අනත සිහිනෙන් දුටු රූපයක් සෙයින් අනත අහස්පතක් සෙයින් අනත අහස්හි පහළ විදුලියක් සෙයින් අනත දියෙහි නැගි බුබුලක් සෙයින් අනත දියෙහි නැගි පෙණපිඩක් සෙයින් අනත දියෙහි නැගී රළපහරක් සෙයින් අනත දියෙහි නැගි ගින්නක් සෙයින් අනත පිදුරෙහි නැගි ගින්නක් සෙයින් අනත අතින් ගිලිහුණු සැරයක් සෙයින් අනත සව්ම්මායාකරඩයක් සෙයින් අනත යනාදීන් උන්තානුගත උපමානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතපඤ්චස්කන්ධයෙහි–රූපං අනිච්චතො පස්සති–පෙ–පලොකතො චලතො පභඞ්ගතො අධුවතො විපරිනාමධම්මතො අසාරකතො විභවතො සඞ්ඛතතො මරණධම්මතො පස්සති, වෙදනං–පෙ–සඤ්ඤං–පෙ–සඞ්ඛාරෙ–පෙ–විඤ්ඤාණං අනිච්චතො පස්සති–පෙ–යනාදීන් අනිච්චානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතපඤ්චස්කන්ධයෙහි—රූපං දුක්ඛතො පස්සති–පෙ–සංකිලෙසිකධම්මතො පස්සති, වෙදනං–පෙ–සඤ්ඤං–පෙ–සඞ්ඛාරෙ–පෙ–විඤ්ඤාණං දුක්ඛතො පස්සති–පෙ–සංකිලෙසිකධම්මතො පස්සති, යනාදීන් දුක්ඛානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධයෙහි—රූපං පරතො පස්සති-පෙ-රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො පස්සති, වෙදනං-පෙ- සඤ්ඤං- පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං පරතො පස්සති-පෙ-අනත්තතො පස්සති, යනාදීන් අනත්තානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධයෙහි—මෙපෙවෙත් නයි ඔත් තුඹසක් සෙයින් සැකසහිතය වග් ඔත් බැද්දක් සෙයින් භය සහිතය, රකුස්සෙකු පිරිගත් විලක් සෙයින් තැතිගැණුම් සහිතය, තව ද මෙපෙවෙත් බැලූබැලූසේ අසාරය සිතුසිතූසේ පිළිකුල, "අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ න හි නො සංගරන්තෙන මහාසෙනෙන මච්චුනා" යි යනාදීන් අද නස්සිය සෙට නස්සිය යන නියමයක් නැත්තේය.

තව ද මෙපෙවෙත් ඉපද නස්නාගෙයින් අනිත්‍යය ඉරියව් පිරිවැටලීමෙන් මිස නොපවත්නා හෙයින් දුඃඛය තමා විසිය නොපවත්නා හෙයින් අනාත්මය අනිත් බව සනතති ව පවත්නා හෙයින් මුවාසි දුක් ලකුණු ඉරියව් පිරිවැටලීමෙන් මුවාසි අනත්බව පඤ්චස්කන්ධ නැමැති ඝනයෙන් මුවාසී.

තව ද මෙපෙවත් "අනිච්චතො පස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො පස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො පස්සන්තො අත්තසඤ්ඤං පජහති" මෙහැම ප්‍රත්‍යක්ෂත්‍රිලක්ෂණානුදර්ශිතාවන්ගේ වශයෙන් ද—තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධධර්මයන් අධිකතරප්‍රයොජනවශයෙන් ත්‍රිලක්ෂණානුදර්ශනඥානයෙන් බලන යොගීන්ද්‍ර විසින්.

"රූපඤ්චවෙදනා සඤ්ඤා, සෙසා චෙතසිකා-පෙ-
ජීතඤ්ච රතෙනබ අනිවෙසනො සියාති.

යනාදී අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම අර්ථය ප්‍රකාශ කොට බලන යොගීන්ද්‍ර විසින්.

ආදාන නික්ඛෙපණතො වයොවුඩ්ඪගාමිතො-පෙ-
දුක්ඛාදීසවිසෙසෙන සච්චඨං ආහු පණ්ඩිතාති.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් ගිනිගත් කුකුළුපත්සෙයින් නිබ්බිදානුපස්සනාඥාණවශයෙන් බලා ආරබ්ධවිදර්ශකව නිවන් අරමුණු කොට පවත්නාවූ ත්‍රිලක්ෂණානුදර්ශනඥානධර්මයන් ප්‍රත්‍යක්ෂවශයෙන් සිත්හි ලා වඩන්නාහට පරිකර්මභූමියෙහි පටන් ලෝකෝත්තරධ්‍යානපර්‍යවසාන කොට විදර්ශනාභාවනාසඞ්ඛ්‍යාත සියලුම මාර්ගභාවනාවෝ යථාක්‍රමයෙන් වැඩෙන්නාහු යයි සේයි.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධධර්මයන් ධර්මාලම්බනප්‍රීතිවශයෙන් ත්‍රිලක්ෂණානුපස්සනාඥාණයෙන් ප්‍රත්‍යක්ෂවශයෙන් බලන යොගීහු විසින්,

සත්තසඤ්ඤමධිට්ඨාය නිස්සත්තාසුචිසඤ්චයෙ,
පලාලපන්තරූපම්හි බාලා නස්සා මිගා විය. (1)

යථාපි අංගසම්භාරා හොති සද්දො රථො ඉති,
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති. (2)

සත්තසඤ්ඤං ගහෙත්වාන සස්සතුච්ඡෙදදස්සිනො,
වාදසිද්ධී ගණ්හන්ති අඤ්ඤමඤ්ඤවිරොධිතා. (3)

අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො,
අනත්තනි ච අත්තාති අසුභෙ සුභසඤ්ඤිනො, (4)

---

1. නිස්සත්ව වූ මේ අශුචිරාශියෙහි අඥානජනයෝ සත්වය යන සංඥාව පිහිටුවාගෙණ පිදුරු යන්ත්‍රරූපයෙහි මනුෂ්‍ය සංඥා ඇති බාලමෘගයන් මෙන් නටහ.

2. යම්සේ චක්‍රකූබරාදි අවයවසමූහය හෙතු කොටගෙණ ඒ නොහැර රථය යන ව්‍යවහාරය වේ ද එපරිද්දෙන් ම ස්කන්ධයන් ඇතිකල්හි සත්වය යන ව්‍යවහාරය වේ.

3. සත්වය යන සංඥාව ගෙණ ශාශ්වතොච්ඡෙදදර්ශනය ඇති ඔවුනොවුන් විරුද්ධවූවාහු දෙසැට දෘෂ්ටින් ගණිත්.

4. අනිත්‍ය වූ දෙයෙහි නිත්‍යයයි විපරීතසංඥා ඇති දුක්හි සුඛයයි විපරීතසංඥා ඇති අනාත්මයෙහි ආත්මයයි විපරීත සංඥා ඇති අශුභයෙහි ශුභයයි විපරීතසංඥා ඇති-

දීඝබන්ධනබද්ධා තෙ තණ්හාගොචරෙන වූහරෙ,
තණ්හාසොතෙන වුය්හන්තා න තෙ දුක්ඛා පමුච්චරෙ. (1)
එවමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හා අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ. (2)
සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව,
නිද්ධන්තමලො අනඞ්ගණො න පුන ජාතිජරං උපෙහිසි. (3)
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො – පෙ –
නිද්දරෙ හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං.
යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා,
දෙවාපි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතන්ති. (4)

මොවුන් ත්‍රිලක්ෂණානුදර්ශනඥානයෙන් ප්‍රත්‍යක්ෂවශයෙන් බලනපරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම් වූ
විදර්ශනාභාවනාසඞ්ග්‍රහයෙහි සවන ප්‍රත්‍යක්ෂත්‍රිලක්ෂණානු
දර්ශනඥානසඞ්ග්‍රහය නිමි.

---

1. දීර්ඝබන්ධනයෙන් බඳනාලද ඒ තිර්ය්‍යකයෝ තෘෂ්ණා නැමැති වතුරෙන් ගෙණියනු ලැබෙති තෘෂ්ණාවතුරෙන් ගෙණියනු ලබන්නාවූ ඔහු දුකින් නො මිදෙන්නාහ.

2. මෙසේ කාලත්‍රයවර්ත්තිවූ ස්කන්ධයන්ගේ දෝෂ දැනගෙණ තෘෂ්ණාව සිගලුදුකට කරුණුයයි ද දැනගෙණ තෘෂ්ණාව පහ කළාවූ ආත්මාත්මීයවශයෙන් ග්‍රහණයක් නැත්තාවූ ක්ෂීණාශ්‍රවභික්ෂුතෙම සිහිනුවනින් යුක්ත ව හැසිරෙන්නේය.

3. හේ තෝ තමාහට පිහිටක් කරන්නෙහිදු වහා ම වීර්ය්‍ය කර කුසල් කිරීමෙහි නුවනැති ව අබ්බාල නොව රාගාදිමල නැසුයෙහි එහෙයින් ම රාගාදි අඞ්ගණරහිතවූයෙහි නැවත ජාතිජරාදි දුකට නො එලඹෙන්නෙහි යි.

4. යම් ප්‍රාඥකෙනෙක් සමථවිදර්ශනාභාවනා දෙක්හි නියුක්තයෝ ද ක්ලෙශව්‍යුපශමනය නිර්වාණය යනමේ නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනාහු ද ස්මෘතිමත් වූ ඒ සම්‍යක්සම්බුද්ධවරයන්ට දෙවියෝ ද මිනිස්සු ද කැමතිවෙත් – අපිත් බුදුවුමෝනම් යෙහෙකැයි බුදු බව කැමැතිවන්නාහු ප්‍රාර්ථනා කෙරෙත්.

තව ද මෙට ජාතිසඞ්ඛාත පඤ්චක්ඛන්ධයන් තිලක්ඛණානුපස්සනාඤාණවශයෙන් සමොධාන කොට බලන පටිදි කිලේසයන්.

චක්ඛුං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා—සොතං ලොකෙ-පෙ-ඝාණං ලොකෙ-පෙ-ජිව්හා, ලොකෙ-පෙ-කායො ලොකෙ-පෙ-මනො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා—රූපං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා—සද්දා ලොකෙ-පෙ-ගන්ධා ලොකෙ-පෙ-රසා ලොකෙ-පෙ-ඵොට්ඨබ්බා ලොකෙ-පෙ-ධම්මා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා—චක්ඛුවිඤ්ඤාණං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා—සොතවිඤ්ඤාණං ලොකෙ-පෙ-ඝාණවිඤ්ඤාණං ලොකෙ-පෙ-ජිව්හාවිඤ්ඤාණං ලොකෙ-පෙ-කායවිඤ්ඤාණං ලොකෙ-පෙ-මනොවිඤ්ඤාණං ලොකෙ-පෙ-චක්ඛායතනං ලොකෙ-පෙ-රූපායතනං ලොකෙ-පෙ-සොතායතනං ලොකෙ-පෙ-සද්දායතනං ලොකෙ-පෙ-ඝාණායතනං ලොකෙ-පෙ-ගන්ධායතනං ලොකෙ-පෙ-ජිව්හායතනං ලොකෙ-පෙ-රසායතනං ලොකෙ—පෙ-කායායතනං ලොකෙ-පෙ-ඵොට්ඨබ්බායතනං ලොකෙ-පෙ-මනායතනං ලොකෙ-පෙ-ධම්මායතනං ලොකෙ-පෙ-චක්ඛුසම්ඵස්සො ලොකෙ-පෙ-සොතසම්ඵස්සො ලොකෙ-පෙ-ඝාණසම්ඵස්සො ලොකෙ-පෙ-ජිව්හාසම්ඵස්සො ලොකෙ-පෙ-කායසම්ඵස්සො ලොකෙ-පෙ-මනොසම්ඵස්සො ලොකෙ-පෙ-චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා සොතසම්ඵස්සජා වෙදනා ලොකෙ-පෙ-ඝාණසම්ඵස්සජා වෙදනා ලොකෙ-පෙ-ජිව්හාසම්ඵස්සජා වෙදනා ලොකෙ-පෙ-කායසම්ඵස්සජා වෙදනා ලොකෙ-පෙ-මනොසම්ඵස්සජා වෙදනා ලොකෙ-පෙ-රූපසඤ්ඤා ලොකෙ-පෙ-සද්දසඤ්ඤා ලොකෙ-පෙ-ගන්ධසඤ්ඤා ලොකෙ-පෙ-රසසඤ්ඤා ලොකෙ-පෙ-ඵොට්ඨබ්බසඤ්ඤා ලොකෙ-පෙ-ධම්මසඤ්ඤා ලොකෙ-පෙ—රූපසඤ්චෙතනා ලොකෙ-පෙ-සද්දසඤ්චෙතනා ලොකෙ-පෙ-ගන්ධසඤ්චෙතනා ලොකෙ-පෙ-රස සඤ්චෙතනා ලොකෙ-පෙ-

ඵොට්ඨබ්බසඤ්චෙතනා ලොකෙ-පෙ-ධම්මසඤ්චෙතනා ලො
කෙ-පෙ-රූපතණ්හා ලොකෙ-පෙ-සද්දතණ්හා ලොකෙ
-පෙ-ගන්ධතණ්හා ලොකෙ-පෙ-රසතණ්හා ලොකෙ-පෙ-
ඵොට්ඨබ්බතණ්හා ලොකෙ-පෙ-ධම්මතණ්හා ලොකෙ-
පෙ-කාමතණ්හා ලොකෙ-පෙ-භවතණ්හා ලොකෙ-පෙ-
විභවතණ්හා. ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා…රූපවිත
ක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා—සද්දවිතක්කො
ලොකෙ-පෙ-ගන්ධවිතක්කො ලොකෙ-පෙ-රසවිතක්කො
ලොකෙ-පෙ-ඵොට්ඨබ්බවිතක්කො ලොකෙ-පෙ-ධම්මවිත
ක්කො ලොකෙ-පෙ-රූපවිචාරො ලොකෙ-පෙ-සද්දවිචා
රො ලොකෙ-පෙ-ගන්ධවිචාරො ලොකෙ-පෙ-රසවිචාරො
ලොකෙ-පෙ-ඵොට්ඨබ්බවිචාරො ලොකෙ-පෙ-ධම්මවිචා
රො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා'ති—යනාදීන් සම්බො
ධාන ත්‍රිලක්ෂණානුදර්ශනඥානවශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයෙහි—චක්ඛුන්ද්‍රියං
ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා…සොතින්ද්‍රියං ලොකෙ-
පෙ-ඝාණින්ද්‍රියං ලොකෙ-පෙ-ජිව්හින්ද්‍රියං ලොකෙ-පෙ-
කායින්ද්‍රියං ලොකෙ-පෙ-ඉත්ථින්ද්‍රියං ලොකෙ-පෙ-පුරිසින්ද්‍රි
යං ලොකෙ-පෙ-ජීවිතින්ද්‍රියං ලොකෙ-පෙ-මනින්ද්‍රියං ලො
කෙ-පෙ-සුඛින්ද්‍රියං ලොකෙ-පෙ-දුක්ඛින්ද්‍රියං ලොකෙ-පෙ-
සොමනස්සින්ද්‍රියං ලොකෙ-පෙ-දොමනස්සින්ද්‍රියං ලොකෙ-
පෙ-උපෙක්ඛින්ද්‍රියං ලොකෙ-පෙ-සද්ධින්ද්‍රියං ලොකෙ-
පෙ-විරියින්ද්‍රියං ලොකෙ-පෙ-සතින්ද්‍රියං ලොකෙ-පෙ-ස
මාධින්ද්‍රියං ලොකෙ-පෙ-පඤ්ඤින්ද්‍රියං ලොකෙ-පෙ-අන
ඤ්ඤාතං ඤස්සාමීතින්ද්‍රියං ලොකෙ-පෙ-අඤ්ඤින්ද්‍රියං ලො
කෙ-පෙ-අඤ්ඤාතාවින්ද්‍රියං ලොකෙ-පෙ-සද්ධාබලං ලොකෙ
-පෙ-විරියබලං ලොකෙ-පෙ-සතිබලං ලොකෙ-පෙ-සමා
ධිබලං ලොකෙ-පෙ-පඤ්ඤාබලං ලොකෙ-පෙ-සතිසම්බො
ජ්ඣඞ්ගො ලොකෙ-පෙ-ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ලො
කෙ-පෙ-විරියසම්බොජ්ඣඞ්ගො ලොකෙ-පෙ-පීතිසම්බො
ජ්ඣඞ්ගො ලොකෙ-පෙ-පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ලොකෙ-
පෙ-සමාධිසම්බොජ්ඣඞ්ගො ලොකෙ-පෙ-උපෙක්ඛාසම්බො

ඣානෙසු ලොකෙ-පෙ-ඡන්දිද්ධිපාදෙ ලොකෙ-පෙ-චිත්තිද්ධිපාදෙ ලොකෙ-පෙ-විරියිද්ධිපාදෙ ලොකෙ-පෙ-වීමංසිද්ධිපාදෙ ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා'ති—යනාදී අනුපස්සනාවන්ගේ වශයෙන්ද.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි—චක්ඛුධාතු අනිච්චං දුක්ඛං අනත්තා—රූපධාතු-පෙ-චක්ඛුවිඤ්ඤාණධාතු-පෙ-සොතධාතු-පෙ-සද්දධාතු-පෙ-සොතවිඤ්ඤාණධාතු-පෙ-ඝාණධාතු-පෙ-ගන්ධධාතු-පෙ-ඝාණවිඤ්ඤාණධාතු-පෙ-ජිව්හාධාතු-පෙ-රසධාතු-පෙ-ජිව්හාවිඤ්ඤාණධාතු-පෙ-කායධාතු-පෙ-ඵොට්ඨබ්බධාතු-පෙ-කායවිඤ්ඤාණධාතු-පෙ-මනොධාතු-පෙ-ධම්මධාතු-පෙ-මනොවිඤ්ඤාණධාතු අනිච්චං දුක්ඛං අනත්තා—චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු අනිච්චං දුක්ඛං අනත්තා—සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු-පෙ-ඝාණධාතු ගන්ධධාතු ඝාණවිඤ්ඤාණධාතු-පෙ-ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු-පෙ-කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු-පෙ-මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු අනිච්චං දුක්ඛං අනත්තා—කාමධාතු අනිච්චං දුක්ඛං අනත්තා—රූපධාතු-පෙ-අරූපධාතු අනිච්චං දුක්ඛං අනත්තා—සබ්බා ධාතුයො අනිච්චා දුක්ඛා අනත්තා—සබ්බා ධාතුයො-පෙ-සබ්බා ධාතුයො අනිච්චා දුක්ඛා අනත්තාති.
යනාදීන් අනුපස්සනාවන්ගේ වශයෙන්ද.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි—අභික්කන්තෙ පටික්කන්තෙ උප්පන්නා රූපාරූපධම්මා අඤ්ඤමඤ්ඤං පබ්බපබ්බං සන්ධිසන්ධිං ඔධිඔධිං භිජ්ජා තත්තකපාලෙ පක්ඛිත්තතිලා විය තටතටායන්තා තත්ථ තත්ථෙව නිරුද්ධා අනිච්චා දුක්ඛා අනත්තා—ආලොකිතෙ විලොකිතෙ උප්පන්නා රූපාරූපධම්මා-පෙ-සම්මිඤ්ජිතෙ පසාරිතෙ උප්පන්නා රූපාරූපධම්මා-පෙ-සඞ්ඝාටිපත්තචීවරධාරණෙ උප්පන්නා රූපාරූපධම්මා-පෙ-අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ උප්පන්නා රූපාරූපධම්මා-පෙ-උච්චාරපස්සාවකම්මෙ උප්පන්නා රූපාරූපධම්මා-පෙ-ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ උප්පන්නා

රූපාරූපධම්මා අඤ්ඤමඤ්ඤං පබ්බපබ්බං සන්ධිසන්ධිං ඔධිඔධිං හුත්වා තත්තකපාලෙ පක්ඛිත්තතිලා විය තටතටායන්තා තත්ථ තත්ථෙව නිරුද්ධා අනිච්චා දුක්ඛා අනත්තාති. යනාදීන් අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයෙහි—උද්ධරණෙ උප්පන්නා රූපාරූපධම්මා අතිහරණං අප්පත්වා අඤ්ඤමඤ්ඤං පබ්බපබ්බං සන්ධිසන්ධිං ඔධිඔධිං හුත්වා තත්තකපාලෙ පක්ඛිත්තතිලාවිය තටතටායන්තා තත්ථ තත්ථෙව නිරුද්ධා අනිච්චා දුක්ඛා අනත්තා—අතිහරණෙ උප්පන්නා රූපාරූපධම්මා වීතිහරණං අප්පත්වා- පෙ- වීතිහරණෙ උප්පන්නා රූපාරූපධම්මා වොස්සජ්ජනං අප්පත්වා-පෙ- වොස්සජ්ජනෙ උප්පන්නා රූපාරූපධම්මා සන්නික්ඛෙපනං අප්පත්වා—පෙ—සන්නික්ඛෙපනෙ උප්පන්නා රූපාරූපධම්මා සන්නිරුම්භනං අප්පත්වා-පෙ-සන්නිරුම්භනෙ උප්පන්නා රූපාරූපධම්මා අඤ්ඤමඤ්ඤං පබ්බ පබ්බං සන්ධිසන්ධිං ඔධි ඔධිං හුත්වා තත්තකපාලෙ පක්ඛිත්තතිලා විය තටතටායන්තා තත්ථ තත්ථෙව නිරුද්ධා අනිච්චා දුක්ඛා අනත්තාති.

යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයෙහි—අස්සාසෙ උප්පන්නා රූපාරූපධම්මා පස්සාසං අප්පත්වා අඤ්ඤමඤ්ඤං පබ්බපබ්බං සන්ධිසන්ධිං ඔධිඔධිං හුත්වා තත්තකපාලෙ පක්ඛිත්තතිලා විය තටතටායන්තා තත්ථ තත්ථෙව නිරුද්ධා අනිච්චා දුක්ඛා අනත්තා—පස්සාසෙ උප්පන්නා රූපාරූපධම්මා උම්මිලනං අප්පත්වා-පෙ-උම්මිලනෙ උප්පන්නා රූපාරූපධම්මා නිම්මිලනං අප්පත්වා-පෙ-නිම්මිලනෙ උප්පන්නා රූපාරූපධම්මා උප්පාදක්ඛණං අප්පත්වා-පෙ-උප්පාදක්ඛණෙ උප්පන්නා රූපාරූපධම්මා ඨිතික්ඛණං අප්පත්වා -පෙ-ඨිතික්ඛණෙ උප්පන්නා රූපාරූපධම්මා භඞ්ගක්ඛණං අප්පත්වා-පෙ-භඞ්ගක්ඛණෙ උප්පන්නා රූපාරූපධම්මා පුන උප්පාදක්ඛණං අප්පත්වා අඤ්ඤමඤ්ඤං පබ්බපබ්බං සන්ධිසන්ධිං ඔධිඔධිං හුත්වා තත්තකපාලෙ පක්ඛිත්තතිලා

විය තටතවායතනා තත්ථ තත්ථේව නිරුද්ධා අනිච්චා දුක්ඛා අනත්තාති.

සතාදින් අනුපස්සනාවන්ගේ වසයෙන්ද.

තව ද මෙම ඡාහිපඤ්ඤත්ත පඤ්චස්කන්ධයෙහි—රූපං අනිච්චං දුක්ඛං අනත්තා—වේදනා අනිච්චා දුක්ඛා අනත්තා—සඤ්ඤා අනිච්චා දුක්ඛා අනත්තා—සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා—විඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තාති.

තත්ථ කතමං රූපං අනිච්චං දුක්ඛං අනත්තා? යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං රූපං අනිච්චං දුක්ඛං අනත්තා—සබ්බං රූපං අනිච්චං දුක්ඛං අනත්තා—සබ්බං රූපං අනිච්චං දුක්ඛං අනත්තා—තත්ථ කතමා වේදනා අනිච්චා දුක්ඛා අනත්තා? යා කාචි වේදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ වා සන්තිකෙ වා සබ්බා වේදනා අනිච්චා දුක්ඛා අනත්තා—සබ්බා වේදනා අනිච්චා දුක්ඛා අනත්තා—සබ්බා වේදනා අනිච්චා දුක්ඛා අනත්තා.

තත්ථ කතමා සඤ්ඤා අනිච්චා දුක්ඛා අනත්තා? යාකාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ වා සන්තිකෙ වා සබ්බා සඤ්ඤා අනිච්චා දුක්ඛා අනත්තා-සබ්බා සඤ්ඤා අනිච්චා දුක්ඛා අනත්තා—සබ්බා සඤ්ඤා අනිච්චා දුක්ඛා අනත්තා.

තත්ථ කතමා සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා? යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙ වා සන්තිකෙ වා සබ්බෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා-සබ්බෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා—සබ්බෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා.

තත්ථ කතමං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා? යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං

දූරෙ වා සන්තිකෙ වා සබ්බා විඤ්ඤාණා අනිච්චං දුක්ඛං අනත්තා—සබ්බං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා—සබ්බං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තාති.

යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන්ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතත පඤ්චස්කන්ධයෙහි—රූපං අනිච්චතො පස්සති-පෙ-වෙදනං-පෙ- සඤ්ඤං-පෙ- සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං-පෙ-සංකිලෙසිකධම්මතො පස්සති. යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතතපඤ්චස්කන්ධයෙහි—අනිච්චතො පස්සන්තො අනිමිත්තං ලොකං අවෙක්ඛති දුක්ඛතො පස්සන්තො අප්පණිහිතං ලොකං අවෙක්ඛති අනත්තතො පස්සන්තො සුඤ්ඤතං ලොකං අවෙක්ඛති.

මෙ හැම සමොධානතිලක්ඛණානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතත පඤ්චස්කන්ධයන් අධිකතර ප්‍රයොජන වශයෙන් සමොධානතිලක්ඛණානුපස්සනාඥාණයෙන් බලන යොගීහු විසින්.

රූපඤ්ච වෙදනා සඤ්ඤා, සෙසා චෙතසිකා-පෙ-

කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා,
යොධෙථ මාරං පඤ්ඤායුධෙන
ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියාති.

යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන්ද.

තවද මෙම අර්ථය ප්‍රකාශ කොට බලන යොගීහු විසින්.

ආදානනික්ඛෙපනතො වයොවුඩ්ඪත්ථගාමිතො-පෙ-
ඉති තච්ඡා විපල්ලාස භූතභාවං චතුබ්බිපි,
දුක්ඛාදිසච්චවිසෙසෙන සච්චත්ථං ආහු පණ්ඩිතා ති.

තව ද මෙම ජාතිසඞ්ඛාතත පඤ්චස්කන්ධධර්මයන් භූමිපටියක් සෙයින් සුඤ්ඤතාධම්මානුපස්සනාඥාණවශයෙන් බලා ආරබ්ධවිදර්ශිකව නිවන් අරමුණු කොට පවත්නාවූ තිලක්ඛණානුදර්ශනඥානයෙන් සමොධාන කොට සිත්හි ල

වඩන්නාහට පරිකර්මභූමියෙහි පටන් ලොකොත්තරධර්මා ධිගමපර්‍ය්‍යවසාන කොට විදර්ශනාභාවනාසඞ්ඛ්‍යාත සියලුම මාර්ගභාවනාවෝ යථාක්‍රමයෙන් වැඩෙන්නාහු යයි සේයි.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් ධර්මාලම්බ නප්‍රවෘත්තිවශයෙන් සමොධාන කොට ත්‍රිලක්‍ෂණානුදර්ශනඥාන යෙන් බලන යොගීහු විසින්.

නාමරූපස්ස යං හෙතු විඤ්ඤාණං තං ද්විධා මතං
විපාකමවිපාකඤ්ච යුත්තමෙව යතො ඉදං. (1)

කම්මස්ස කාරකො නත්ථි විපාකස්ස ච වෙදකො,
සුද්ධධම්මා පවත්තන්ති එවෙතං සම්මදස්සනං, (2)

කම්මා විපාකා වත්තන්ති විපාකො කම්මසම්භවො,
තස්මා පුනබ්භවො හොති එවං ලොකො පවත්තති. (3)

එවං කම්මවිපාකෙ ච වත්තමානෙ සහෙතුකෙ
බීජරුක්ඛාදිකානංව පුබ්බා කොටි න ඤායති. (4)

---

1. නාමරූපයට යම් විඥානයෙක් හෙතු වේ ද ඒ විඥානය විපාකවිඥානය අවිපාකවිඥානයයි යම්හෙයකින් දෙපරිච්ඡෙදකින් අභිමත ද එහෙයින් (අසංඥයන් කෙරෙහි විඥාන ප්‍රත්‍යයෙන් රූපය වේ යන) මෙය යුක්තමැයි.

2. කර්මය කරන්නෙක් නැත්තේය හෙවත් කර්මයට කාරකයෙක් නැත්තේය විපාකය විඳින්නෙකුදු නැත්තේය හෙවත් විපාකයට වෙදකයෙකුදු නැත්තේය කෙවලධර්මයෝ පවත්නාහ මෙසේ මෙය සම්‍යග්දර්ශනයයි.

3. කර්මයෙන් විපාකයෝ පවත්නාහ විපාකය කර්මයෙන් වන්නේය එහෙයින් නැවත භවය වෙයි මෙසේ ලොකය පවතී.

4. මෙසේ සහෙතුක වූ කර්මවිපාකයන් පවත්නා කල්හි බීජවෘක්‍ෂාදීන්ගේ මෙන් පූර්වකොටිය නොපැණේ—බීජයෙන් වෘක්‍ෂය වෘක්‍ෂයෙන් බීජයයි බීජවෘක්‍ෂසන්තානය අනාදිකාලිකබැවින් පූර්වකොටිය නො පැණේ ද එපරිද්දෙන්ම කර්මප්‍රත්‍යයෙන් විපාකය විපාකප්‍රත්‍යයෙන් කර්මයයි කර්මවිපාකසන්තානය අනාදිකාලිකබැවින් පූර්වකොටිය නොපැණේය යන අර්ථයි.

අනාගතෙපි සංසාරෙ අප්පවත්තිං න දිස්සති,
එතමත්ථං අනඤ්ඤාය තිත්ථියා අසයංවසී. (1)

අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො,
අනත්තනි ච අත්තාති අසුභෙ සුභසඤ්ඤිනො. (2)

මිච්ඡාදිට්ඨිගතා භන්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනො,
යෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා,
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො. (3)

තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං,
ඉත්ථම්භාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති. (4)

එවමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ. (5)

---

1. අනාගත සසර ද අප්‍රවෘත්තිය නො පැනෙයි, මේ අර්ථය නොදන්නා තීර්ථකයෝ මිථ්‍යාදෘෂ්ටිපරවශවූවාහුය–

2. අනිත්‍ය වූ දෙයෙහි නිත්‍යයයි විපරීතසංඥා ඇති දුකෙහි සුවයයි විපරීතසංඥා ඇති අනාත්මයෙහි ආත්මයයි විපරීතසංඥා ඇති අශුභයෙහි ශුභයයි විපරීතසංඥා ඇති.

3. මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූ නොහොත් මිථ්‍යාදෘෂ්ටියෙන් නෂ්ට වූ භ්‍රාන්ත වූ වික්ෂිප්ත සිත්ඇති විපරීතසංඥා පරවශ වූ මාරයාගේ යොගයෙහි යෙදුනා වූ නිර්වාණට නො පැමිණියා වූ යම් සත්වකෙනෙක් වෙද්ද ජාතිය හා මරණයට පැමිණෙන්නා වූ ඒ සත්වයෝ සසරට යෙති.

4. තෘෂ්ණාව දෙවෙනි කොට ඇතිව සංසාරයෙහි දීර්ඝ කාලයක් මුලුල්លෙහි හැසිරෙණ පුරුෂතෙම වර්තමානානාගතආත්මභාව ඇති ස්කන්ධධාත්වායතනයන්ගේ පටිපාටිය වූ සංසාරය නොඉක්මවයි.

5. මෙසේ කාලත්‍රයවර්ති වූ ස්කන්ධයන්ගේ දොෂ දැනගෙණ තෘෂ්ණාව සියලු දුකට කරුණුයයි ද දැනගෙණ තෘෂ්ණාව පහ කලාවූ ආත්මාත්මීයවශයෙන් ග්‍රහණයක් නැත්තාවූ ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම සිහිනුවණින් යුක්ත ව හැසිරෙන්නේය.

මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ,
සබ්බත්ථ විමුත්තමානසො න පුන ජාතිජරං උපෙහිසි. (1)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො - පෙ -
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං.

නාමරූපං පරිග්ගය්හ තතො තස්ස ච පච්චයං,
හුත්වා අභාවතොනිච්චං උදයබ්බයපීළිතා,
දුක්ඛං අවසවත්තිත්තා අනත්තාති තිලක්ඛණං.

ආරොපෙත්වාන සඞ්ඛාරෙ සම්මසන්තො පුනප්පුනං,
පාපුණෙය්‍යානුපුබ්බෙන සබ්බසඤ්ඤොජනක්ඛයං. (2)

යස්සින්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීනමානස්ස අනාසවස්ස
දෙවාපි තස්ස පිහයන්ති තාදිනොති. (3)

---

1. අතීතස්කන්ධයන් කෙරෙහි පවත්නා තෘෂ්ණාව හැරැ අනාගතස්කන්ධයන් කෙරෙහි පවත්නා තෘෂ්ණාව ද හැරැ වර්තමානස්කන්ධයන් කෙරෙහි පවත්නා තෘෂ්ණාව ද හැරැ මෙසේ කල්හි ත්‍රිවිධභවයාගේ එතරට ගියාවූ තෝ සියලු ම ප්‍රත්‍යයොත්පන්නධර්මයන් කෙරෙන් මිදුනු සිත්ඇත්තෙහි නැවත ජාතියට හා ජරාවට නො පැමිනියෙහි වී.

2. නාමරූපය හා ඊට ප්‍රත්‍යය ද පරිග්‍රහණය කොට හටගෙණ අභාවය වන හෙයින් අනිත්‍යයයි ද උත්පාදව්‍යය දෙකින් පෙළෙනහෙයින් දුක්යැයි ද ස්වවශයෙහි නොපවත්නාහෙයින් අනාත්මයයි ද කියා ලක්ෂණත්‍රයට නගා නැවත නැවත සංස්කාරයන් සම්මර්ශනය කරණ යොගාවචරතෙම සොවාන් ආදි මාර්ගපිළිවෙළින් සංයොජනයන් ක්ෂය කොට නිවණට පැමිණෙන්නේය.

3. යම් ක්ෂීණාශ්‍රවයකුගේ චක්ෂුරාදි සයිඳුරෝ දක්ෂරථාචාර්යයෙකු විසින් මනා කොට දමනය කරණලද ආජානෙය අශ්වයන් මෙන් සමථයට ගියෝ ද මනා කොට දැමුනෝ ද මානය ප්‍රහීණකළා වූ ආශ්‍රවරහිත වූ අෂ්ටලොකධර්මයෙන් අකම්ප්‍යවූ ඒ ක්ෂීණාශ්‍රවයාහට දෙවියෝ පවා කැමති වෙත්.

මොවුන් ත්‍රිලක්ෂණානුදර්ශනඥානවශයෙන් සමොධාන කොට බලන පරිදි මෙසේ දතයුතු

මෙතෙකින් මේ විමුක්ති සඞ්ග්‍රහ නම් වූ විදර්ශනා භාවනා සඞ්ග්‍රහයෙහි සත්වන සමොධාන ත්‍රිලක්ෂණානු දර්ශනඥාන සඞ්ග්‍රහය නිමි.

---

යළි ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධධර්මයන් ශූන්‍යතා ධර්මානුපස්සනාඥානවශයෙන් නොයෙක් පරිද්දෙන් බලනපරිදි කිසේද යත් ?

චක්ඛුං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. සොතං සුඤ්ඤං-පෙ-ඝාණං සුඤ්ඤං-පෙ-ජිව්හා සුඤ්ඤා-පෙ-කායො සුඤ්ඤො-පෙ-මනො සුඤ්ඤො-පෙ-රූපා සුඤ්ඤා-පෙ-සද්දා සුඤ්ඤා-පෙ-ගන්ධා සුඤ්ඤා-පෙ-රසා සුඤ්ඤා-පෙ-ඵොට්ඨබ්බා සුඤ්ඤා-පෙ-ධම්මා සුඤ්ඤා-පෙ-චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං-පෙ-සොතවිඤ්ඤාණං සුඤ්ඤං-පෙ-ඝාණවිඤ්ඤාණං සුඤ්ඤං-පෙ-ජිව්හාවිඤ්ඤාණං සුඤ්ඤං-පෙ-කායවිඤ්ඤාණං සුඤ්ඤං-පෙ-මනොවිඤ්ඤාණං සුඤ්ඤං-පෙ-චක්ඛායතනං සුඤ්ඤං-පෙ-රූපායතනං සුඤ්ඤං-පෙ සොතායතනං සුඤ්ඤං-පෙ-සද්දායතනං සුඤ්ඤං-පෙ-ඝාණායතනං සුඤ්ඤං-පෙ-ගන්ධායතනං සුඤ්ඤං-පෙ-ජිව්හායතනං සුඤ්ඤං-පෙ-රසායතනං සුඤ්ඤං පෙ-කායායතනං සුඤ්ඤං-පෙ-ඵොට්ඨබ්බායතනං සුඤ්ඤං-පෙ-මනායතනං සුඤ්ඤං-පෙ-ධම්මායතනං සුඤ්ඤං-පෙ-චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො-පෙ-සොතසම්ඵස්සො සුඤ්ඤො-පෙ-ඝාණසම්ඵස්සො සුඤ්ඤො-පෙ-ජිව්හාසම්ඵස්සො සුඤ්ඤො-පෙ-කායසම්ඵස්සො සුඤ්ඤො-පෙ-මනොසම්ඵස්සො සුඤ්ඤො-පෙ-චක්ඛුසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා-පෙ-සොතසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා-පෙ-ඝාණසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා-පෙ-ජිව්හාසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා-පෙ-කායසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා-පෙ-මනොසම්ඵස්සජා වෙදනා සුඤ්ඤා-පෙ-රූපසඤ්ඤා සුඤ්ඤා

-පෙ-සද්දසඤ්ඤා සුඤ්ඤා-පෙ-ගන්ධසඤ්ඤා සුඤ්ඤා-රසසඤ්ඤා සුඤ්ඤා-පෙ-ඵොට්ඨබ්බසඤ්ඤා සුඤ්ඤා-පෙ-ධම්මසඤ්ඤා සුඤ්ඤා-පෙ-රූපසඤ්චෙතනා සුඤ්ඤා-පෙ-සද්දසඤ්චෙතනා සුඤ්ඤා-පෙ-ගන්ධසඤ්චෙතනා සුඤ්ඤා-පෙ-රසසඤ්චෙතනා සුඤ්ඤා-පෙ-ඵොට්ඨබ්බසඤ්චෙතනා සුඤ්ඤා-පෙ-ධම්මසඤ්චෙතනා සුඤ්ඤා-පෙ-රූපතණ්හා සුඤ්ඤා-සද්දතණ්හා සුඤ්ඤා-පෙ-ගන්ධතණ්හා සුඤ්ඤා පෙ-රසතණ්හා සුඤ්ඤා-පෙ-ඵොට්ඨබ්බතණ්හා සුඤ්ඤා-පෙ ධම්මතණ්හා සුඤ්ඤා-පෙ-කාමතණ්හා සුඤ්ඤා-පෙ-භවතණ්හා සුඤ්ඤා-පෙ-විභවතණ්හා සුඤ්ඤා-පෙ-රූපවිතක්කො සුඤ්ඤො-පෙ-සද්දවිතක්කො සුඤ්ඤො-පෙ-ගන්ධවිතක්කො සුඤ්ඤො-පෙ-රසවිතක්කො සුඤ්ඤො-පෙ-ඵොට්ඨබ්බවිතක්කො සුඤ්ඤො-පෙ-ධම්මවිතක්කො සුඤ්ඤො-පෙ-රූපවිචාරො සුඤ්ඤො-පෙ-සද්දවිචාරො සුඤ්ඤො-පෙ-ගන්ධවිචාරො සුඤ්ඤො-පෙ-රසවිචාරො සුඤ්ඤො-පෙ-ඵොට්ඨබ්බවිචාරො සුඤ්ඤො-පෙ-ධම්මවිචාරො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වාති.

යනාදී සුඤ්ඤතා ධම්මානුපස්සනා ඥාණවශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි—

'රූපං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා ධුවසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. වෙදනා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිණාමධම්මෙන වා—සඤ්ඤා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිණාමධම්මෙන වා—සඞ්ඛාරා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිණාමධම්මෙන වා—විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිණාමධම්මෙන වාති.

තත්ථ කතමං රූපං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිණාමධම්මෙන වා? යං කිඤ්චි රූ

පං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං තං රූපං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා-පෙ- අවිපරිනාමධම්මෙන වා.—— තත්ථ කතමා වෙදනා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිනාමධම්මෙන වා? යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා, යා දූරෙ වා සන්තිකෙ වා සබ්බා තා වෙදනා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිනාමධම්මෙන වා.—— තත්ථ කතමා සඤ්ඤා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිනාමධම්මෙන වා? යා කාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යා දූරෙ වා සන්තිකෙ වා සබ්බා සඤ්ඤා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිනාමධම්මෙන වා.—— තත්ථ කතමා සඞ්ඛාරා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා -පෙ-අවිපරිනාම ධම්මෙන වා? යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙ වා සන්තිකෙ වා සබ්බෙ තෙ සඞ්ඛාරා අසාරා නිස්සාරා සාරාපගතා නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිනාමධම්මෙන වා—— තත්ථ කතමං විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා-පෙ-අවිපරිනාමධම්මෙන වා? යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා සබ්බං තං විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා සුභසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා” ති යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛත පඤ්චස්කන්ධයෙහි—

"යථා නළො (1) අසාරො නිස්සාරො සාරාපගතො—යථා එරණ්ඩො (2) අසාරො නිස්සාරො සාරාපගතො—යථා උදුම්බරො (3) අසාරො නිස්සාරො සාරාපගතො—යථා සෙතවච්ඡො (4) අසාරො නිස්සාරො සාරාපගතො—යථා පාලිභද්දකො (5) අසාරො නිස්සාරො සාරාපගතො—යථා ඵෙණපිණ්ඩො අසාරො නිස්සාරො සාරාපගතො—යථා උදකබුබ්බුළං අසාරං නිස්සාරං සාරාපගතං—යථා මරීචි අසාරා නිස්සාරා සාරාපගතා—යථා කදලික්ඛන්ධො අසාරො නිස්සාරො සාරාපගතො—යථා මායා අසාරා නිස්සාරා සාරාපගතා, එවමෙවං රූපං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුභසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා—පෙ—එවමෙවං වෙදනා අසාරා නිස්සාරා සාරාපගතා—පෙ—එවමෙවං සඤ්ඤා අසාරා නිස්සාරා සාරාපගතා—පෙ—එවමෙවං සඞ්ඛාරා අසාරා නිස්සාරා සාරාපගතා—පෙ—එවමෙවං විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුභසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා"ති යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛත පඤ්චස්කන්ධයෙහි—

"රූපං න සත්තො න ජීවො න නරො න මාණවො න ඉත්ථී න පුරිසො න අත්තා න අත්තනියං නාහං න මම න අඤ්ඤස්ස න කොචි න කස්සචි—වෙදනා—පෙ—සඤ්ඤා—පෙ—සඞ්ඛාරා—පෙ—විඤ්ඤාණං න සත්තො න ජීවො න නරො න මාණවො න ඉත්ථී න පුරිසො න අත්තා න අත්තනියං නාහං න මම න අඤ්ඤස්ස න කොචි න කස්සචී"ති යනාදී අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

---

1. බටගස. 2. එඬරුගස. 3. දිඹුල්ගස, 4. හෙලවරණිගස. 5. එරබදුගස.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි—

"රූපං අනිච්චතො පස්සති, දුක්ඛතො පස්සති, රොගතො පස්සති, ගණ්ඩතො පස්සති, සල්ලතො පස්සති, අඝතො පස්සති, ආබාධතො පස්සති, පරතො පස්සති, පලොකතො පස්සති, ඊතිතො පස්සති, උපද්දවතො පස්සති, භයතො පස්සති, උපසග්ගතො පස්සති, චලතො පස්සති, පභඞ්ගුතො පස්සති, අධුවතො පස්සති, අතාණතො පස්සති, අලෙණතො පස්සති, අසරණතො පස්සති, අසරණීභූතතො පස්සති, රිත්තතො පස්සති, තුච්ඡතො පස්සති, සුඤ්ඤතො පස්සති, අනත්තතො පස්සති, අනස්සාදතො පස්සති, ආදීනවතො පස්සති, විපරිනාමධම්මතො පස්සති, අසාරකතො පස්සති, අඝමූලතො පස්සති, වධකතො පස්සති, විභවතො පස්සති, සාසවතො පස්සති, සංඛතතො පස්සති, මාරාමිසතො පස්සති, ජාතිධම්මතො පස්සති, ජරාධම්මතො පස්සති, ව්‍යාධිධම්මතො පස්සති, මරණධම්මතො පස්සති, සොකධම්මතො පස්සති, පරිදෙවධම්මතො පස්සති, දුක්ඛධම්මතො පස්සති, දෝමනස්සධම්මතො පස්සති, සමුදයධම්මතො පස්සති, අත්ථඞ්ගමතො පස්සති, වෙදනා-පෙ-සඤ්ඤා-පෙ-සඞ්ඛාරා-පෙ-විඤ්ඤාණං අනිච්චතො පස්සති, දුක්ඛතො පස්සති, ගණ්ඩතො පස්සති-පෙ-සමුදයධම්මතො පස්සති, අත්ථඞ්ගමතො පස්සති" යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි—

මෙහැම ධර්මයෝ ආහාරස්ථිතිකයන්ගේ වශයෙන් එක්දෙනෙක් වෙති, නාමරූපධර්මයන්ගේ වශයෙන් දෙදෙනෙක් වෙති, ලක්ෂණධර්මයන්ගේ වශයෙන් තුන්දෙනෙක් වෙති, උපාදානධර්මයන්ගේ වශයෙන් සතරදෙනෙක් වෙති, ස්කන්ධයන්ගේ වශයෙන් පස්දෙනෙක් වෙති, ආයතනයන්ගේ වශයෙන් සදෙනෙක් වෙති, අනුසයන්ගේ වශයෙන් සත්දෙනෙක් වෙති, මාර්ගාඞ්ගයන්ගේ වශයෙන් අටදෙනෙක් වෙති, අනුපස්සනාවන්ගේ වශයෙන් නවදෙනෙක් වෙති, උපක්ලේශයන්ගේ වශයෙන් දසදෙනෙක් වෙති, කාමාඞ්ගීන්ගේ වශයෙන් එකොළොස්දෙනෙක් වෙති, දු

තෑදොපතනධර්මයන්ගේ වශයෙන් දෑලොස්දෙනෙක් වෙති, ද්විකධර්මයන්ගේ වශයෙන් තෙලෙස්දෙනෙක් වෙති, රූපසප්තක අරූපසප්තකධර්මයන්ගේ වශයෙන් තුදුස්දෙනෙක් වෙති, සථානකාරවශයෙන් සොළොස්දෙනෙක් වෙති. එකෑපඤ්චකරාසි ආදීන්ගේ වශයෙන් සතළොස්දෙනෙක් වෙති, විදර්ශනාඥානයන්ගේ වශයෙන් අටළොස්දෙනෙක් වෙති, ඉන්ද්‍රියයන්ගේ වශයෙන් දෙවිසිදෙනෙක් වෙති, ද්‍රව්‍යයන්ගේ වශයෙන් සූවිසිදෙනෙක් වෙති, අනත්තානුපශ්‍යනාවන්ගේ වශයෙන් පස්විසිදෙනෙක් වෙති, රූපාවචරමද වශයෙන් සත්විසිදෙනෙක් වෙති, රූපභෙද වශයෙන් අටවිසිදෙනෙක් වෙති, නිවරණාදීන්ගේ වශයෙන් තිස්දෙනෙක් වෙති, කෙසාදි කොට්ඨාසයන්ගේ වශයෙන් දෙතිස්දෙනෙක් වෙති, බොධයන්ගේ වශයෙන් සූතිස්දෙනෙක් වෙති, වර්තමානතෘෂ්ණාවන්ගේ වශයෙන් සතිස්දෙනෙක් වෙති, බොධිපාක්ෂිකධර්මයන්ගේ වශයෙන් සත්තිස්දෙනෙක් වෙති, ආරම්මණයන්ගේ වශයෙන් අටතිස්දෙනෙක් වෙති, ආකාරයන්ගේ වශයෙන් සතළිස්දෙනෙක් වෙති, ඥානභෙදයන්ගේ වශයෙන් දෙසාළිස්දෙනෙක් වෙති, සතරසතිපට්ඨාන ධර්මයන්ගේ වශයෙන් සිව්සාළිස්දෙනෙක් වෙති, අනිච්චානුපශ්‍යනාවන්ගේ වශයෙන් පණස්දෙනෙක් වෙති, දෘෂ්ටීන්ගේ වශයෙන් දෙසැටදෙනෙක් වෙති, චර්‍යාවන්ගේ වශයෙන් තෙසැටදෙනෙක් වෙති, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියාදීන්ගේ වශයෙන් සිව්සැටදෙනෙක් වෙති, පරමාර්ථධර්මයන්ගේ වශයෙන් තෙසැත්තෑදෙනෙක් වෙති, ධම්මට්ඨිතිඥාණයන්ගේ වශයෙන් සත්සැත්තෑදෙනෙක් වෙති, ලෞකිකලොකොත්තර ධර්මයන්ගේ වශයෙන් දෙයානූදෙනෙක් වෙති, තෘෂ්ණාවන්ගේ වශයෙන් එක්සිය අටදෙනෙක් වෙති, දුඃඛානුපශ්‍යනාවන්ගේ වශයෙන් එක්සිය පස්විසිදෙනෙක් වෙති, තිලක්ඛණානුපස්සනාවන්ගේ වශයෙන් දෙසියදෙනෙක් වෙති, වෙචතත්‍රිසාකාරාදීන්ගේ වශයෙන් දෙසිය සොළොස්දෙනෙක් වෙති, යනාදීන් උපායානුගත පරිච්ඡෙදානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාතපඤ්චස්කන්ධයෙහි—

"රූපං සුඤ්ඤතො පස්සන්තො නිස්සරණතො ලොකං අවෙක්ඛති; වෙදනා සුඤ්ඤතො පස්සන්තො නිස්සරණතො ලොකං අවෙක්ඛති, සඤ්ඤං සුඤ්ඤතො පස්සන්තො නිස්සරණතො ලොකං අවෙක්ඛති, සඞ්ඛාරෙ සුඤ්ඤතො පස්සන්තො නිස්සරණතො ලොකං අවෙක්ඛති, විඤ්ඤාණං සුඤ්ඤතො පස්සන්තො නිස්සරණතො ලොකං අවෙක්ඛති" මෙහැම සුඤ්ඤතාධම්මානුපස්සනාවන්ගේ වසයෙන් ද — තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයන් අධිකතරප්‍රයොජනවශයෙන් සුඤ්ඤතාධම්මානුපස්සනාඥාණවසයෙන් නොයෙක් පරිද්දෙන් බලන යොගීහු විසින්-

"රූපඤ්ච වෙදනා සඤ්ඤා සෙසා චෙතසිකා -පෙ-
ජීතඤ්ච රන්කෙඛ අනිච්චෙසනො සියා ති."

යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම අජීය පරීක්‍ෂා කොට බලන යොගීහු විසින්-

"ආදාන නික්ඛෙපනතො වයො වුඩ්ඪි ගාමිතො-පෙ-
සච්චඨං ආහු පණ්ඩිතා ති."

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයන් මහුන් මරණ දූලක් සෙයින් ආදීනවානුපස්සනාඥාණවසයෙන් බලා ආරබ්ධ විදර්ශක ව නිවන් අරමුණු කොට පවත්නාවූ සුඤ්ඤතා ධම්මානුපස්සනා ඥාණ ධර්මයන් සිත්හි ලා වඩන්නාහට පරිකර්මභූමියෙහි පටන් ලොකෝත්තරධ්‍යාන චිත්තපර්‍ය්‍යාවසාන කොට විදර්ශනාභාවනාසඞ්ඛ්‍යාත සියලු ම මාර්ගභාවනාවෝ යථාක්‍රමයෙන් වැඩෙන්නාහු යයි සේයි.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයන් ධර්මාලම්බනප්‍රතිවශයෙන් සුඤ්ඤතාධම්මානුපස්සනාඥාණයෙන් නොයෙක් පරිද්දෙන් බලන යොගීහු විසින්.

වචීඝොසානුසාරෙන සොතවිඤ්ඤාණවීථියා;
පවත්තානන්තරුප්පන්නමනොද්වාරස්ස ගොචරා. (1)

---

1. භූමිපර්‍ය්‍යන්තරූපවෙදනාදිවචනයෙන් නිෂ්පන්න සවිඤ්ඤාණක ශබ්දයාගේ අනුසාරයෙන් (හෙවත්) ආලම්බනකරණ

අජ්ඣාසයානුසාරෙන විඤ්ඤායන්ති තතො පරං,
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා ලොකසඞ්කෙතනිම්මිතා. (1)

න චක්ඛුතො ජායරෙ ඵස්සපඤ්චමා
න රූපතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය භෙරියා. (2)

---

යෙන් පැවති ශ්‍රොතොවිඥනවීථියගේ ප්‍රවෘත්ති අනන්තර යෙහි උපන් නාමවිඥානාකාරයෙන් පැවති මනොද්වාරික විඥනයනට (හෙවත්) මෙබඳු අර්ථයාගේ මෙනොම යයි ප්‍රවෘත්ති යෙහි ම ගන්නාලද සංකෙතොපනිශ්‍රයට යම් නාමප්‍රඥප්ති යක් අරමුණු වූ දඃ-

1. නාමග්‍රහණයෙන් මෙතෙක යම් නාමප්‍රඥප්තියෙකුගේ අනුවපැවැත්මෙන් සමූහපරමාර්ථභෙද වූ භූමිපර්වත රූපවෙදනාදි වූ අර්ථයෝ දන්නා ලැබෙද්ද මේ අර්ථජාදි භෙද ඇති නාමප්‍රඥප්ති තොමෝ ලොකව්‍යවහාරයෙන් සිද්ධ වී මනොද්වාරිකවිඥනයෙන් ගන්නාලද අක්ෂරවලි සඞ්ඛ්‍යාත නාමප්‍රඥප්ති යයි දතයුත්තේයි. “මෙහි ශ්‍රොතොවිඥනවීථිය ට අනන්තරව භාවිනී වූ මනොද්වාරිකවීථිය ද ශ්‍රොතොවිඥන ග්‍රහණයෙන් ම සංග්‍රහ කොට “සොතවිඤ්ඤාණවීථියා” යි කියනලදී, එසේමැයි ස්වාදි වූ ශබ්දය අසන්නා හුට එකෙකී ශබ්දයක් අරභයාප්‍රත්‍යුත්පන්නාලම්බන අතීතාලම්බනවශයෙන් ජවනවාරයෝ දෙදෙන බුද්ධියෙන් ගන්නාලද නාමප්‍රඥප්ති වූ අක්ෂරවලිය නිසා එක්ශබ්දයෙකැයි මෙසේ ශ්‍රොතො විඥනවීථියට අනන්තර වූ අතීතශබ්දය අරමුණු කොට ඇති ජවනවීථි අනන්තර වූ නාමප්‍රඥප්තියගේ ගැන්මයි. එයින් ම මෙනතයි අර්ථාවබොධය වන්නේ යයි ආචාර්ය්‍යවරයෝ කිය ත්” යයි අභිධර්මාර්ථසංග්‍රහ සන්නයෙහි කියනලදී.

2. ස්පර්ශය පස්වෙනි කොට ඇති ධර්මයෝ චක්ෂුරායතන යෙන් නික්මීම් වශයෙන් උපදනාහු නොවෙත් රූපය කෙ රෙනුදු උපදනාහු නොවෙත් දෙදෙනා අතුරෙන් උපදනාහු දු නොවෙත් චක්ෂුස් රූපය ආලොකය මනස්කාරය යනාදී

න සොතතො ජායරෙ ඵස්සපඤ්චමා
න සද්දතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච-පෙ-පහටාය හෙරියා.

න ඝාණතො ජායරෙ ඵස්සපඤ්චමා
න ගන්ධතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච-පෙ-පහටාය හෙරියා.

න ජිව්හතො ජායරෙ ඵස්සපඤ්චමා
නො ච රසා නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච-පෙ-පහටාය හෙරියා.

න කායතො ජායරෙ ඵස්සපඤ්චමා
න ඵස්සතො නො ච උභින්නමන්තරා,
හෙතුං පටිච්ච-පෙ-පහටාය හෙරියා.

න චතුරූපා පභවන්ති සඞ්ඛතා
නචාපිධම්මායතනෙහි නිග්ගතා,
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාපි සද්දො පහටාය හෙරියා.

රූපෙසු සද්දෙසු අථොරසෙසු
ගන්ධෙසු ඵස්සෙසු ච රක්ඛමින්ද්‍රියං,
එතෙපි වාරා විවටා අරක්ඛිතා
හනන්ති ගාමංව පරස්සහාරිනො. (1)

---

හෙද ඇති නිශ්‍රයාදි ප්‍රත්‍යය වූ කාරණසාමග්‍රිය නිසා ප්‍රත්‍යොත්පන්න වූ ස්පර්ශාදිධර්මයෝ උපදිත්-ගසනලද බෙරයෙහි ශබ්දය මෙනි-(සෙසු ගාථාහිදු අපි මෙම නයයි.)

1. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශයන් විෂය කොට ගෙණ උපදනා කෙලෙසුන්ගෙන් දුරු කොට චක්ෂුරාදි ඉන්ද්‍රියයන් රක්ෂාකර මේ චක්ෂුරාදි ද්වාරයෝ හෝ ඒ චක්ෂුර්ද්වාරාදියෙහි ප්‍රවෘත්ත ශීලශයෝ සිහිනැමැති දොරින් නොවසනලද්දාහු එහෙයින් නොරක්නාලද්දාහු ගමක් පහරණ සොරුන් මෙන් ඒ නොපියනලද දොර ඇති පුද්ගලයා නසති (නොහොත්) ඒ කෙලෙසුන්ට අරමුණු වූ රූපාදිහු විවෘත වූ නොරක්නාලද චක්ෂුරාදිද්වාරයන් හෙතු කොට ගෙණ විවෘතද්වාරයෙන් සමන්විතයා නසති.

අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො,
අනත්තනි ච අත්තාති අසුභෙ සුභසඤ්ඤිනො,
මිච්ඡාදිට්ඨිහතා සත්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනො,
තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො,
තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං (1)

යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා,
වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා. (2)

---

1. යම්සේ වෘක්ෂයෙහි මුල උපද්‍රවයක් නැති කල්හි ස්ථිර ව පවත්නා කල්හි අගින් කපනලද්ද වූ ද වනස්පතිවෘක්ෂය නැවත හටගන්නේ ම ද එසේම තෘෂ්ණානුසය (හෙවත්) කාරණලාභයක් ඇති කල්හි මූෂිකාදිවිෂයක් මෙන් හැවත නැවත සන්තානයෙහි උපදනට නිසි වූ කාමරාගභවරාගානුසය අර්හත්මාර්ගඥානයෙන් සිඳ නො පියනලද කල්හි මේ ජාතිජරාමරණාදි දුක් රාශිය නැවත නැවත උපදනේ මැයි.

2. යම් පුද්ගලයෙකුට චක්ෂුරාදි ආධ්‍යාත්මිකායතනයන් විෂය කොට පවත්නා තෘෂ්ණාවිචරිතයෝ අටළොස්දෙනය රූපාදි බාහිරායතනයන් විෂය කොට පවත්නා තෘෂ්ණාවිචරිතයෝ අටළොස් දෙනය යන මේ තෘෂ්ණාවිචරිතයන්ගේ වශයෙන් සතිස් වැදෑරුම් තෘෂ්ණාශ්‍රොතසින් සමන්විත වූ මනාප වූ රූපාදි අරමුණෙහි ශ්‍රවත්ව පවත්නා වූ තෘෂ්ණා තොම බලවත් ව උපදී ද විපන්න වූ බුද්ධි ඇති බැවින් නුවන නැති ඒ පුද්ගලයා ධ්‍යානයක්වත් විදර්ශනාවක්වත් ඇසුරු නො කොට රාගය ඇසුරු කළාවූ විතර්කයෝ නැවත නැවත උපදනා බැවින් බලවත් වූවාහු අපායට පමුණුවනනාහ·

සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති,
තඤ්ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ. (1)

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදාසතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති. (2)

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො–පෙ–
නිද්දරො හොති නිප්පාපො ධම්මපීති රසං පිබං.

යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙසුවෙ,
අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං. (3)

---

1. තෘෂ්ණා ශ්‍රොතස්හු (හෙවත්) තෘෂ්ණා නැමැති ගංගා
ප්‍රවාහයෝ චක්ෂුරාදීන්ගේ වශයෙන් රූපාදිෂඩාරම්මණ
යෙන් ද කාමභවාදි සියලු භවයෙන් ද වැහෙනහෙයින් හැම
තැන්හි ම පවත්නාහු නම් වෙති, භවයෙන් භවය වලදනා අ
පීයෙන් ශිවනාපීයෙන් ද ලතානම් වූ තෘෂ්ණා තොම සදෙවාරි
න් ඉපද රූපාදි ෂඩාරම්මණයෙහි පවත්නීය එසේ උපන්නා
වූ ඒ තෘෂ්ණාලතාව උත්පත්තිස්ථානවශයෙන් දක වෙනෙහි
ගටගත් පියවිලියයක් සැතකින් කපන්නෙකු මෙන් මාර්ග
ප්‍රඥාවෙන් මුලිම්ම සිඳපියව්,

2. එම්බා මොඝරාජ නම් මාණවකය නිතර ම සිහිනුවණි
න් යුක්ත ව තමන්ට අයිති නොවී පවත්නා බව සැලකීම්වශ
යෙන් හෝ සංස්කාරයන්ගේ අනිත්‍යාදි ස්වභාවය බැලීම්වශ
යෙන් හෝ යන දෙයාකාරයෙන් ශූන්‍යවශයෙන් ලොකය බ
ලව මෙසේ ආත්මානුදෘෂ්ටිය (හෙවත්) සත්කායදෘෂ්ටිය ඉක්
මවා මරුවා ඉක්මවන්නේය, මෙපරිද්දෙන් ලොකය බලන්
නාහු මෘත්‍යුරාජ තෙම නොදකී.

3. බාලයන්ගේ නින්දා ප්‍රශංසා දෙක ප්‍රමාණ නොවනබැ
වින් ප්‍රාඥයෝ දවසක් පාසා නින්දාවට හා ප්‍රශංසාවට කාර
ණය දැනගෙණ යමෙකුට ප්‍රශංසා කෙරෙද්ද අච්ඡිද්‍රශික්ෂා
වෙහි පවත්නා (නොහොත්) අච්ඡිද්‍රජීවිතවෘත්ති ඇති වි
දර්ශනඥානයෙන් සමන්විත වූ ලෞකිකලොකොත්තරප්‍රඥා
වෙන් හා චතුෂ්පාරිශුද්ධිශීලයෙන් ද සමන්විත වූ ඔහුට —

නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති,
දෙවාපි තං පසංසන්ති බ්‍රහ්මුණාපි පසංසිතො'ති. (1)

මොවුන් සුඤ්ඤතා ධම්මානුපස්සනාඤාණවසයෙන් නොයෙක් පරිද්දෙන් බලන පරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනාභාවනා සඞ්ග්‍රහයෙහි අටවන සුඤ්ඤතාධම්මානුපස්සනාඤාණ සඞ්ග්‍රහය නිමි.

---

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධධර්මයන් අධිප්‍රඥාධම්මානුපස්සනාඤාණයෙන් සර්වප්‍රකාරයෙන් බලා භාවනාකරණ්නවුන් විසින් භාවනාකරණ පරිදි කිසේයත්? හීන නුවනැතියහු විසින් 'අනිච්චං දුක්ඛං අනත්තා'' යි කියාද මධ්‍යම නුවනැතියහු විසින් ජැයින් උපන්මි, ජරාවෙන් පිරිකෙමි, ව්‍යාධියෙන් පෙළෙමි, මරණින් සුන්සුන් බවට පැමිණෙමි, ''අනිච්චං දුක්ඛං අනත්තා'' යනාදීන් රූපධර්මයන්ගේ වශයෙන් ද, වැඩි නුවනැතියහු විසින් මේ සියළු ම චිත්තචෛතසිකධර්මයෝ ''කාමභූමිය, රූපභූමිය, අරූපභූමිය, ලොකොත්තරභූමිය'' යන මොවුන්ගේ වශයෙන් ''සංක්ෂෙපපක්ෂයෙන් එකුනනූ චිත්තකෙනෙක් වෙති, මධ්‍යමපක්ෂයෙන් එක්සිය එක්විසි චිත්තකෙනෙක් වෙති, උත්කෘෂ්ටපක්ෂයෙන් සාරලක්ෂ තෙසැටදහස් සත්සිය පන්තිස් චිත්තකෙනෙක් වෙති'' යි යනාදීන් අරූපධර්මයන්ගේ වශයෙන් ද. මෙකියනලද ප්‍රකාර ඇති නාමරූපධර්මයන් උත්පාදස්ථිතිභඞ්ගවශයෙන් බලා ''ඛයට්ඨෙන අනිච්චං, පීළනට්ඨෙන දුක්ඛං, අවසවත්තනට්ඨෙන අනත්තා'' යි යනාදීන් අනිච්චානුපස්සනාදි තුන් අනුපස්සනාවන්ගේ වශයෙන් ද බැවියයුතුයි.

---

1. ජාම්බොනදකනප්‍රජයකට මෙන් නිඥාකරන්නට කවරෙක් සුදුසුද ඒ මහණට දෙවියෝ ද නුවනැති මිනිස්සු ද ප්‍රශංසා කෙරෙති දෙව් මිනිසුන් තබා මහානුභාව ඇති මහාබ්‍රහ්මයා විසිනුදු ප්‍රශංසාකරණලද්දේ ම වේ.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයෙහි—

"යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මං ති" යි වදාළ හෙයින් මේ සියලු සංස්කාරධර්මයෝම ඉපද නස්නා හෙයින් අනිත්‍යයහ, උදවියෙන් පෙළෙන හෙයින් දුඃඛයහ, තමා විසිය නොපවත්නා හෙයින් අනාත්මයහ, නිත්‍ය වූ එක ද ධර්මයකුදු නැත්තාහ. එහෙයින් 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා" යි යනාදීන් උදයව්‍යයානුපස්සනාදි නවවිධ අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධයෙහි "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා" යි යනාදීන් සසර අනිත්‍ය වශයෙන් බලා එහි නිමිත්ත නොකළා වූ අනිමිත්ත විමොක්ෂය, සසර දුක් වශයෙන් බලා එහි ප්‍රණිධි නොකළා වූ අප්‍රණිහිත විමොක්ෂය, පඤ්චස්කන්ධ නැමති ධර්මපුඤ්ජය අනාත්ම වශයෙන් බලා ආත්මශූන්‍යත්ව දර්ශනය කළ ශූන්‍යතා විමොක්ෂය, යන අටළොස් විමොක්ෂධර්මයන් අධිප්‍රඥාධර්මානුපස්සනා ඥාණවශයෙන් සම්ප්‍රකාරයෙන් බලා "එවං අනිච්චා සඞ්ඛාරා, එවං අධුවා සඞ්ඛාරා, එවං අනස්සාසිකා සඞ්ඛාරා, යාවඤ්චිදං අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං ති" යනාදීන් මුඤ්චිතුකම්‍යතාඥානයෙන් සියලු සංස්කාරධර්මයන් කෙරෙහි මිදියාමෙහි ගුණ සලකා සඞ්ඛාරුපෙක්ඛාඥාණ සපසං ජාත්‍යාදී සියලු දුඃඛයන්ගේ නැසීම පිණිසද, ආසන්නභවවාසනා පිණිසද, අප්‍රමාදව නොපමණ භාවනා කරවි, මේ හැම අධිප්‍රඥාධර්මානුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම ජාතිසඞ්ඛාත පඤ්චස්කන්ධධර්මයන් අධිකතර ප්‍රයොජනවශයෙන් අධිප්‍රඥාධර්මානුපස්සනාඥාණයෙන් සම්ප්‍රකාරයෙන් බලා භාවනාකරණ යොගීහු විසින්—

"රූපඤ්ච වෙදනා සඤ්ඤා - සෙසා චෙතසිකා තථා - පෙ -
ජීතඤ්ච රෙනඛ අනිච්චඝෙනා සියා" ති.

යනාදි අනුපස්සනාවන්ගේ වශයෙන් ද.

තව ද මෙම අර්ථය ප්‍රකාශකොට බලන යෝගීහු විසින් -
“ආදාන නික්ඛෙපනතො - පෙ - සබ්බසො ආහු පණ්ඩිතා” ති

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධධර්මයන් දුරින් දුරු කොට ම දැකුම් සුදුසු වූ ඝෝරවිෂ ආශීවිෂයන් සෙයින් භයතූපට්ඨානඤාණවශයෙන් බලා ආරබ්ධවිදර්ශකව නිවන් අරමුණු කොට පවත්නා වූ අධිපඤ්ඤාධම්මානුපස්සනාඤාණ සඞ්ඛ්‍යාත විමොක්ෂධර්මයන් සර්වප්‍රකාරයෙන් බලා සිත් හි ලා වඩන්නාහට පරිකර්මභූමියෙහි පටන් අග්‍රඵලචිත්ත පර්‍යවසාන කොට විදර්ශනාභාවනා සඞ්ඛ්‍යාත සියලු මාර්ගභාවනාවෝ යථාක්‍රමයෙන් වැඩෙන්නාහු යයි සේයි.

තව ද මෙම ජාතිසඞ්ඛ්‍යාතපඤ්චස්කන්ධධර්මයන් ධර්මාලම්බන ප්‍රීතිවශයෙන් අධිපඤ්ඤාධම්මානුපස්සනාඤාණයෙන් සර්වප්‍රකාරයෙන් බලා භාවනාකරණ යෝගීහු විසින්.

යථෙව චක්ඛුවිඤ්ඤාණං මනොධාතුඅනන්තරං,
නචෙව ආගතං නාපි න නිබ්බත්තං අනන්තරං. (1)

තථෙව පටිසන්ධිම්හි වත්තතෙ චිත්තසන්තති,
පුරිමං භිජ්ජති චිත්තං පච්ඡිමං ජායතී තතො. (2)

තෙසං අන්තරිකා නත්ථි වීචි තෙසං න විජ්ජති,
න චිතො ගච්ඡති කිඤ්චි පටිසන්ධි ච ජායති. (3)

---

1. යම්සේ ක්‍රියාමනොධාතුවට අනතුරුව ලැබෙන චක්ෂුර්විඥානය ක්‍රියාමනොධාතුවෙන් නොම ආයේද ක්‍රියාමනොධාතුවට අනතුරුව ප්‍රත්‍යයසාමග්‍රියෙන් නො උපන්නේ නොවේ ද.

2. එපරිද්දෙන් ම ප්‍රතිසන්ධියෙහි චිත්තසන්තතිය පවති පූර්වච්‍යුතිචිත්තය බිඳෙයි පශ්චිම ප්‍රතිසන්ධිචිත්තයට අනතුරුව ම උපදී.

3. ඒ ච්‍යුතිප්‍රතිසන්ධිචිත්තයන්ගේ අතරක් නැත්තේස ඔවුන්ගේ අතරක් නො ලැබේ මෙයින් සම්ප්‍රයුක්තධර්මයන් එහි ම නිරුද්ධවනබැවින් කිසිවෙක් නොයේ ප්‍රතිසන්ධියද ප්‍රත්‍යය වූ පරිද්දෙන් වේ.

ඡධා නාමන්තු නාමස්ස පඤ්චධා නාමරූපිනං,
එකධා පුන රූපස්ස රූපං නාමස්ස චෙකධා. (1)

පඤ්ඤත්ති නාමරූපානි නාමස්ස දුවිධා ද්වයං,
ද්වයස්ස නවධා චෙති ඡබ්බිධා පච්චයා කථං. (2)

සහජාතං පුරෙජාතං පච්ඡාජාතඤ්ච සබ්බථා,
කබලිංකාරෙ ආහාරෙ රූපජීවිතමිච්චයං. (3)

සලක්ඛණපරිච්ඡින්නෙන පච්චයායත්තවුත්තිකෙ,
ඛණෙ නිබ්බිරියාභොගෙ කුතො සත්තොපලබ්භති. (4)

නාමඤ්ච රූපඤ්ච ඉධත්ථි සච්චතො
නහෙත්ථ සත්තො මනුජො ච විජ්ජති,
සුඤ්ඤං ඉදං යන්තමිවාභිසඞ්ඛතං
දුක්ඛස්ස පුඤ්ජො තිණකට්ඨසාදිසො.

---

1. වෙදනාදි චතුඃස්කන්ධ නිර්වාණසංඛ්‍යාත නාමය වනාහි එසේ ම වූ නාමයට ෂට්ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ, ඒ නාම රූපයන්ට පස් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙයි රූපයට වනාහි එක් පරිද්දකින් ප්‍රත්‍යය වෙයි රූපය තෙම නාමයට එක් පරිද්දකින් ප්‍රත්‍යය වෙයි.

2. ප්‍රඥප්ති නාමරූපයෝ නාමයට දෙපරිද්දකින් ප්‍රත්‍යය වෙති නාමරූපද්වය නාමරූපද්වයට නව ප්‍රකාරයකින් ප්‍රත්‍යය වෙති ප්‍රත්‍යයෝ මෙසේ ෂට්ප්‍රකාර වෙති.

3. සර්වප්‍රකාරයෙන් නාමවශයෙන් කියනලද ත්‍රිවිධ වූ සහජාතය ද ද්විවිධ වූ පුරෙජාතය ද එකවිධ වූ පශ්චාජ්ජාතය ද යන ප්‍රත්‍යයරාශ ද කබලිඞ්කාරාහාරය ද රූපජීවිතෙන්ද්‍රියය ද යන (මේ පස් වැදෑරුම් වූ ප්‍රත්‍යය තෙම අස්තිප්‍රත්‍යය ද වෙයි අවිගතප්‍රත්‍යය ද වෙයි.)

4. කක්ඛලත්වාදි තමතමන්ගේ ලක්ෂණයෙන් පිරිසිඳුනු (කක්ඛලත්වාදි ස්වභාව මාත්‍රයමුත් අන් කිසිවක් නැති) උත්පාදාදි අවස්ථාවෙහි තමතමන්ට නිසි ප්‍රත්‍යයයන් අයිතිව පවත්නා වූ ප්‍රත්‍යයායත්ත උත්පාදාදි ප්‍රවෘත්ති ඇති ප්‍රත්‍යයන් නිසා වන්ට දී ඔවුනොවුන් සහජාතවන්ට ද උත්සාහ ආභොග නැති පඨවිධාත්වාදි භූතොපාදායරූපසමූහයෙහි සත්වයෙක් නම් කොයින් ද? කවර ප්‍රකාරයෙකින් ලැබන්නේ ද ? නො ලැබෙන්නේයි.

යමකං නාමරූපඤ්ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා
එකස්මිං භිජ්ජමානස්මිං උභො භිජ්ජන්ති පච්චයා.

සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා. (1)

සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා. (2)

සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එසමග්ගො විසුද්ධියා. (3)

•

වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො,
අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බාපරානි ච,
සවෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො, මහාපුරිසොති වුච්චති. *

---

1. සියලුම ත්‍රෛභූමික සංස්කාරයෝ ඒ ඒ භවයෙහිම උපද නස්නාහෙයින් අනිත්‍යයහයි යම් කලෙක විදර්ශනා ප්‍රඥාවෙන් දකී ද එකල්හි මේ ස්කන්ධ පරිහරණයයි කියනලද දුක්ඛයෙහි මුදුන් පැමිණියා වූ ව්‍යුත්ථානගාමිනී විදර්ශනා වශයෙන් කලකිරෙන්නේය මේ සංස්කාරයන් කෙරෙහි කලකිරීම නිර්මලභාවයට හෝ නිර්වාණයට මාර්ගයයි.

2. සියලුම ත්‍රෛභූමික සංස්කාරයෝ උදයව්‍යයෙන් පෙළෙනහෙයින් දුක්ඛයහයි යම් කලෙක්හි විදර්ශනා ප්‍රඥාවෙන් දකී ද -පෙ-

3. නිර්වාණප්‍රඥප්තිසහිත වූ සියලුම ධර්මයෝ අනාත්මයහයි යම්කලෙක විදර්ශනාඥානයෙන් දකී ද එකල්හි මේ ස්කන්ධපරිහරණයයි කියනලද දුක්ඛයෙහි මුදුන් පැමිණියා වූ ව්‍යුත්ථානගාමිනී විදර්ශනාවශයෙන් කලකිරෙන්නේය මෙතෙම නිර්මලභාවයට හෝ නිර්වාණයට මාර්ගයයි.

---

*. මේ පොත මුද්‍රණය කරවන බුලත්සිංහලයේ කොරනේලිස් කුරේ අප්පුහාමි දූනට බලවත් රොගයකින් ආතුරව ඉන්නබැවින් මේ වැඩය විසාල කොට කිරීමෙහි දුෂ්කරතාවයක් පැමිණ තිබේ එබැවින් වැඩය ඉක්මනට නිමවනු පිණිස මෙතැන් පටන් අප විසින් ලියනලද භාවබොධ හා සන්නය යට යෙදූලෙස නො යොදනබව දතයුතු.

එවමෙතං අභිඤ්ඤාය නිබ්බු බුද්ධස්ස සාවකො - පෙ - නිද්දරො හොති නිප්පාපො ධම්මපීති රසං පිබං.

යෙ වඩ්ඪිතා පරිසුද්ධසීලා
සන්තාසසාරා පවිවෙකරාමා,
අපරිමජ්ඣා ධම්මධරානුයොගී
තෙ ලොකනාථං අභිපූජයන්ති.

තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා,
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා.

බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං,
නෙක්ඛං ජම්බොනදස්සෙව - පෙ - බ්‍රහ්මුනාපි පසංසිතොති

මොවුන් අධිපඤ්ඤා ධම්මානුපස්සනා ඥාණවශයෙන් සර්වප්‍රකාරයෙන් බලා භාවනාකරණුවන් විසින් භාවනාකරණ පරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනා භාවනාසඞ්ග්‍රහයෙහි නවවන අධිපඤ්ඤා ධම්මානුපස්සනා ඥාණසඞ්ග්‍රහය නිමි.

## ප්‍රකීර්ණක නාමරූප විදර්ශනායි.

---

තව ද මෙම විදර්ශනා භාවනා සඞ්ඛ්‍යාත නිර්වාණගාමිනී ප්‍රතිපත්ති ධර්මයන් ප්‍රතිපත්ත්‍යඞ්ගවශයෙන් අනෙකප්‍රකාරයෙන් බලා සිත්හි ලා වඩන පරිදි කිසේයත් ?

“සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි — කතමා ච භික්ඛවෙ සම්මාදිට්ඨි ? දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං අයං වුච්චති භික්ඛවෙ සම්මාදිට්ඨි — කතමො ච භික්ඛවෙ සම්මාසඞ්කප්පො ? නෙක්ඛම්මසඞ්කප්පො අව්‍යාපාදසඞ්කප්පො අවිහිංසාසඞ්කප්පො අයං වුච්චති භික්ඛවෙ සම්මාසඞ්කප්පො — කතමා ච භික්ඛවෙ සම්මාවාචා ? මුසාවාදා වෙරමණී, පිසුනාවාචා වෙරමණී, ඵරුසාවාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී,

අයං වුච්චති භික්ඛවෙ සම්මාවාචා — කතමො ච භික්ඛවෙ සම්මාකම්මන්තො? පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චති භික්ඛවෙ සම්මාකම්මන්තො — කතමො ච භික්ඛවෙ සම්මාආජීවො? ඉධ භික්ඛවෙ අරියසාවකො මිච්ඡා ආජීවං පහාය සම්මා ආජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති භික්ඛවෙ සම්මාආජීවො — කතමො ච භික්ඛවෙ සම්මාවායාමො? ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති—උප්පන්නානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති—අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති—උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාපාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති—අයං වුච්චති භික්ඛවෙ සම්මාවායාමො — කතමා ච භික්ඛවෙ සම්මාසති? ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං—වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං—චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං—ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං—අයං වුච්චති භික්ඛවෙ සම්මාසති — කතමො ච භික්ඛවෙ සම්මාසමාධි? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති—විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති—පීතියා ච විරාගා උ

පෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරති—සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙ ව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති—අයං වුච්චති භික්ඛවෙ සම්මාසමාධීති" යනාදි ප්‍රතිපත්තිවන්ගේ වශයෙන් ද.

තව ද මෙම නිර්වාණගාමිනී ප්‍රතිපත්තියෙහි—

"දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා" යනාදින් වදාරණලද දෙශනානුක්‍රමයෙන් චතුෂ්කනය පඤ්චකනය වශයෙන් ප්‍රථමධ්‍යානාදියෙහි යම්සේ ද එපරිද්දෙන් ඒ ඒ ධ්‍යානවිපස්සනාපාදකාවසාන කොට සිටියා වූ නය සහස්‍රප්‍රතිපාදක වූ "සුඤ්ඤතපටිපදාය, සුඤ්ඤතසුඤ්ඤතාය, සුඤ්ඤතාපටිපදාය, සුඤ්ඤතඅප්පණිහිතාය, අප්පණිහිතපටිපදාය" යනාදින් පඤ්චවිධවූ ශූන්‍යකප්‍රතිපදාවෝ ද, "නිර්වාණගාමී ප්‍රතිපදාවෝ නම් වෙති" යි [1] ප්‍රතිපදාඥානවශයෙන් අනෙකප්‍රකාරයෙන්

---

1. සෝවාන්ඵලය සම්බන්ධ සහස්‍රනය නම්—"යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං-පෙ-දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං-සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං-සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං—පඨමාය භූමියා පත්තියා; විතක්කවිචාරානං වූපසමා-පෙ-දුතියං ඣානං භාවෙති—පීතියා ච විරාගා උපෙක්ඛකො—තතියං ඣානං උපසම්පජ්ජ විහරති—උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං-යනාදීන් දෙශිත ධ්‍යානයන්ගේ චතුෂ්ක නයින් ද—සවිතක්කං සවිචාරං-පඨමං ඣානං උපසම්පජ්ජ විහරති අවිතක්කං විචාරමත්තං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං—විතක්කවිචාරානං වූපසමා තතියං ඣානං පීතියාච විරාගා

චතුත්ථං ඣානං-සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා—පචමං ඣානං, උපසම්පජ්ජ විහරති—දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං තස්මිං සමයෙ ඵස්සො හොති යනාදීන් දෙසිත පඤ්චනයින්ද යි, මෙසේ ධ්‍යානයන්ගේ චතුෂ්කනය පඤ්චකනය වශයෙන් ශුද්ධිකපටිපදායෙහි නය දෙකෙක් වෙයි—යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති-පෙ-උපසම්පජ්ජ විහරති සුඤ්ඤතං තස්මිං සමයෙ ඵස්සො හොති-යනාදීන් දෙසිත ධ්‍යානයන්ගේ චතුෂ්කපඤ්චකනය වශයෙන් ශුද්ධිකශූන්‍යතායෙහි නය දෙකෙක් වෙයි—යස්මිං සමයෙ-පෙ-උපසම්පජ්ජ විහරති, දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං, සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං—තස්මිං සමයෙ ඵස්සො හොති, යනාදීන් දෙසිත සුඤ්ඤතාපටිපදායෙහිද ධ්‍යානයන්ගේ චතුෂ්ක පඤ්චක නය වශයෙන් නය දෙකෙක් වෙයි—යස්මිං සමයෙ-පෙ-උපසම්පජ්ජ විහරති අප්පණිහිතං තස්මිං සමයෙ ඵස්සො හොති, යනාදීන් දෙසිත ශුද්ධික අප්පණිහිතයෙහිද ධ්‍යානචතුෂ්ක පඤ්චක වශයෙන් නය දෙකෙක් වෙයි—යස්මිං සමයෙ-පෙ-උපසම්පජ්ජ විහරති, දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං, දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං—සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං, සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං, අප්පණිහිතං, තස්මිං සමයෙ ඵස්සො හොති-යනාදීන් දෙසිත අප්පණිහිත පටිපදායෙහි ධ්‍යාන චතුෂ්ක පඤ්චක වශයෙන් නය දෙකෙක් වෙයි.

මෙසේ ශුද්ධිකපටිපදාය, ශුද්ධිකසුඤ්ඤතාය, සුඤ්ඤතාපටිපදාය, ශුද්ධිකඅප්පණිහිතය, අප්පණිහිතපටිපදාය, යන මේ පස් කොටස්හි ලා එක එක් කොටසෙහි ධ්‍යානයන්ගේ චතුෂ්කනය හා පඤ්චක නයින් නය දෙක දෙක වනබැවින් ලොකොත්තර ධ්‍යානයෙහි ම නය දසයක් දක්වනලදහ- එපරිද්දෙන් ම—ලොකුත්තරං මග්ගං භාවෙති ලොකුත්තරං සතිපට්ඨානං භාවෙති සම්මප්පධානං, ඉද්ධිපාදං, ඉන්ද්‍රියං, බලං, බොජ්ඣඞ්ගං, සච්චං, සමථං, ධම්මං, ඛන්ධං, ආයතනං, ධා

බලා "අද්ධා ඉමාය පටිපදය ජරාමරණම්හා මුච්චිස්සාමීති" යනාදි පාලිධර්මයන් සම්ස්මරණය කොට "වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා" යි යනාදීන් ආදි කොට වදාළ අන්තමධ්‍යවර්ජිත මධ්‍යම ප්‍රතිපදාවන් පරිපූරණය කිරීමෙන් ජාතිජරාමරණ සඞ්ඛ්‍යාත සියලු ම සංස්කාර-දුඃඛයන්කෙරෙන් ද මිදෙමියි "අප්පමාදෙන සම්පාදෙථ භික්ඛවෙ" යි යන්නෙන් හකුලුවා වදාළ පශ්චිම බුද්ධවචනයට අනුක්‍රියාකිරීමෙන් අමෘතමහානිර්වාණය ද සාක්ෂාත්කෙරෙමියි යන එකාවන් අදහස් ඇතිව ස්ථානනිෂද්‍යාදි චතුර්විධ ඊර්‍යාපථ පරිවර්තිතයෙහි චතුර්විධ වීර්‍යයෙන් යුක්ත සම්‍යග්දෘෂ්ටිය පෙරදැරි කොට ඇත්තා වූ ශීලව්‍රතාදි සියලු ම ප්‍රතිපදා ධර්මයන් ආසෙවිත භාවිත බහුලීකෘතාදිවශයෙන් අප්‍රමාදව සිත්හි ලා වඩව්.

තව ද මෙම නිර්වාණගාමිනී ප්‍රතිපත්තිධර්මයන් උපමාවශයෙන් ප්‍රතිපත්තිඥානයෙන් බලා සිත්හි ලා වඩන යොගීහු විසින්-යම්සේ එකභූමක ද්විභූමක ත්‍රිභූමකාදි මහත් ප්‍රාසාදයක්හුගේ මතුමහල්තලයට පැමිණෙනු කැමැත්තා වූ පුරුෂයෙක් සොපානමාලාවන් කරණකොට ගෙණ අභිමතස්ථාන වූ මතුමහල්තලයට පැමිණේද, එපරිද්දෙන් ම මාර්ගඵල නැමති මහාප්‍රාසාදයාගේ අභීත්ඵල නැමැති මතුමහල්තලයට පැමිණෙනු කැමති සත්පුරුෂයන්ට සොපානමාලාවක් බඳු වූ

---

තුං, ආහාරං, ඵස්සං, වෙදනං, සඤ්ඤං, චෙතනං, චිත්තං, භාවෙති, යනාදීන් දෙශිත මාර්ගාදි විසිතන්හිදු ධ්‍යානයන්ගේ චතුෂ්කනය පඤ්චකනය වශයෙන් නය දෙක දෙක වෙයි—මේ දක්වනලද විසි තන්හි යට කියනලද දශ නය යෙදුනුකල්හි නය දෙසියයක් වෙති—යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං-පෙ-උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං ඡන්දාධිපතෙය්‍යං-පෙ-විරියාධිපතෙය්‍යං, චිත්තාධිපතෙය්‍යං, වීමංසාධිපතෙය්‍යං, යනාදීන් දෙසිත වූ අධිපති සතරෙහිදු නය දෙසිය දෙසිය වෙති—මෙකියනලද අටසියය හා යට කියනලද දෙසිය සංයුක්තකල කල්හි සුඤ්ඤතපටිපදාදිය ධ්‍යානයන්ගේ චතුෂ්කනයාදි වශයෙන් වඩනලද සහස්‍රනය දතයුතු.

සම්‍යග්දෘෂ්ටිය පෙරදැරි කොට ඇත්තා වූ ශීලව්‍රතාදි සියලු ම ප්‍රතිපත්තිධර්මයන් මෙසේ උපමා වසයෙන් ද බලා අප්‍රමාදව සිත්හි ලා වඩන්නේයයි සේයි.

තව ද මෙම නිර්වාණගාමිනී ප්‍රතිපත්තිධර්මයන් ධර්මාලම්බනප්‍රවෘත්තිවශයෙන් ප්‍රත්‍යවේක්ෂාඥානයෙන් බලන යොගීහු විසින්-

"වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා,
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං.

උට්ඨානකාලම්හි අනුට්ඨහානො
යුවා බලී ආලසියං උපෙතො,
සංසන්නසඞ්කප්පමනො කුසීතො
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති.

උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකං ව පාණිනා,
සන්තිමග්ගමෙව බ්‍රූහය නිබ්බාණං සුගතෙන දෙසිතං.

දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති

එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො—පෙ—
නිද්දරො හොති නිප්පාපො ධම්මපීති රසං පිබං

න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා

එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො
නිබ්බාණගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ" යි.

මේ විදර්ශනාභාවනා සඞ්ඛ්‍යාත නිර්වාණගාමිනීප්‍රතිපත්ති ධර්මයන් ප්‍රත්‍යවේක්ෂාඥානවශයෙන් අනෙකප්‍රකාරයෙන් බලා සිත්හි ලා වඩන පරිදි මෙසේ දතයුතු.

මෙතෙකින් මේ විමුක්ති සඞ්ග්‍රහ නම් වූ විදර්ශනා
…නා සඞ්ග්‍රහයෙහි දසවන ප්‍රත්‍යවේක්ෂාසඞ්ග්‍රහය නිමි.

## ප්‍රතිපදාඥාන විදර්ශනායි.

තව ද මෙම විදර්ශනා භාවනා සඞ්ඛ්‍යාත ත්‍රිලක්ෂණානුදර්ශනඥානධර්මයන් සිත්හි ලා වැඩීමෙහි ආනිසංස කියේ නයත් ? මෙසේ අනෙක ක්‍රමයෙන් විභාගකරණලද ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය බල බොධ්‍යඞ්ග සඞ්ඛ්‍යාත සංස්කාරධර්මයන් අනිත්‍යාදි වශයෙන් බලා ත්‍රිලක්ෂණානුදර්ශනඥාන ධර්මයන් අතුරෙන් එම් එම් ධර්මයක් යමක් තිරිසිදක් ද්‍යෝතා පමණ කාලයක් ආලම්බනකරණ වශයෙන් සිත්හි ලා වඩා විදර්ශනාධර්මයන් මුහුකුරුවා ද ඕහට වඩනා කුසල් සතරමහාසාගරයෙහි ජලස්කන්ධයට වඩා අසඞ්ඛ්‍ය වේ අප්‍රමෙය වේ.

"අනිච්චං, අනිච්චං" කියා අනිච්චානුපස්සනාඥාණය වඩා බුදුබව පැතුයේ සොළසාසඞ්ඛ්‍ය කප් ලක්ෂයකින් බුදු වේ. "දුක්ඛං, දුක්ඛං" කියා දුක්ඛානුපස්සනාඥාණය වඩා බුදු බව පැතුයේ අටාසඞ්ඛ්‍ය කප් ලක්ෂයකින් බුදු වේ—"අනත්තා අනත්තා" කියා අනත්තානුපස්සනාඥාණය වඩා බුදු බව පැතුයේ සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයකින් බුදු වේ.

නහි සීලවතං හෙතු උප්පජ්ජන්ති තථාගතා,
අක්ඛරා තිණ්ණිපදා සම්බුද්ධෙන පකාසිතා.

අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීණං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණාති.

ආනිසංස, මෙසේ දතයුතු.

තව ද "කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා" සඞ්ඛ්‍යාත සියලු ම ක්ලෙශධර්මයන් කෙරෙන් මුක්ත වූ අර්ථයෙන් ද

නොහොත්-"තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡෙද, පටිප්‍රශ්‍රබ්ධි, නිස්සරණ" සඞ්ඛ්‍යාත පඤ්චවිමුක්තීන්ගේ ප්‍රාප්ති අර්ථයෙන් විමුක්තියයි කියනලද නිවන්නම් කිසේද යත්?

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො නිරොධො නිබ්බාණන්ති" යනාදි පාලි වශයෙන් ද — තව ද "තදඞ්ග විමුක්තිය විෂ්කම්භණ විමුක්තිය සමුච්ඡෙද විමුක්තිය ප්‍රතිප්‍රශ්‍රබ්ධි විමුක්තිය නිස්සරණවිමුක්තිය" යන පඤ්ච විමුක්තීන්ගේ වශයෙන් ද — තව ද "තදඞ්ගප්‍රහාණය විෂ්කම්භණප්‍රහාණය සමුච්ඡෙදප්‍රහාණය ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණය නිස්සරණ ප්‍රහාණය" යන පඤ්චප්‍රහාණයන්ගේ වශයෙන් ද තවද සීලවිසුද්ධිය චිත්තවිසුද්ධිය දිට්ඨිවිසුද්ධිය කඞ්ඛාවිතරණවිසුද්ධිය මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය පටිපදාඤාණදස්සනවිසුද්ධිය ඤාණදස්සනවිසුද්ධිය" යන සප්ත විසුද්ධීන්ගේ ද පරම්පරාවෙන් අර්හත්මාර්ගඥානයට ආලම්බනකරණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු වූ කාමභවය රූපභවය අරූපභවය යනාදි නවභවය නවසත්තාවාසය සප්තවිඤ්ඤාණස්ථිතිය පඤ්චගතිය චතුර්විධ යොනිය යන සසරහා නොහැනි සිටියා වූ අජර වූ අමර වූ ශාන්ත වූ ප්‍රණීත වූ සුව කෙළවරක් නැත්තා වූ හෙතු නිසා නූපන්නාවූ නීලය පීතය ලොහිතය යනාදි වර්ණ රහිත වූ හ්‍රස්වය දීර්ඝය යනාදි සංස්ථාන රහිතවූ ස්ථාන නියමයක් කාල නියමයක් නැත්තාවූ වානසඞ්ඛ්‍යාත භවතෘෂ්ණාවෙන් නික්මුණුහෙයින් නිර්වාණයයි කියනලද පරමාර්ථ පදාර්ථය තෙම නිවන් නම් වේ.

තව ද මෙම නිර්වාණාර්ථය උපමා වශයෙන් බලන යොගීහු විසින් යම්සේ අග්නිස්පර්ශය සියලු ම බීජයන්ගේ අඞ්කුරොත්පත්තියට කාරණ නොවේ ද, එපරිද්දෙන් ම අර්හත්මාර්ගඥාන නැමති ගින්නෙන් අනාගත භවොත්පත්තියට කාරණ වූ තෘෂ්ණාබීජයන්ගේ ක්ෂයකිරීම "නිවන්" නම් වන්නේ යයි සේයි.

තව ද මෙම නිර්වාණාර්ථය ධර්මාලම්බනප්‍රත්‍යවශයෙන් බලන යොගීහු විසින්—

අක්ඛතං අනන්තං සන්තං අමතං අපලොකිතං,
පණීතං සරණං ඛෙමං තාණං ලෙණං පරායණං.

සිවඤ්ච නිපුණං සච්චං දුක්ඛක්ඛයමනාසවං,
සුදුද්දසං පරං පාරං නිබ්බාණමච්චිද්දස්සනං.

තණ්හක්ඛයං ධුවං දීපං අබ්‍යාපජ්ජමනීතිකං,
අනාලයමරූපඤ්ච පදමච්චුතමක්ඛරං.

විරාගඤ්ච නිරොධඤ්ච විමුත්තිං මුත්තිමෙවච,
එතානි පන නාමානි නිබ්බාණස්ස කථීයති.

නිවන් මෙසේ දතයුතු.

තව ද මෙම විදර්ශනාසඞ්ඛ්‍යාත සුඛදුඃඛාදි ධර්මයන්ට මධ්‍යස්ථ ලක්ෂණවූ 'උපෙක්ඛාසතිපාරිසුද්ධි' සඞ්ඛ්‍යාත නිවන් රූපනම් කිසේය යත්?

"සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛා අසුඛා උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති" යනාදි පාඨවශයෙන් ද.

තව ද මෙම නිවන් සැපයෙකි—

අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.

නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි,
නත්ථි ඛන්ධාදිසා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛං.

ජිඝච්ඡාපරමා රොගා සඞ්ඛාරපරමා දුඛා,
එතං ඤත්වා යථාභූතං නිබ්බාණං පරමං සුඛං.

ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨිපරමං ධනං,
විස්සාසපරමා ඤාති නිබ්බාණං පරමං සුඛන්ති.

යනාදීන් ධර්මයන්ගේ වශයෙන් ද.

තව ද මෙම ධර්මයන් උපමාවශයෙන් බලන යොගීහු විසින්—යම්සේ ඝර්මාභිතප්ත පුරුෂයෙක් පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත වූ ප්‍රසන්න ජලයලාවන් ඇති පුෂ්කරණියක් දැක කැමති පරිද්දෙන් ස්නානපානාදිය කොට රුක්කට පිටද අහෝ සුඛං අහෝ සුඛං කියමින් සන්තුෂ්ටව හිඳද එපරිද්දෙන් ම අග්‍රඵල නැමති පුෂ්කරණියෙහි ඵල සමාධිනැමති ප්‍රසන්න ජලය ස්නානපානය කොට විදර්ශනා නැමති මල්පැලඳ මාර්ගභාවනා සඞ්ඛ්‍යාත රුකට පිට දී "නත්ථි දානි පුනබ්භවො නත්ථි දානි පුනබ්භවො නත්ථි දානි පුනබ්භවො" යි යනාදී ප්‍රීතිප්‍රමොදවාක්‍යයන් පුවර්ධනමව නිර්වාණාලම්බනකරණසඞ්ඛ්‍යාත සුඛවිහරණය තෙම නිවන්සැපතම් වන්නේ යයි සේයි.

තව ද මෙම ධර්මයන් ධර්මාලම්බණප්‍රීතිවශයෙන් බලන යොගීහු විසින්—

පදුමං යථා කොකනදං සුගන්ධං
පාතො සියා ඵුල්ලමවීතගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ.

යො බුද්ධවාසො පරිපුණ්ණමානසො
ඛීණාසවො අන්තිමදෙහධාරී,
විසුද්ධසීලො සුසමාහිතින්ද්‍රියො
චන්දො යථා රාහුමුඛා පමුත්තො:

සමොහතං මොහමහන්ධකාරං
විමොචයිං සබ්බමලං අසෙසං,
ආලොකපජ්ජොතකරො පභඞ්කරො
සහස්සරංසී විය භාණුමා නභෙ.

රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජොති-පෙ-

මොහො රාජො නච පන රේණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙති.

නිවන්සැප මෙසේ දතයුතු.

තව ද ධර්මාලම්බනප්‍රීතිවශයෙන් ධර්මානිසංසයක් බලන පරිදි කියේය යත්?

ලද්ධාන දුල්ලභතරං ච මනුස්සයොනිං
සබ්බං පඤ්ච රජිතං ඛණසම්පදඤ්ච,
සද්ධාවාන ආසවක්ඛයදෙසිතඤ්ච ධම්මං
කො පණ්ඩිතො නචරතං න භජෙය්‍ය ධම්මං.

ධම්මො තිලොකසරණො පරමො රසානං
ධම්මො මහග්ඝරතනො රතනෙසු ලොකෙ,
ධම්මො හවෙ සිනවදුක්ඛවිනාසහෙතු
ධම්මං සමාචරථ ජානරියානුයුත්තා.

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

ධම්මො හවෙ හතො හන්ති න හතො හන්ති කිඤ්චනං,
තස්මා හි ධම්මං න හනෙ මා තං ධම්මො හතො හනී.
න හි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුග්ගතිං.
ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං,
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති.
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො-පෙ-
නිද්දරො හොති නිප්පාපො ධම්මපීති රසං පිබං.
ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා,
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො.

මෙයි ශීලක්ෂණාදිසංඛ්‍යාත නිශ්‍රේණිය ආදි කොට ධර්මාලම්බ නාත්‍රානනිසංස නිශ්‍රේණිය අගා කොට ඒ ඒ ධර්මයන් තත් තත්ස්වභාවයෙන් යථාක්‍රමයෙන් බලන පරිදි මෙසේ දත යුතු.

මෙතෙකින් මේ විමුක්ති සඞ්ග්‍රහ නම් වූ විදර්ශනා භාවනා සඞ්ග්‍රහයෙහි එකොළොස්වන විමුක්ත්‍යානුපස්සනාඛ්‍යාත සඞ්ග්‍රහය නිමි.

---

විමුක්තිසුඛානිසංස විදර්ශනාවයි.

ඉති එතෙසු නාමෙසු කිත්තිතා යා මහෙසිනා,
වුට්ඨානගාමිනී සන්තා පරිසුද්ධා විපස්සනා.

වුසිතු කාමො සංසාරදුක්ඛපඨිකා මහබ්භයා,
කරෙය්‍ය සතතං තත්‍ථ යොගං පණ්ඩිතජාතිකොති

අප්‍රමාදනුශාසනාවයි.

අප්පමාදරතො හොථ සචිත්තමනුරක්ඛථ,
දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නොව කුඤ්ජරො.

අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහුජාගරො,
අබලස්සං ව සීඝස්සො හිත්වා යාති සුමෙධසො.

අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො,
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා.

අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සිවා,
අභබ්බො පරිහාණාය නිබ්බාණස්සෙව සන්තිකෙති.

අප්‍රමාදානුපස්සනානුයොග අනුශාසනාවයි.

යො චරං වා තිට්ඨං වා නිසින්නො උද වා සයං,
යං විතක්කං විතක්කෙති පාපකං ගෙහනිස්සිතං.

කුම්මග්ගපටිපන්නො සො මොහනෙය්‍යෙසු මුච්ඡිතො,
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං.

යො චරං වා තිට්ඨං වා නිසින්නො උද වා සයං
විතක්කං සමයිත්වාන විතක්කූපසමෙ රතො
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමන්ති.

අප්‍රමාදානුපස්සනායොගානිසංස විදර්ශනාවයි.

කුසල මෙණ්ඩවරෙ ජාතලඞ්කාතිලකවාසිනා,
විනයාචාරසම්පන්න පොරාණ ථෙරසිස්සිනා.
තිපිටකඤ්ඤුපමාණෙන ඊදිසං ධම්මපුප්ඵකම්,
ධම්මාලඞ්කතචිත්තෙන නිගුම්ඵිතං චෙතසා.
සජ්ඣායනත්ථං වාචාය උත්තරිං වාසනාය ච,
ගන්ථාදිබද්ධධාතූනං ඉන්ද්‍රියායතනාදිනං.
සබ්බසොතාදසෙ හොතු සඞ්ගහෙත්වාන චෙතසා,
එමුත්තං සඞ්ගහං සෙට්ඨං කතං බුද්ධිසුඛාවහන්ති.

සඞ්ගහකාරකස්සත්ථෙ අභිලාසපරිච්ඡෙද
පරිසමාප්ති නිදස්සිතායි.

සබ්බසීලාදිපඤ්ඤා,විපුලගුණගණාචාරුලීලාභිරාමා
කිච්චාක්ඛෙමවසු ජෙතා විමලගුණගණා ධම්මපජ්ජොතභූතා,
සුත්වා සද්ධම්මමග්ගං විගතමලවිසා සුද්ධිමන්තා පසන්නා
ඤත්වා සබ්බුද්ධමග්ගං සකලඵලදදං සග්ගමොක්ඛං වජන්තු.

සංසාරානුසාසනායි:

සංසාරෙයමනාදිකො චලතරෙ දුක්ඛා අපායා සදා
බුද්ධුප්පාදඛණො ච දුල්ලභතරෙ දුල්ලභකායො ච යං,
නානාවාතපිත්තරාදුපද්දවගතො විජ්ජව ජීවිතෙ
කාලො හො නනු සයනීයෙසිතුමලං ආදීපතසීසො යථා.

සජීවිතානුසාසනායි.

දෙවදානවගන්ධබ්බ යක්ඛරක්ඛසආදයො,
අනුමොදිත්වානිමං පුඤ්ඤං පාපුණන්තු සිවං පදං.
රාජරාජාධිරාජානො මච්චාමච්චාදිසාධවො,
අනුමොදිත්වානිමං පුඤ්ඤං සාධයන්තු සිවං පදං.
දිට්ඨාදිට්ඨතා සබ්බෙ සපරිසාදයො,
අනුමොදිත්වානිමං පුඤ්ඤං සම්ඵුසන්තු සිවං පදං.
සබ්බෙ සත්තා ච මජ්ඣත්තා හිතා ච අහිතා ච මෙ,
අනුමොදිත්වානිමං පුඤ්ඤං බොධයන්තු සිවං පදන්ති

පත්තිදානානුමොදනායි.

භවාභවෙ සංසරන්තා සාවත්ථිකා ජනපාදියා,
ජාතිස්සරඤ්ඤාණෙන තිහෙතුපටිසන්ධිකො.

උප්පන්නානුප්පන්නබුද්ධෙසු පූරෙත්වා සබ්බපාරමී,
මඞ්ගලො විය සම්බුද්ධො හුත්වා ලොකෙ අනුත්තරෙ.

සංසාරෙ සංසරන්තානං සත්තානං හිතමාවහං,
ධම්මනාවාය තෙ නෙත්වා පාරමෙස්සං භවණ්ණවා'ති.

## අභිනීහාර ප්‍රාර්ථනාව.

සම්පත්තසත්තලොකස්සාවහිතමොක්ෂඵලදායකසර්වඥභාෂිතවිදර්ශනාමාර්ගොපදෙශසඞ්ඛ්‍යාතභාවනාධිකාරයෙහි ශීලාදී සඞ්ග්‍රහය ආදි කොට විමුක්ත්‍යනුපස්සනාඥාන සඞ්ග්‍රහය අන්තකොට එකාදශ සඞ්ග්‍රහයකින් සඞ්ගෘහීත වූ විමුක්තිසඞ්ග්‍ර නම් වූ මේ විදර්ශනා භාවනාසඞ්ග්‍රහය කියා නිමවනලදී.

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා,
යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතාසති.

ධම්මමෙව සුණිස්සාමි ධම්මෙ මෙ රමතී මනො,
නත්ථි ධම්මා පරං අඤ්ඤං ධම්මමූලං හිසම්පදන්ති.

## ධම්මානුපස්සනානිසංස නිදර්ශනයයි,

ධම්මො පවත්තතු චිරය මුනිස්සරස්ස
ධම්මෙ ඨිතා වසුමතීපතයො භවන්තු,
කාලෙ පවස්සතු ඝනො අඛිලා පජාච
අඤ්ඤොඤ්ඤමෙත්තපටිලාභසුඛං ලභන්තු.
චිරං තිට්ඨතු සද්ධම්මො දෙවො සම්මා පවස්සතු,
ලොකං රක්ඛන්තු රාජානො පජා පප්පොන්තු නිබ්බුතිං'ති.
යෙ මෙ විපස්සනා ධම්මා උග්ගණ්හන්ති සුමානසා,
වන්දිත්වා සිරසා නිච්චං පසංසෙමි සදාදරා'ති.

## සඞ්ග්‍රහකාරකයන්ගේ කරුණා ආයාචනායි,

අට්ඨාරසහි වස්සෙහි රත්තඤ්ඤූ විකායම්බාහුනො,
විමුත්තිසඞ්ගහං එතං කතං ලොකාභිවුද්ධිදන්ති.

විමුක්තිසඞ්ග්‍රහ නිමි.

---

සමස්තසම්පත්තිසම්භාරසංයුක්ත ත්‍රිදශපුරවරසමාන ශ්‍රී ලඞ්කාද්වීප නැමති අඞ්ගනාව විසින් ප්‍රසාධනය කරණලද ච රමෞලිමාණික්‍යයක් හා සාදෘශ්‍ය වූ ජනනයන මනොහර සකලවිහාරාභසම්පත්තීන් අනූන හිජ්ජාග්‍රාම විහාරාධිපති සකලකලාසර්වඥ ෂඞ්භාෂාපරමෙශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචා ර්‍ය්‍යී ගලතුරුමුල මහාස්වාමිපාදයන් වහන්සේගේ පවුතරහා ච නැමති අප්‍රමයිකබ්‍රමරඝජාතීය සහ පඤ්චොපක්ලෙශයන් ගෙන් විනිර්මුක්ත වූ සරදාකාශයට සම්පූර්ණචන්ද්‍රමණ්ඩලය ක් හා සාදෘශ්‍ය වූ තර්කව්‍යාකරණ ඡන්දො නිඝණ්ටු ජ්‍යොතිෂ ය යනාදී බාහිර ශාස්ත්‍රයෙහි හා සූත්‍රාභිධර්මවිනයසඞ්ඛ්‍යාත පිටකත්‍රයධර්මපාරාවාරපාරප්‍රාප්ත පිල්ගම්මුල මහාස්ථවිරාචා රීන් වහන්සේගේ පාදනැමති පද්මකිඤ්ජල්කය ආශ්‍රය කළා වූ රාජහංසයකු බඳු වූ ශ්‍රී ලඞ්කාතිලක රජමහාවිහාරනි ෂ්පාදනයට ප්‍රධාන කාරණ වූ ශ්‍රද්ධාසීල ශ්‍රැතත්‍යාග ප්‍රඥාද යන පඤ්චධර්මයෙහි ප්‍රතිෂ්ඨිත වූ මෙණ්ඩර වංශොද්භූත ලඞ්කා සෙනෙවිරත් මහාමන්ත්‍රීශ්වරයානන්ට පස්වැනි මුනුබුරු වූ මකසමුඛතුණ්ඩයෙන් ග්‍රහණය කරණලද සමුද්‍රජලයක්සෙ සින් පරම ගම්භීර සඞ්කීර්ණ මධුර භාරතීයෙහි මදරසයක් දන් නා ශීලාද්‍යනෙකගුණගණාලඞ්කෘත ලබ්ධා සෙනෙවිරත් පිරිවෙණ මහාස්ථවිරපාදයන් විසින් සම්‍යක්සම්බොධිඥාන සමධිගමය පිණිස නිස්සරණාධ්‍යාශයුක්ත විත්තයෙන් ව සඞ්ග්‍රහ කොට පුස්තකාවගාහනය කොට ප්‍රකාශකළ විමු ක්තිසඞ්ග්‍රහ නම් වූ විදර්ශනා භාවනා සඞ්ග්‍රහයයි.

සිද්ධිරස්තු.

# විරුද්ධාවිරුද්ධපාඨ.

| පිටේ. | පෙලේ. | විරුද්ධයි. | අවිරුද්ධයි. |
|---|---|---|---|
| 4 | 2 | භූමියට යොගීව | බැවියට යොගීනු විසින් |
| „ | 26 | යොගීහු විසින් | භූමියට යොගීනු විසින් |
| 8 | 25 | සංඥිත * | සඤ්ඥිත |
| 14 | 3 | අධ්‍යාත්මික * | ආධ්‍යාත්මික |
| 15 | 14 | සඞ්ඛයෙක් | සඞ්ඝයෙක් |
| 19 | 4 | සුසමාගිතා | සුසමධියිතා |
| „ | 16 | යොගිතා | යොගිනො |
| „ | 23 | භික්ෂුහු විසින් | භික්ෂූතෙම |
| „ | 30 | භාවනාකටයුතුයි | භාවනා කරන්නේය |
| 23 | 6 | පවුත්තං | පයුත්තං |
| 27 | 6 | නවාබුදගසක් | නවාබුදගසක් ලොම කූපයෙන් |
| 28 | 8 | කරණී සුවද | කරණී කුණුපිඩ |
| 29 | 1 | ආදීනව ධම්මයන් | ධම්මයන් ආදීනව |
| 34 | 18 | පිටයින් | පට |
| 42 | 11 | අසූචිං | අසුචිං |
| 43 | 9 | චුත්තං | වත්තුං |
| 46 | 14 | විගෙහති | විගෙහන |
| 47 | 9 | පස්ස | පස්සං |
| „ | 22 | මහණී මෙසේ | මෙසේ |
| „ | 30 | බලව මෙහි | බලන මහණතෙම එහි |
| „ | „ | කලකිරෙව | කලකිරෙන්නේය |
| 55 | 4 | ජතිරියං | ජාතිරයං |
| 60 | 1 | සොසොව | සිසො ච |
| 64 | 7 | චිත්තං | චිතං |
| „ | 10 | රණතිං | රත්තිං |

* මේ ලකුණෙන් හඟවන්නේ මෙබඳු සෙසු පාඨත් මෙලෙසම දතයුතුබවයි.

| පිටේ. | පෙලේ. | විරුද්ධයි. | අවිරුද්ධයි. |
|---|---|---|---|
| 65 | 8 | නිවාරයෙ | නිවාරය |
| 68 | 7 | සුසානමෙකො | සුසානමෙකං |
| ,, | 15 | පියොවින් නිරුද්ධ | පියෝ නිරුද්ධ |
| 70 | 13 | රසඑහි | රසං හි |
| 121 | 20 | පවන්නා | පවත්නා |
| 126 | 9 | විතතණ්හා | විතතෙණ්හා |
| 129 | 12 | එපරිදෙද්න් | එපරිදෙන් ලොකොත්තරප්‍රථමධ්‍යානාදියෙහිද |
| 131 | 10 | පුතත | පුකත ව |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු